ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත


කතෝලිකයා සහ දේශපාලනය 3

ධර්මෝපදේශ ජාතික දිනය 8

කතෝලිකයා කෘතවේදීද? 12



# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

www.colombocatholicpress.com





ක්‍රි.ව. 2013 ක් වූ සැප්තැම්බර් 29 ඉරිදා 148 වෙළුම 18 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදී. QD/51/NEWS/2013

## එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් භාග්‍යවන්ත තෙරේසා මවුතුමියට උපහාර

# දයාවේ ජාත්‍යන්තර දිනයක් නම්කරයි



**භාග්‍යවන්ත තෙරේසා මවුතුමියගේ 16 වැනි ගුණානුස්මරණයට සමගාමීව එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සැප්තැම්බර් 05 වැනිදා දයාවේ ජාත්‍යන්තර දිනය ලෙස ප්‍රකාශයට පත්කර මුල්වරට මේ වසරේදී සැමරීය.**

කල්කටාවේ තෙරේසා මවුතුමිය දයාවේ සේවාව නව මඟකට යොමුකරමින් පටු ජාති, ආගම්, කුල මල බේද කිසිත් නොතකා මියැදෙන මනුෂ්‍යත්වය ඉහළට ඔසවා තැබීම සිය ඒකායන දිවිමඟ කරගත්තාය. 1997 සැප්තැම්බර් 05 වැනිදා සඟසුව දිනන තෙක් අඩසිය වසකට වැඩි කාලයක් ඉන්දියාව ප්‍රමුඛ මුළු ලොවේ දුගීන්, අසරණයන් වෙනුවෙන් ඉටුකළ අමිල මෙහෙවර නිසා එතුමියව භාග්‍යවරයට එසෙව්වාය. කොසොවා හි අගනුවර වූ ප්‍රිස්ටිනාහි එතුමිය නමින් කැපකළ නව සිද්ධස්ථානයේ දයාවේ ජාත්‍යන්තර දිනය සැමරීය. බහුතරයක් ඇල්බේනියානුවන් මෙහි වසන අතර සිද්ධස්ථානය කැපකර ආසිරි ගැන්වීමද සිදුවිය. මේ අතර කොර් උනුම් අපෝස්තලික සසුන් නියෝජනයේ අධිපති අතිඋතුම් රොබට් කාදිනල් සාරා හිමිපාණෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මේ වැයම මහත් ප්‍රීතියෙන් අගය කරති. අතිඋත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා "දිළිඳුන් සඳහාවූ දිළිඳු සභාවක්" ගැන නිරතුරු කරන ආයාචනයන් මැද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මේ නැඹුරුව සසුන් දයා සේවා සඳහා කදිම ඇගයුමක් යැයි විචාරකයෝ පවසති.

## භාග්‍යවත් ජුසේවාස් කාර්යාලයේ නිවේදනය

**භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් ශුද්ධවන්ත භාවයට එසැවීම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රාතිහාර්යයන් අතුරින් එක් ප්‍රාතිහාර්යයක් අධ්‍යයනය කිරීම සඳහා සුදුසු යැයි පිළිගෙන ඇති බව පූජක, පැවිදි, ගිහි සැදැහැවතුන් වන ඔබ සැම වෙත මෙලෙස දන්වා සිටිනුයේ දෙව් මහෝත්තමයාණන් වහන්සේට තුති පුදමින් ඉමහත් සතුටිනි. එම ප්‍රාතිහාර්යයේ පදවි මට්ටමේ අධ්‍යයනය (පරීක්ෂණය) මෙම ඔක්තෝබර් මස පැවත්වීමට කටයුතු සියල්ල දැනටමත් සූදානම් කර ඇත.**

භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් ශුද්ධවන්ත භාවයට එසැවීම සඳහා අවශ්‍ය වනුයේ, ඉදිරිපත් කරන ලද එම ප්‍රාතිහාර්යය, එය සිදුවූ රදගුරු පදවිය තුළදීම සිදුකර, එම අධ්‍යයනයෙන් මතුවන ප්‍රතිඵලයයි. සාන්තුවර භාවයට එසැවීම සඳහා වන මෙම ප්‍රාතිහාර්යය පිළිගත හැකි, නිවැරදි සාක්ෂියක් වනු පිණිස දෙවි සමිඳුන් හට වඩාත් ගැඹුරින් යදින මෙන් පූජක,

15»

## ඉරිදා 'සුපුවත'

සැප්තැම්බර් 29 වන ඉරිදා සවස 6.00 ජාතික රූපවාහිනියෙන් විකාශය වන 'සුපුවත' කතෝලික වැඩ සටහනින් මෙවර විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි චරිතාපදානය විකාශය වන බව වැඩසටහන් සම්පාදක රන්ජුල සේනාධීරයන් ප්‍රදීපයට පැවසීය.

## ගීතිකා පැදුර

සියැලි හඬ ගීතිකා පැදුර විශේෂ වැඩසටහන ඔක්තෝබර් මස 05 වන සෙනසුරාදා සවස 07 සිට සජීවීව. පිවිසෙන්න www.lankacatholic.com 077-0353773, 071-8371698

## පාසල් අයදුම්පත්

2014 වසර සඳහා 6 වෙනි ශ්‍රේණියට සිසුන් ඇතුලත් කර ගැනීමේ විභාගය ශාන්ත ජෝශප් විද්‍යාලය - කොළඹ 10 අයදුම්පත් නිකුත් කිරීම ඔක්තෝබර් මස 02, 03 සහ 04 යන දිනයන්හි පෙ.ව. 9.00 සිට පස්වරු 2.00 දක්වා විද්‍යාලීය කාර්යාලයේදී සිදුකෙරේ. විභාගය ඔක්තෝබර් මස 12 වෙනි සෙනසුරාදා දින පැවැත්වෙන අතර එයට පෙනී සිටීමට ඉහත අයදුම්පත අනිවාර්යවෙයි. අයදුම්පත් ලබා ගැනීමේදී අයදුම්කරුගේ උප්පැන්න සහ ක්‍රිස්තියානි සහතික ඉදිරිපත් කළ යුතු බවද දන්වමි.

- අධ්‍යක්ෂ පියතුමා

මීගමුව බෝලවලාන අක්කරපනහ ආවේ මරියා ශාඛා විදුහලේ 2014 වර්ෂය සඳහා 1 ශ්‍රේණිය සහ 6 ශ්‍රේණි සඳහා නව සමාන්තර පන්තියක් ආරම්භ කිරීමට සැළසුම් කොට ඇත. මේ සඳහා අයදුම්පත් විදුහලින් ලබාගත හැකි අතර 031-5318318 හා 031-5311400 දුරකතන අංක වලට විමසීමෙන්ද දැනගත හැකිය. විද්‍යුත් තැපෑල : amcbranch@gmail.com

- ටී. සුනිල් ප්‍රනාන්දු

## වේලන්කන්නි මංගල්‍යය

ශුද්ධවූ වේලන්කන්නි දේවමාතාවන්ගේ වාර්ෂික මංගල්‍යය 4 වන වරටත් පමුණුගම දුන්ගල්පිටිය දේවමාතා මණ්ඩපයේදී මෙවරත් ගරු මීසම් සේවක ක්ලෝඩ් වනසිංහ පියතුමාගේ අනුශාසනය මත 2013 සැප්තැම්බර් මස 28 වන සෙනසුරාදා දින සවස 7.00 ට ආධ්‍යාත්මික ජීවලිත භාවයෙන් පැවැත්වේ.

## වැඩිහිටි සතිය

27 වෙනි වැඩිහිටි සතිය 2013 ඔක්. 01 සිට 08 වෙනි දින දක්වා මීසමේ තනිවූ වැඩිහිටියකුට ජවය සවිය සතුට දෙන්න ආරාධනා ජ්‍යේෂ්ඨ පුරවැසි ප්‍රජා සේවා දයාවේ සොහොයුරියෝ

## ජපමාල රැලිය

මරිමව් සමගින් සමිඳු වෙතට නමින් ඇතුගල්පුරවරය ඒකාලෝක කරන මරිය හමුදා ජපමාල රැලිය 2013 ඔක්තෝබර් 16 දින පැවැත්වීමට සෙනාටස් සභාව සියලු කටයුතු සූදානම් කර ඇත.

## චේ ගුවේරාගේ ලඟම ඥාතියා ප්‍රැන්සිස් සුදොතුම් පිය චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට

**චේ ගුවේරාගේ දෙවැනි පරපුරේ සොහොයුරකු අතිඋත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ ජීවිතය අළලා නිපදවන චිත්‍රපටයේ එතුමන්ගේ චරිතයට පණ පොවන බව වාර්තා වේ.**

වැනීසියේ පැවැති චිත්‍රපට උලෙළේදී මේ බව ප්‍රකාශ වූ අතර මේ චිත්‍රපටය ආර්ජෙන්ටිනාව හා ස්පාඤ්ඤය ඒකාබද්ධව නිපදවන සිනමා පටයකි. රැදිගෝ දි ලා සර්ණානම් රංගන ශිල්පියා මීට කලින් 'The Motor Cycle of Diaries' නමැති චිත්‍රපටයේද ප්‍රධාන රංග ශිල්පියා විය. ලෝකයේ අවධානය දිනා ඇති ශුද්ධෝත්තම පියතුමන්ගේ විවෘත දැක්ම හා බලවත් විශ්වාසය මේ චිත්‍රපටයෙන් තවත් තහවුරු වන බව විචාරකයන්ගේ මතයයි.

## අපොල්ලොස්ගෙවත්, පාවුළුගෙවත් කණ්ඩායමට අයත් විය යුතු ද යන්න ගැන තැවෙනු එපා

### 'සදහම් මෙහෙවර' කණ්ඩායම බිඳීගිය කොටස්වලට පවසා සිටි

සමහර ගිහි නායකයින්ගේ යැදුම් එකමුතුවලට දිගු කාලයක් තිස්සේ සම්බන්ධ වී සිටි සමහර පිරිස් යම් යම් අර්බුද හා සිත් තැවුල් නිසා විසිරි ගොස් විවිධ පුද්ගල කණ්ඩායම් වලට සිරවී සිටීමේ හා අතරමං වීමේ තත්ත්වයක් තුළ නඟන ප්‍රශ්න හමුවේ ඔවුන් කල්පනාකාරි විය යුත්තේ තමන් අයිතිවන්නේ අපොල්ලොස්ගෙවත්,

15»

## සියලු ද්‍රවිඩ නායකයන් එකතු කර සාමකාමී ඡන්දයකට මා නායකත්වය දුන්නා.

### මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණෝ ප්‍රකාශ කරති

**ඒකීය රාජ්‍යයක් තුළ බලය බෙදාගෙන සාමකාමී සහෝදර ජනතාවක් සේ දේශපාලන බලය කුලල් කා නොගෙන අත් විඳින්නට සියලු ද්‍රවිඩ නායකයින් එකමුතු කරන්නට තමන් වහන්සේ මූලිකත්වය ගත් බව මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් රදගුරු හිමිපාණෝ ප්‍රදීපයට විශේෂ ප්‍රකාශයක් කරමින් පවසා සිටිති.**

තමන්වහන්සේගේ ආගමික මෙහෙවර හා යුගයේ දිවැසිවර කාර්යය වන්නේ මිනිසුන්ව පීඩාවට පත් කරන දේශපාලකයන් වෙනුවෙන් ඒ නියෝජිතයින් කැඳවාගෙන යාම නොව ඔවුන් එකමුතු කොට එකමුතුකමේ අගය තුළ සමාජ මෙහෙවරේ යුග දායකත්වය ඉටු කිරීමට ඔවුන් පොළඹවාලීම බව තවදුරටත් එතුමෝ පවසා සිටියහ. එය ඵල දැරීම ගැන තමන් වහන්සේ නිහතමානිව සතුට භුක්ති විඳින බවද තවදුරටත් සඳහන් කරන්නට එතුමෝ අමතක නොකළහ.



## වේලන්කන්නි ප්‍රතිමාව නිරාවරණය වේ

➤ ඩේවිඩ් අප්පුහාමි

මාරවිල ෂර්මිලා මහත්මිය විසින් ගොඩනංවන ලද වේලන්කන්නි මෑණියන්ගේ විශාල ප්‍රතිමා මණ්ඩපයක් මාරවිල ශ්‍රී කුරුස සිද්ධස්ථානයට නුදුරින් මෑතකදී නිරාවරණය වූ අතර ඒ මොහොතේම මුහුදින් ද තවත් ප්‍රතිමාවක් පාවී ආ බව බොහෝ දෙනෙක් සියැසින්ම දැක ඊට සාක්ෂි දරති.

"ඔබ අතරෙන් ඉතා ම කුඩා තැනැත්තා ශ්‍රේෂ්ඨ තැනැත්තාය ." ලූක් 9: 46-50

පදවියෙන් පදවියට

# විශ්වාසය වර්ධනය කරගෙන ජීවිත සාර්ථකව ගොඩනගමු

## ඇතුගල්පුර අනුනායක පියතුමාගෙන් ආරාධනා!

**අප මොන ආගම දහම ඇදහුවත් ජීවිතයට සතුට ප්‍රීතියක් තිබිය යුතුයි. දෙවියන්ගෙන් අප ඈත් වීමෙන් සිදු වන්නේ ආලෝකයේ සිට අඳුරට යෑමක් පමණයි. අපේ තිබෙන දුබල ගති පැවැතුම් නැති බැරිකම නිසා දෙවිඳුන්ගෙන් ඈත් වෙනවා. යහපත් එඬේරුන් තම බැටළු රැළ බලා ගන්නා සේ දෙවිඳුන් අප නැවත උන්වහන්සේ වෙත හැරී එන තුරු බලා සිටිනවා. නිතර යාච්ඤා කිරීම හොඳ පාපොච්චාරණයක් කර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම තුළින් අහිමි වූ ඒ සතුට නිදහස නැවත ලඟා කර ගැනීමට පුළුවනි යයි කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් පියතුමා පැවසීය.**

උඩුබද්දාව ශු. ජුවානා ආර්ක් මුනිතුමියගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල දිව්‍ය පූජාවේදී පියතුමා එසේ පැවසීය. වාදභේද දුරලා විශ්වාසය ගොඩනගමු තේමාව යටතේ පැවති මෙවර මංගල්ලයේ සන්ධ්‍යා මෙහෙය තඹකන්ද මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා සිදුකළ අතර මීසම් සේවක ගරු උපුල් සිල්වා පියතුමා සමග සියළුදෙනාගේ සහයෝගය මත මංගල්ලය ඉතා සාර්ථක අන්දමින් සිදුකරන ලදි.

මයිකල් කැනීසියුස්

### උපත නත්තල් සඟරාවට නිර්මාණ එවන්න

වාර්ෂිකව නිකුත් කරන 'උපත' නත්තල් සඟරාවේ මෙවර කලාපය සඳහා ඔබේ නිර්මාණ භාර ගැනේ. මේ සඳහා ඔබේ නිර්මාණ තනි පිටුවකට පමණක් සීමා කර සංස්කාරක 'උපත' - 'ප්‍රියන්ත' නිමල මරිය මාවත වෙන්නප්පුව ලිපිනයට එවන්න. නිර්මාණ සමග ඔබේ නිවැරදි ලිපිනය සමග දුරකථන අංකය සඳහන් කරන්න.



අභිවෘද්ධි ආලේපය ලබන ළමුන් සඳහා විශේෂ පෝෂණ වැඩසටහනක් මාරවිල දේවස්ථානයේදී පැවැත්විණ. මාරවිල මීසම් සේවක ගරු අයිවන් පීටර් පියතුමාගේ ආරාධනයෙන් මාරවිල දෙව්සත්හල් අධ්‍යක්ෂ ගරු ජයන්ත පෙරේරා පියතුමා මෙම වැඩසටහන මෙහෙයවූ අතර මාරවිල විවාහ හමු සංඝය විසින් එදින වැඩකටයුතු සංවිධානය කරන ලදී.

ඩබ්. පී. ටෙරන්ස් ප්‍රනාන්දු

# පල්ලන්සේන පල්ලියට නව පැති දේවස්ථානයක්

අප සමාජය තුළ අප දකිනවා බොහෝ දෙනෙක් දුක්බර ජීවිතයක්, කටුක ජීවිතයක්, කුරුස අරගෙන යන ජීවිතයක්, ගෙවල්වල අයගෙ කරදර නිසා පිටරට ගොස් රැකියාවක් කරලා තමන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාගන්නවා. සමහර අය තමන්ගේ බඩු විකුණලා ඉඩම් විකුණලා, උකස් තියලා, වෙනත් අයගෙන් ණයක් අරගෙන ගියත් ඒ තැන්වල දුක් විඳලා කාන්තාවන්, මව්වරුන් ඒ ගෙවල්වල සිටින අයගෙන් නොයෙක් පීඩාවලට ලක්වෙලා සමහර අය දූෂණයට පවා මුලාවෙලා දුකෙන්, භයෙන් ජීවත්වෙලා හිස් අතින් තම රටට පැමිණෙන අයද සිටිනවා. ඒ වගේම මෙම රටේ සිටින අය ද දුක්විඳින්නේ තම රැකියාව නිසා, වෙනත් ප්‍රශ්න නිසා, අසනීප නිසා වෙන්නට පුළුවන්. මරි මව් කියන්නේ ඒ සැම දේම දෙවියන් වහන්සේ වෙනුවෙන් දරාගන්න. විශෝප මෑණියෝ තමාගේ ජීවිතය පුරාම අධික වේදනාවෙන් අම්හිරි, ඉතාම අමාරු කටුක අත්දැකීම් වලින් ජීවිතයට මුහුණ දුන්නේ ශුද්ධාත්මයාණන්ගේ බලය තුළිනුයි. ඔබටත් ශුද්ධාත්මයාණන්ගේ බලය ලැබෙනවා නම්, ශුද්ධාත්ම මඟපෙන්වීම තුළ දෙවියන් වහන්සේ දෙන කුරුස දරාගන්නැයි අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ පල්ලන්සේන විශෝප දේව මාතා දේවස්ථානයේ වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේ දී පැවසූහ.

2006 දී ආරම්භ කර වත්මන් මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමා නිම කළ විශෝප දේව මාතා දේවස්ථානයේ පැති



දේවස්ථානය එහි තැන්පත් කර ඇති ගල්ලෙන, පොළව යට ඉදිකර ඇති දිව්‍ය සත්ප්‍රසාද ලෙන සහ ලූර්දු ගුහාව විවෘත කිරීම හා ආසිරි ගැන්වීම රදගුරු හිමිපාණන් අතින් සිදුවිය.



ශාන්ත වින්සෙන්ති ද පාවුළු සංගමයේ ජාත්‍යන්තර සභාපති ආචාර්ය මයිකල් තියෝ යුවළ හා දකුණු ආසියානු කලාපයේ සම්බන්ධීකාරක ගේබ්‍රියෙල් මොන්ඩල් මහතා පසුගියදා දිවයිනට පැමිණි අවස්ථාවේදී කොළඹ අගරදගුරු පදවි ශාන්ත වින්සෙන්තිද පාවුළු සංගමයේ ජාතික හා මධ්‍යම මණ්ඩල නිළ මඩුල්ල ඇතුළු සියලු දිසා සභාපතින් විසින් මහත් හරසරින් 6 වන පාවුළු පරිශ්‍රයේදී පිළිගන්නා ලදි. මේ අවස්ථාවට ජාතික අධ්‍යක්ෂ ගරු ලියෝ පෙරේරා පියතුමා, මධ්‍යම මණ්ඩල අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා හා කොන්ෆරන්ස්වල අනුශාසක ගරු පියතුමන් කීපදෙනෙක්ද සහභාගි වූහ.

ඇනක්ලීටස් සිල්වා

### තලවිල තරුණ වැඩසටහනක්

තලවිල මීසමේ තරුණ තරුණියන්ට විශේෂ වැඩිසටහනක් ඔක්තෝබර් 05 සෙනසුරාදා දවස පුරා සා. ආනා සිද්ධස්ථානයේදී පැවැත්වේ. සිද්ධස්ථාන පාලක ගරු නිහාල් පයස් පියතුමාගේ අනුශාසකත්වයෙන් සහයක ගරු දිලංක නිර්මාන් පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය කෙරේ.

ෂර්මිලා ප්‍රිස්ලා

# මරිය වසරට පමුණුගම සැරසේ

**ඉදිරියේ ඇරඹෙන මරිය වසරට සූදානමක් ලෙස ඔක්තෝබර් මස පළමුවන දිනෙන් ඇරඹෙන ජපමාල මාසයේදී පමුණුගම දේව ජනතාවට ජපමාලය ඒකාබද්ධකිරීමේ වැඩ සටහන යටතේ දේව මාතා ප්‍රතිමා ඒකක වලට වැඩම කරවා යාච්ඤා කිරීමේ වැඩසටහනක් පිළියෙල කොට ඒ සඳහා විශේෂ යාච්ඤා අත්පොතක්ද සෑම නිවසකටම බෙදා දී ඇත.**

මේ පොතට පමුණුගමට අදාල ශ්‍රී ලේ බැතියේ ජපමාලය හා ශ්‍රීලේ යාච්ඤා ද එයට අමතරව පමුණුගම සා. ජෝශප් දේවස්ථානයේ මහා සිකුරාදා දිනපතා රාත්‍රි 7 ට නාද කැරේ. එහිදී නිවෙස්වල රූපවාහිනිය, ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියා විරහිත කර පවුල් වශයෙන් එක්වී ජපමාලය උච්චාරණය කරන ලෙස පමුණුගම මීසම් සේවක ගරු ආනන්ද විතාන පියතුමා ඉල්ලා සිටී.

බෙනී ජයමාන්න

# පානදුර මීසම 75 ජයන්ති උලෙළ සමරයි



පානදුර මීසමේ 75 වැනි ජයන්ති මහෝත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි. මංගල්‍ය දිව්‍ය යාගය අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් පවත්වමින් ජුබිලි වසරක ඇති වැදගත්කම පෙන්වා දෙමින් අතිඋත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ හසුනද ප්‍රකාශයට පත් කළේය.

පානදුර මීසමේ 75 ජයන්තිය නිමාවට පත් කර පානදුර වලාන පෞරාණික දේවස්ථානයේ 150 වන ජුබිලි වසර අතිඋතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිමිපාණන් විසින් ප්‍රකාශයට පත් කරන ලදි. එදින 75 වන ජුබිලිය නිමිත්තෙන් මුද්‍රණය කර ඇති සමරු කලඹද රදගුරු තුමාට පිරිනැමීය. මෙම මංගල්‍ය දිව්‍ය යාගයට මීසමේ බිහිවුණු පූජක පුතුන් වන ගරු කාල්ටන් සිල්වා, ගරු ලෙස්ටර් විජේසූරිය, ගරු නිර්මාල් මාලක ගරු ජයලත් බලගල්ල මීසම් සේවක ගරු සිසිර ප්‍රියශාන්ත පියතුමන් එක් විය.

එස්. එලායස්

# ගිහි දූතික සංඝය ශ්‍රී සළුව වැඳ පුද ගනිති

**කළුතර කටුකුරුන්ද යහපත් එඬේරාණන්ගේ ගිහි දූතික සංඝයේ මෙවර වාර්ෂික චාරිකාව පසුගියදා මහනුවර මොන්ටෙෆානෝහි ශ්‍රී සළුව බැහැදැකීම සඳහා යොමුකර තිබුණි. ශ්‍රී සළුවේ අසිරිමත් බව හා ආශ්චර්යවත් සිදුවීම් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක යෙදුන ගරු මාර්ක් සහෝදර තුමා ශ්‍රී සළුවේ අනු පිටපතක් ශ්‍රී ලංකාවට ලැබීම විශේෂ සිදුවීමක් බව සඳහන් කළේය. ශ්‍රී සළුව අබියස විශේෂ යාච්ඤා මෙහෙයකටද පිරිස සහභාගි වූහ.**

මේ චාරිකාවට කටුකුරුන්ද සා. ජෙරාඩ් කන්‍යාරාමයේ ප්‍රධාන පැවිදි සොයුරිය වූ ගරු ත්‍යාගා, ශානිකා, එස්තර් පැවිදි සොයුරිය ඇතුළු ගිහි දූතික සංඝයේ සාමාජික / සාමාජිකාවෝ සහභාගි වූහ. මහයියාව වැඩිහිටි නිවාසය හා මහනුවර ය.එ.ක. ළමා නිවාස බැහැදැකීමටද ගියහ.

රංජිත් නෝනිස්

### මියගිය අය සමරා දානමය පිංකමක්

**සගසැපත් විශ්‍රාමික රදගුරු අතිඋතුම් ෆ්‍රෑන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ 4 වන සැමරුමක් තොඩුවාව මීසමෙන් පූජක වරම් ලැබ සමිඳු තුරුළේ සැතපුන ගරු පියතුමන් හා හලාවත පදවි හිටපු පවුල් සේවා අධ්‍යක්ෂ ගරු පිලිප් ඇන්තනි හා ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමන් සිහිපත් කර දානමය පිංකමක් පසුගියදා තොඩුවාව අතිඋතුම් ප්‍රෑන්ක් මාකස් හිමි සමරු ශාලාවේදී පැවැත්වුණි.**

තොඩුවාව මීසම් සේවක ගරු ඉයුජින්ද සිල්වා සා.බෙ.නි., සහයක ගරු දූෂාන්ත පෙරේරා (සා.බෙ.නි) පියතුමන්ගේ සහයෝග යෙන් හලාවත පදවි පවුල් සේවා අධ්‍යක්ෂ ගරු අශෝක් ප්‍රියන්ත පියතුමන්ගේ සහභාගිත්වයෙන් මෙය පැවැත්වුණි. තොඩුවාව පවුල් සංඝය මෙය සංවිධානය කළේය.

ඔගස්ටින් + ඉන්ද්‍රානි යුවළ



අභිවෘද්ධි ආලේපය ලැබීමට සූදානම් වන හංවැල්ල මීසමේ දූ දරුවන්ගේ දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් කළුඅග්ගල දේවස්ථානයේදී පැවැත්වුනි. හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් රෝෂාන් චමින්ද පියතුමන් සහ දහම් ගුරුමණ්ඩලය විසින් මෙය සංවිධානය කර තිබුණි.

ඇන්තනි හෙට්ටිආරච්චි

# රත්නපුර සා. ඇලෝසියස් 115 සංවත්සරය සැමරේ

**ජාති, ආගම්, කුල භේදයෙන් තොරව සිංහල, දෙමළ, මුස්ලිම් සිසුන් එක මවකගේ දරුවන් ලෙසින් ඉගෙනීම කරන විදුහලක් රත්නපුර ප්‍රදේශයට තිළිණ කළේ ජේසු නිකායික පියවරුයි. සංහිඳියාව සහජීවනය ඇති කරමින් ප්‍රදේශයේ සාමය රජ කරවීමට අත්වැලක් වූයේද සාන්ත ඇලෝසියස් විදුහලයි. දේශපාලනය ඇතුලු විවිධ ක්ෂේත්‍රයේ ජය කෙහෙළි නැඟූ ගායකයන් රැසක් බිහිකළ මෙම විදුහල එතෙර මෙතෙර කීර්ති නාමයක් දිනූ විදුහලක් ලෙසට ඉතිහාසගත වීම සතුටට කරුණකි. එදා 1898 ගරු පීටර් වොලින් පියතුමා ගෙන් ඇරඹී මෙය අද දක්වා අඛණ්ඩව රැකගත් සැමගේ අමරණීය අධ්‍යාපන සේවය කෘතවේදිත්වයෙන් යුතුව සිහිපත් කරන බව රත්නපුර සාන්ත ඇලෝසියස් විදුහල් 115 වන සංවත්සර සමරු දේව මෙහෙය පවත්වමින් මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් පියතුමා පැවසීය.**

විදුහල්පති ජයතිස්ස මීගහපොල ඇතුලු ආචාර්ය මණ්ඩලයත් සිසුන්, ආදි සිසුන්ගේ



සහභාගිත්වය මැද දේව මෙහෙය පැවැත්වින. දේව මෙහෙයෙන් අනතුරුව සුහද හමුවක් පැවති අතර විදුහල්පති පියතුමා ඇතුලු කිහිපදෙනෙක් සුහද හමුව ඇමතීය.

තියබෝල්ඩ් සමරතුංග

# බදුල්ල මහවැලි මාතා සිද්ධස්ථානයට දිවයිනේ සැමගේ හරසර

ලත්පඳුර, මහවැලි මාතා සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්ලය සාර්ථකව පැවැත්වීමට දිවයිනේ නන් දෙසින් ජනතා සහාය ලැබුනි. වෙන්නප්පුව, මීගමුව, ජාඇල, සීදුව, බෝපිටිය, කටාන කටුනේරිය, කෝන්ගොඩමුල්ල, මාරවිල, පමුණුගම, දූව, පිටිපන, ආඬි අම්බලම වැනි දුර බැහැර පළාත්වල ජනතාව මහවැලි මාතාවට හරසර දැක්වීමට පැමිණ සිටියහ.

ශ්‍රීකාන්ති ගුණවර්ධන

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2013 සැප්තැම්බර් 29 ඉරිදා

# මාධ්‍ය හරහා ක්‍රියාකාරි දේශපාලනඥයන්ගේ චරිත ඝාතනය කරනු එපා

දැන් වයඹ, මධ්‍යම හා උතුර පළාත් සභා මැතිවරණය හමාර වී තිබේ. ජය, පැරදුම තමන් ලැබූ ඡන්ද හා සාපේක්ෂව භුක්ති විඳීමට ඒ ඒ අපේක්ෂකයින්ට දැන් සිදුවී තිබේ. දේශපාලන න්‍යාය ධර්මයේ සැටි එසේයි. පක්ෂ නියෝජිත ලකුණ හා සමග පුද්ගල ජයග්‍රහණය දේශපාලන තලය තුළ ක්‍රියාත්මක විය යුත්තේ හුදෙක් පොදු ජනයාගේ සුබසෙත මූලික කොට ගෙන එය විධිමත් හා සවිමත් කරනු සඳහායි. නමුත් අභාග්‍යයකට අද අප දේශයේ පවත්නා මැතිවරණ ක්‍රමය යටතේ ඇති මනාප පොරය හා දේශපාලන බලතන්හාවේ තරගකාරිත්වය නිසා උගත්කම, සුදුසුකම්, පොදුබව හා අවංකත්වය වැනි සුවිශේෂි ගුණාංග වෙනුවට මධුවිත, බත්පත හා නිල් කොළ මූලික තැන ගෙන ඇත. ඇති හැකි අය නැති බැරි කරවන, නැති බැරි අය ඇති හැකි කරවන මේ තරගකාරිත්වය නිසා මැතිවරණයක් එළඹෙන මායිම් සීමාවේ සිට එය අවසන් වී තවත් සති මාස ගණන් ඉක්ම යන තෙක් හැකි පමණ දේශපාලනයේ යෙදෙන පක්ෂ නායකයන්ගේ මෙන්ම බලය ඇති - නැති සැමගේ චරිතයන් පුද්ගල මට්ටමින් ඝාතනය කිරීමට මාධ්‍ය යොදා ගැනීමේ සංස්කෘතියක් හා සම්ප්‍රදායක් බිහිවී තිබීම අතිශයින්ම ශෝචනීයයි. පිළිකුල් සහගතයි.

විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් තුළින් පුන පුනා කෙරෙන මේ චරිත ඝාතන වලට විරාමයක් දිය යුතුමයි. පුද්ගලයින් බලවත් කරන්නට මෙන්ම බෙලහීන කරන්නටත් මාධ්‍ය යොදා ගෙන කරන මේ මඩ ගැසිලි නවත්වන්නට වෙනම උප සංස්කෘතියක් කෙසේ හෝ බිහිකරලීමේ දැඩි අවශ්‍යතාවයක් අද පැන නැගී ඇති බව වටහා ගනිමු. ආගමික නායකයින්ගේ මෙන්ම සිවිල් සමාජයේ වගකිවයුත්තන්ගේ මූලික කාර්යභාරයක් සේ මේ කටයුත්ත සලකා බලා විවිධ රූපවාහිනි නාලිකා හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පක්ෂ දේශපාලනයේ යෙදෙන පුද්ගලයින්ගේ චරිත ඝාතනය කරන මාධ්‍යකරුවන්ගේ හා අයිතිකරුවන්ගේ ආධ්‍යාත්මයේ යහපත් පෙරලියකට ක්‍රියා කරන මෙන් උදක්ම ඉල්ලා සිටිමු. එය අප අයිතියක් සේ සලකමු.

# දිවැසිවර කාර්යය තේරුම් ගැනීම ප්‍රශස්තයි

මන්නාරම රදගුරු අතිඋතුම් ජෝශප් රායප්පු හිමිපාණෝ සිය කිතුනු කැඳවීමේ දිවැසිවර කාර්යයක් සමාජ ක්‍රියාවලියක උන්නතිය වෙනුවෙන් ඉටුකළ බවක් ප්‍රදීපය අද මුල් පිටුවෙන් අනාවරණය කරයි. එතුමන් ප්‍රදීපයට කථා කරමින් පවසා සිටි වදන් ඒ අයුරින්ම එකී වාර්තාව තුළ හුවා දක්වා ඇත්තේ එහි ඇති වටිනාකම මොනවට පැහැදිලි කරන්නටමයි. පළාත් සභා පිහිටුවූයේ බලය බෙදීමක් තුළින් රටේ ඒකීය භාවය සුරක්ෂිත කිරීමටයි. එසේ සුබවාදි හැඟීමෙන් ආරම්භ කළ මේ පළාත් සභා ක්‍රමයේ මූලික ඉලක්කය උතුරු කරය වූවත් ඇති වී තිබූ කුරිරු යුද්ධය නිසා වසර තිහක් තිස්සේ උතුර දකුණ දෙදිසාවම වින්දාවූ කරදර වල නිමක් නොවුනි. ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ පරිනත දේශපාලන පරිචය තුළ යුද්ධය නිම කරන්නට ගත් තැත එල දරා අවසානයේ උතුරකරයට පළාත් සභා මැතිවරණයක් හිමිකර දීමද අති විශිෂ්ටයි. එහිදි ද්‍රවිඩ පක්ෂ වල කැඩී වෙන්වී තිබීම මෙන්ම විවිධ ප්‍රශ්න අරබයා දුරස් වෙන්නට ගිය ද්‍රවිඩ එකමුතුව නැවත පක්ෂ වශයෙන් එකමුතුකර ශක්තිමත්ව ඡන්දයට මුහුණ දෙන්නට සියලු ද්‍රවිඩ නායකයින් එකට එකමුතු කළේ මන්නාරම කතෝලික රදගුරු අතිඋතුම් රායප්පු ජෝසප් හිමිපාණන්මය.

එය ආගමික නායකත්වයේ යුතුකමක් වනවා සේම කිතුනු දිවැසිවර කාර්යයක්ද බව අමුතුවෙන් කිව යුතු නොවේ. ආගමික පදනමක සිට විපත් පත් ජනතාවකට දැන්වත් එකමුතුව ඒකීය රටක සිට බලය බෙදාගෙන කටයුතු කරන්නට 'එකතුවෙනු' යන්න විධාන කරමින් සියලු ද්‍රවිඩ දේශපාලන පක්ෂ නායකයින් එකතු කර දකුණේ විඥානය හඳුනන උගතකු උතුරට කැඳවා සාමකාමි මැතිවරණයක් සඳහා මඟ පාදා ඔවුන් එකමුතු කළ අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණන්ගේ යුගයේ දිවැසිවර මෙහෙය කාගේත් දෑස් ඇරවීමේ මහ ක්‍රියාවලියක ආරම්භයක් බව කිව යුතු නොවේ.

# කතෝලිකයා සහ දේශපාලනය

**පසුගිය සැප්තැම්බර් 22 වැනි දින ඥානාර්ථ ප්‍රදීප පත්‍රයේ මුල් පිටුවේ "කතෝලිකයාට දේශපාලනයට සෘජුව සම්බන්ධ වීමේ ණය යුක්තියක් තිබෙනවා" යනුවෙන් පළ වූ ලිපියත්, "කතෝලික ගිහි පැවිදි පූජක පිරිසට දේශපාලනය අකැප නැහැ" යනුවෙන් පළ වූ කර්තෘ වාක්‍යයත් හේතු කොට ගෙන මේ දිනවල, දේශපාලනය, කතෝලිකයන් අතර සාකච්ඡාවට භාජන වන මාතෘකාවක් වී ඇති බව පෙනේ.**

එබැවින් දේශපාලනය සම්බන්ධයෙන් ගිහි කතෝලිකයන්ගේ භූමිකාව කුමක් විය යුතු ද, ගරු පූජාප්‍රසාදිවරුන්ගේ සහ පැවිදි කතෝලිකයන්ගේ භූමිකාව කුමක් විය යුතු ද යන්න පිළිබඳව අපගේ අදහස්, කතෝලික ජනතාව අතර සංවාදයට භාජන වීම සඳහා නොපැකිළ ඉදිරිපත් කරනු කැමැත්තෙමු. අපගේ ලිපියේ පදනම වනුයේ ඥානාර්ථ ප්‍රදීපය කතුතුමා සිය කතු වැකියෙහි ඉතා නිවැරැදිව සඳහන් කර ඇති, "පාලකයන් දැහැමි කරවීමට සහ නිසි මං ගැන්වීමට ජනතාවට ශුද්ධ වූ අයිතියක් ඇතත් මෙහි දී පක්ෂ දේශපාලනය ගැන හෝ ආයුධ දේශපාලනය ගැන හෝ සසුන් පියා කොතැනකවත් හුවා දැක්වීමක් කර නැත. එය විශේෂයෙන් අවබෝධ කර ගත යුත්තකි" යන අදහස් ය.

දේශපාලනඥයන්ගෙන් ජනතාව බලාපොරොත්තු වනුයේ, රටේ පාලනය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, රටේ හැම ජන කොටසකට ම සාධාරණත්වය ඉටු වන පරිදිත්, රටේ සාමයට සහ අභිවෘද්ධියට හිතකර වන පරිදිත් තීරණ ගැනීම ය. එසේ ම විවිධ අන්තවාදි බල වේගවලට අවනත නොවී එම තීරණ නිසි අයුරින් ක්‍රියාත්මක කිරීම ය. දේශපාලනඥයන් ලවා උක්ත කාර්යය නිසි පරිදි ඉටු කරවා ගැනීමත්, ඒ සඳහා ඔවුන් උනන්දු කිරීමත් ගිහි පැවිදි දෙපක්ෂයේ ම කතෝලිකයන්ගේ යුතුකම බව අපගේ හැඟීමයි. මෙතැන දී නිවැරැදිව අවබෝධ කර ගත යුතු කරුණක් වනුයේ වැඩි දෙනාගේ කැමැත්තෙන් සම්මත වන හැම තීරණයක් ම සාධාරණ තීරණ නොවන බව ය. ඒ බව සනාථ කැරෙන, මෙතෙක් රට පාලනය කළ හැම දේශපාලන පක්ෂයක ම පාලන කාලය තුළ දී ගැනුණු තීරණ, ඕනෑ තරම් සොයා ගත හැක.

මීළඟට අප සඳහන් කරනුයේ, දේශපාලන ක්ෂේත්‍රය තුළ ගිහි කතෝලිකයාට හිමි කාර්ය භාරය පිළිබඳව අපගේ අදහස දේශපාලනඥයන් පිළිබඳව වර්තමානයෙහි ඇති තක්සේරුව අනුව සාධාරණව හිතන ජනතාව, අවංකව හිතන ජනතාව දේශපාලනය සඳහා ඉදිරිපත් වීමට මැලිකමක් දක්වන බව සත්‍යයකි. එහෙත් සාධාරණව හිතන්නන්, අවංක ව හිතන්නන් දේශපාලනය සඳහා යොමු නොවන්නේ නම් දේශපාලනය තව තවත් පිරිහීමට පත් වන බව ද, එමඟින් රටට බලවත් හානියක් සිදුවන බව ද ඊටත් වඩා බලවත් සත්‍යයකි. එය ජනතාවගේ දැඩි සැලැකිල්ල යොමු විය යුතු සත්‍යයකි.

අනෙක් අතට ජාතියට බලපාන කිසියම් ප්‍රශ්නයක් පිළිබඳව කතෝලික මතය ප්‍රකාශ විය යුතු තැන එම මතය නිවැරැදි ව ප්‍රකාශ නොවන්නේ නම් එය කතෝලිකයන් වශයෙන් අපගෙන් සිදුවන බලවත් අඩුපාඩුවක් ද වනු ඇත. ඉහත සඳහන් සසුන් පියාණන්ගේ ලිපියේ "කතෝලිකයනට දේශපාලනයට සෘජුව සම්බන්ධවීමේ ණය යුතුකමක් තිබෙනවා" යැයි සඳහන් වී තිබීමෙන් ඒ බව මැනැවින් පැහැදිලි වේ. එබැවින් ඒ ඒ රටවල ජනතාවට හිතවත් වන අයුරින් ක්‍රියාකාරී දේශපාලනයෙහි යෙදීමට හැකියාවත්, කතෝලික අනන්‍යතාවත් ඇත්තවුන් දේශපාලනයෙහි යෙදීම අනිවාර්යයෙන් ම සිදු විය යුත්තක් බව පෙනේ.

මෙම දිවයිනෙහි අද පවත්නා පාලන තන්ත්‍රය අනුව සාර්ථක ව දේශපාලනයෙහි යෙදෙන්නට නම් කිසි යම් ප්‍රධාන දේශපාලන පක්ෂයකට සම්බන්ධ විය යුතු බව පෙනේ. තෝරා ගැනෙන එම දේශපාලන පක්ෂය හැම ජාතියකට ම, හැම ආගමකට ම, හැම ජන කොට්ඨාශයකට ම පොදු වූවක් ද විය යුතුය. දේශපාලන ඉතිහාසය පිළිබඳව සලකන විට, සර්ව නිර්දෝෂි පක්ෂයක් නොමැති බැවින් තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව රටට වඩා හිතකර පක්ෂය තෝරා ගැනීම ද, එම පක්ෂය තුළ කතෝලික මතය හඬ නැංවීම ද කතෝලිකයන්ගේ යුතුකමකි. දේශපාලනයෙහි යෙදෙන බොහෝ දෙනකු අතින් සිදු වන වරදක් වනුයේ, තමා සම්බන්ධ වී සිටින හෝ තමා ඇලුම් කරන පක්ෂයෙන් සිදුවන වැරැදි නො දැකීම ය. දුටුවත් ඒ පිළිබඳව නිහඬවීම ය. එබැවින් දේශපාලනයෙහි යෙදෙන කතෝලිකයන්ගේ ඉතා වැදගත් ලක්ෂණය විය යුත්තේ තම පක්ෂය විසින් කරනු ලබන වැරැදි වුව ද දැකීමට තරම් අවංක වීමත්, පක්ෂ විනය නීතිවලින් ඉඩ ලැබෙන පමණට එම වැරැදි පිළිබඳව හඬ නගන්නට තරම් එඩිතර වීමත් ය. නියම කතෝලිකත්වයේ ලක්ෂණ වන එම ගතිගුණ ප්‍රදර්ශනය කළ විට, අප දිව්‍ය ගුරුතුමාණන් වහන්සේ වදාළ "නුඹලා පොළොවේ ලුණු ය. ලුණෙහි ලුණු ගතිය නැති වුවහොත් එයට ලුණු රසය කවන්නේ කුමකින් ද, ඔබ ලෝකයේ ආලෝකය ය. මිනිස්සු පහනක් දල්වා එය බඳුනක් යට නොව පහන් රුකක් උඩ තබති. එවිට එය ගෙදර



වැසි සියල්ලන්ට එළිය දෙයි." යන උපදේශය පිළිපැද්දා වන්නේ ය.

එවැනි ක්‍රියා පිළිවෙළක් අනුගමනය කළ පසුත්, පක්ෂ සාමාජිකත්වය රැක ගැනීම සඳහා, ඇතැම් විට තමා වැරැදි යැයි සිතන තීරණවලට එකඟ වන්නට වීම, ඒ ඒ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් දේශපාලනයෙහි නිරත වන්නවුනට මුහුණ දීමට සිදුවන යථාර්ථයයි. කතෝලිකයන් නියෝජනය කරමින් දේශපාලනයෙහි නිරත වන්නවුනට ද ඇතැම් අවස්ථාවල දී ඒ අමිහිරි යථාර්ථයට මුහුණ දීමට සිදුවන බව අනෙකුත් කතෝලිකයන් අවබෝධ කර ගත යුතු යැයි සිතමු. එවැනි අවස්ථාවක දී, තමාට එකඟ වන්නට සිදු වන්නේ තම හෘදය සාක්ෂිය අනුව කිසිසේත් එකඟ විය නොහැකි බරපතළ තීරණයකට නම්, කතෝලිකත්වය හෝ තම දේශපාලන පක්ෂ සාමාජිකත්වය යන දෙකෙන් එකක් තෝරා ගැනීමට දේශපාලනයෙහි නිරත වන කතෝලිකයකුට සිදු වනු ඇත.

ඉහත දැක්වෙන පරිදි පක්ෂ දේශපාලනයට සම්බන්ධ විය හැක්කේ කතෝලිකයන් අතරෙන් එක්තරා කොටසකට පමණක් බව පැහැදිලි ය. එහෙත් අනෙකුත් කතෝලිකයන් ද දේශපාලනය සම්බන්ධයෙන් තමන්ගෙන් සිදුවිය යුතු කාර්යභාරය පිළිබඳව අවබෝධයක් ඇති ව සිටිය යුතු යැයි සිතමු. රටට බලපාන කිසියම් දේශපාලන තීරණයක් ගැනෙන අවස්ථාවක දී, එසේ නැතහොත් දේශපාලනයට අදාළ කිසියම් සිද්ධියක් වූ අවස්ථාවක දී, වේදිකාවකට නැඟී තම කතෝලික මතය පළ කරන්නට ඔවුනට හැකියාවක් නැත. එහෙත් ඒ පිළිබඳව කතෝලික හඬ නඟන වැඩ පිළිවෙළකට සම්බන්ධ වන්නට ඔවුනට අවස්ථාව ලැබෙන්නේ නම් ඔවුන් එම අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීම ද, කතෝලික මතයට එකඟව තම අසල්වාසින් හා සමග ඒ පිළිබඳව සාකච්ඡා කිරීම ද ඔවුන්ගේ යුතුකමක් වනු ඇත. දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ගත් කතෝලිකයකුට නොමැති නිදහසක් අනෙකුත් කතෝලිකයනට ඇති බැවින් තමන්ගේ භූමිකාව මුඵමනින් ම තම හෘදය සාක්ෂ්‍යයට එකඟ ව රඟ පෑමට ඔවුනට හැකි වනු ඇත. ඇත්ත වශයෙන් ම එය ද එක්තරා ආකාරයකට සෘජුව දේශපාලනයට සම්බන්ධවීමක් වශයෙන් සැලැකිය හැක.

වෙනත් රටවල කෙසේ වෙතත් අපගේ රට තුළ දී, අපගේ ගරු පූජාප්‍රසාදිවරුන් සිය දේශපාලන යුතුකම් කොටස ඉටු කිරීම ඉතා සුපරික්ෂාකාරී ව කළ යුත්තක් බව ද, මීසමේ සිටින කවර දේශපාලන පක්ෂයකට අයත් කෙනකුට වුව ද, එතුමා තමාගේ ආත්මික පියාණන් වශයෙන් ගෞරවාන්විත ව පිළිගැනීමට එය බාධාවක් නොවිය යුතු බව ද අපගේ අවංක හැඟීමයි. ඒ අනුව එතුමන් මෙතෙක් අනුගමනය කර ඇත්තේ දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ලබා නොගත්තකු පිළිබඳව අප සඳහන් කර ඇති ක්‍රියා දාමය යැයි කිවහොත් එය නිවැරැදි යයි සිතමු. 'ඥානාර්ථ ප්‍රදීප' කතු වැකියෙන් ද එවැනි ක්‍රියා දාමයක් සඳහා ඉඟිකර ඇති බව සසුන් පියා පක්ෂ දේශ පාලනය ගැන හුවා දැක්වීමක් කර නැතැ යි සඳහන් කර තිබීමෙන් පෙනේ. වඩාත් පැහැදිලි ව කිවහොත් එතුමන්ගෙන් විය යුත්තේ පක්ෂ දේශ පාලනයට සම්බන්ධ නොවී හැම විට ම අසාධාරණත්වයට විරුද්ධ ව හඬ නැඟීමත්, සාධාරණත්වය ඉටු කරවා ගැනීමට දායක වීමත් ය.

ඒ අනුව අපගේ ගරු පූජාප්‍රසාදිතුමන් දේශපාලනය සම්බන්ධයෙන් මෙතෙක් අනුගමනය කළ ඒ ආදර්ශමත් සහ ප්‍රශංසාත්මක ක්‍රියා දාමය ඉදිරියටත් ඒ අයුරින් ම විය යුතු බව අපගේ අවංක අදහසයි.

**ඩබ්ලිව් එම්. ප්‍රනාන්දු**
කනුවන - ජාඇල.



## මීසමෙන් මීසමට

### බොරලැස්සේ දහම් දිනයක්

බොරලැස්ස සා. ආනා දේවස්ථානයේ දහම් පාසල් දරු දැරියන් සහ දහම් ගුරු මණ්ඩලය සංවිධානය කළ දහම් දිනයට ඉතාලියේ වෙරෝනා සංසයේ සේවය කරන ගරු ඇන්ටනි රංජිත් පියතුමා සහභාගි විය.

මේ දහම් දිනය බොරලැස්ස මීසමේ පැවැත්වුයේ ප්‍රථම වතාවටය. දරු දැරියන් විශාල පිරිසක් ඊට සහභාගි වූහ. සංවිධාන කටයුතු මීසම් සේවක ගරු ඇලෙක්ස් වීරසූරිය පියතුමාගේ මඟපෙන්වීමෙන් ගරු මංජු සහෝදර තුමාගේ සහයෙන් සිදුකැරිණ.

ටී. එච්. අජිත් ශාන්ත



හලාවත සා. අන්තෝනි උසස් අධ්‍යාපන හා ටෙක්විතානිකා ආයතනයේ පාඨමාලා හැදෑරූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 800 කට සහතික පත් ප්‍රදානය කිරීමේ උත්සවය හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හලාවත සුදසුන රංග ශාලාවේදී පැවැත්විණි. හෙදියන්, කලා උපාධි, පරිගණක, කාර්මික, පාඨමාලා හැදෑරූ සිසු සිසුවියන් මෙදින සම්මාන සහතික ලැබූහ. එම අවස්ථාවට සා. අන්තෝනි පීඨයේ අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු ජූඩ් ශ්‍යාමන් පියතුමා, හලාවත ආසන දෙව්මැඳුරේ මීසම් සේවක ගරු ලින්ටන් නිහාල් පියතුමා හා හලාවත නගරාධිපති නීතිඥ හිලරි ප්‍රසන්න ප්‍රනාන්දු ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් සහභාගි වූහ.

පර්සි ප්‍රනාන්දු

# අතරමං වූ කිතුනුවන් සොයාගොස් ධර්මය තුළ සුරක්ෂිත කරමු

## මිණිපුර රදගුරු හිමිපාණෝ බලංගොඩදී අවධාරණය කරති

**දරිද්‍රතාවය, සමාජීය හා පාරිසරික ප්‍රශ්න නිසාවෙන් නිවස තුළ, සමාජය තුළ අතරමං වී ඇති පිරිසගේ ක්‍රියාකාරීත්වය අවම වෙලා. ධර්මය තුළ මෙලෙස අනාථභාවය අත්දකින කිතුනුවන් සොයා යාමට උත්සුක වීම ඔබගේ යුතුකමක් යැයි බලංගොඩ ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල දේව මෙහෙයේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණෝ පැවසූහ.**

නවීකරණය කළ දෙව්මැඳුරේ අභිනව පියගැටපෙළ රදගුරු හිමිපාණන් අතින් ආසිරි ගැන්වීමද සිදු වූ අතර මීසම් සේවක ගරු සර්ජියස් ප්‍රනාන්දු හා සහයක පියවරුන් දෙපළ මංගල කටයුතු මැනවින් සංවිධානය කර තිබිණ.

බී. එල්. වීටස් ඇනස්ලි

ඉතාලියේ සිසිලි දූපතේ පූජකවරම් ලැබූ ප්‍රැන්සිස්කාන පැවිදි තෙවන නිකායික ගරු සචිත උදයංගන ප්‍රනාන්දු පැ.තු.නි නවක පියතුමන් තම උපන් ගම වන මීගමුව දූව ග්‍රාමයේ පුදනු ලබන කුළුදුල් දිව්‍ය යාගය සඳහා සිසිලි දූපතේ ශ්‍රේෂ්ඨාධිපති පියතුමන් සමග පැමිණි මොහොතේ දූව මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් පියතුමා සමග දූව - පිටිපන වීදිය මීසම් ජනතාව මහත් හරසරින් පිළිගෙන ඉතා අලංකාර පෙරහරකින් දේවස්ථානය කරා කැඳවාගෙන ආ අයුරු.



# වැලිකන්න ජපමාල මාතා සංඝයේ මහා ධර්ම විවේකයක්

වග මීසමේ ශු. ජපමාල මාතා දෙව් මැඳුරට අයත් වැලිකන්න සංගයේ ධර්ම විවේකයක් ප්‍රැන්සිස්කන් නිකායික ගරු සුමේධ දිසානායක හා ගරු එමසි ප්‍රියශාන්ත පියතුමන්ගේ මෙහෙයවීමෙන් පැවැත්විය.

ජපමාල මාතා මංගල්ලයට සූදානමක් හා නව දෙව්මැඳුර සෑදීමේ මහා කර්තව්‍යයට උරදෙමින් සැදැහැවත් ජනතාව අධ්‍යාත්මික පෝෂණයකට නංවාලන්නට වග මීසම් සේවක ගරු ප්‍රැන්ක් සංජීව පියතුමා මහත් වූ කැපවීමෙන් මෙය සූදානම් කළ අතර සහායක ගරු ක්ලෙමෙන්ට් සංජීව පියතුමාගේ සහයෝගය එතුමාට නොඅඩුව ලැබිණ. සියලු කොට්ඨාශවල නිවෙස් බැහැදකිමින් කොට්ඨාශ දිව්‍ය පූජා පවත්වමින්. නැතිවූ බැටළුවන් හා අතරමංවූ බැටළුවන් නැවත සභාවට එක් කිරීමට පියතුමන් මහත් වෙහෙසක් දරා තිබුනි.

ශු. ජපමාල අභිරහස් මෙනෙහි කරමින් ජපමාල පංති උච්චාරණය කිරීම ලූර්දු ගුහාව අසල ඉටිපහන් ආලෝකයෙන් ඉතා අර්ථවත්ව සිදුකැරිණ. ධර්ම විවේකය අවසානයේ පවුල් කැපකිරීමේ සර්ව රාත්‍රික යාදුම් මෙහෙයක් හා ප්‍රශංසාවක් පැවැත්විණි.

ග්‍රේටා පෙරේරා

# ජීවිත පහන් දල්වන්නට එක්වන්න

නූතන සංකීර්ණ සමාජය තුළ ජීවත්වන සමහර පාර්ශවයන් ඥානාලෝකය වඩා හිඳුවාලීමට අවකාශ ලබා දෙන්නා සේ ජනතාවගේ ජීවිත පහන් ඥානයෙන් සදීපනය කර සමාජ ගත කළ යුතු යැයි පල්ලියවත්ත මීසම් සේවක ගරු ෆීලික්ස් මැල්ලව ආරච්චි පියතුමා (දො.බො.නි) ප්‍රකාශ කළේය.

හේකිත්ත ශුද්ධ වූ ලාසරුස් මුනි දේවස්ථානයේ 133 වැනි වාර්ෂික මංගල මෙහෙයේදී එතුමා එසේ පැවසීය. මංගල කටයුතු සඳහා සමිති සමාගම් හා සැදැහැවතුන් එක්ව සහය දුනි.

ඒ. ඩී. සුනිල්



වෙන්නප්පුව ග්‍රාමයේ උපන් ගරු මේරි මලිනි පැවිදි සොහොයුරිය ප්‍රථමවරට තාපස පොරොන්දු දීමේ දිව්‍ය යාගය පසුගියදා වෙන්නප්පුව ශු. ජුසේ මුනි දේවස්ථානයේදී පැවැත්විණි. වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමා සහ ප්‍රැන්සිස්කාන දිව්‍ය හෘදයේ කුඩා සොහොයුරියෝ නිකායේ ගරු පැවිදි සොහොයුරියන් සමඟ ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු.

සේයා - මයිකල් පෙරේරා, සටහන - ප්‍රියන්ත පීටර්ස්

## හෙට්ටිරිප්පුව ශු. රෝගුස් මුනි මංගල්ලය 110 වැනි වරටත්

කුරුණෑගල පදවියේ හෙට්ටිරිප්පුව ශුද්ධ වූ රෝගුස් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙය කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවත්විණ.

ඉරබඩගම මීසම් සේවක ගරු හිලරි රූපස් තැලිස් පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ හෙට්ටිරිප්පුව දූත සේවා මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මෙම මංගල උලෙළට මිල්ලව භාග්‍යවන්ත ජුසේවාස් පිය කනිටු දෙව්සත්හලේ අදියුරු ගරු නිහල් ඕබ්‍රිස් පියතුමාද එක් වූ අතර මංගල මහා දිව්‍ය පූජා යාගය ඔප්පු කිරීමෙන් අනතුරුව සපැමිණි සැදැහැවතුන් ආසිරි ගැන්වූ අයුරු.

ජී. බී. එච්. ලිවේරා



පමුණුගම මීසමේ ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ දෙමව්පියන් දැනුම්වත් කිරීමක් පමුණුගම දෙව්මැඳුරේදී පැවැත්විණි. මීසම් පාලක ගරු ආනන්ද විතාන පියතුමා මව්පියන් ඇමතීම මෙම සේයාරුවෙන් දැක්වේ.

බෙන්ජමින් කිරිහෙට්ටි

# 125 ජයන්තිය සමරන උඩුගම්පොළ සා. ප්‍රැන්සිස් අසීසි දෙව්මැඳුර

පුදුම්මක අසිරිය



උඩුගම්පොල සකල කල වල්ලභ ප්‍රාදේශීය රාජධානියේ පිහිටි ඉපැරණි උඩුගම්පොළ සා. ප්‍රැන්සිස් අසීසි දෙව්මැඳුර 125 ජයන්ති මහෝත්සවය ඔක්තෝබර් 06 වන ඉරුදින උදේ 8.30 ට මහනුවර රදගුරු අතිඋතුම් ජෝශප් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සැමරීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

125 ජයන්තිය නූතන දෙව්මැඳුරේ සැමරුවත් උඩුග ම්පොල කතෝලික ජනතාවගේ පැවැත්ම අවුරුදු 125 කට සීමා කළ නොහැකිය. පෘතුගීසි සමයේදී උඩුගම්පොල ග්‍රාමය ජේසු නිකායික පූජාප්‍රසාදිතුමන් විසින් මෙහෙයවන ලද විශාල කතෝලික මීසමක මධ්‍යස්ථානයක් වූ බවත් එකල එහි විසු එක්දහසකට අධික කතෝලික බැතිමතුන්ගෙන් වත්මන් උඩුග ම්පොල කතෝලික පරපුර පැවත එන බවත්, ඕලන්ද සමයේ දරුණු තාඩන පීඩන මැද ඔවුන්ගේ මුතුන් මිත්තන් කතෝලික විශ්වාසයෙහි ස්ථිරව සිට එය වත්මන් පරපුරට ආයාද කළ සියවස් පහක වීරෝදාර උඩුගම්පොල කතෝලික පරපුරක උරුමය පිළිබඳව අතිගරු ඉග්නේෂියස් ගම්ලත් නාහිමි තම ලේඛන වල ලියා ඇත.

125 වන ජයන්තිය සමරන ඉපැරණි දේවස්ථානය මේ වන විට පියවර තුනකින් වෙනස්කම් වලට භාජනය වී ඇත්තේ දින දින උඩුගම්පොල කතෝලික ජනගහනය වැඩි වර්ධනය වීම නිසාය. ක්‍රි.ව. 2005 දී කොළඹ 04, සා. පීතර ගම්පහ ශාඛා විදුහල, දේවස්ථාන භූමිය තුළ ආරම්භ කළ නිසා දිවයිනේ නන් දෙසින් කතෝලික ජනතාව මෙහි පැමිණ පදිංචි වීමට පටන් ගෙන ඇත. 1888 දී ශු. ප්‍රැන්සිස් අසීසි මුනිඳුනට කැපකළ කුඩා දෙව්මැඳුර 1988 දී විශාල කළද, අද වන විට එය තවත් විශාල කිරීම අවශ්‍ය වී ඇත්තේ අති විශාල දේව ජනතාවක් ඉරුදින දිව්‍ය පූජා යාගයට සහභාගි වන නිසාය. එබැවින් 125 ජයන්තියට දෙව්මැඳුර ප්‍රතිනිර්මාණය වෙමින් පවතී. ඒ සඳහා රු. කෝටි 2 පමණ වැයවේ. මේ වන විටත් උඩුගම්පොළ දේව ජනතාව එකමුතුවී අන් අයගේ සහයෝගයෙන් ද රු. ලක්ෂ 60 ක පමණ වැඩ කොටසක් නිමා කරගෙන ඇත. මේ සඳහා සහය වන සැම මෙම ජුබිලි මහෝත්සවයේදී අපි විශේෂයෙන් ස්තූති පූර්වකව සිහිපත් කරන්නෙමු.

නව දෙව්මැඳුර කැපකිරීම ඔක්තෝබර් 04 සවස 7 ට අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් අතින් සිදුකැරෙන අතර සන්ධ්‍යා මෙහෙය ඔක්තෝබර් 05 ප.ව. 7.30 ට නි.ම.නි ප්‍රාදේශීයාධිපති අතිගරු රොහාන් සිල්වා නි.ම.නි පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරේ. බුරුල්ලපිටිය මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද ප්‍රනාන්දු නි.ම.නි පියතුමා ප්‍රමුඛ දහම් සේවා සභාව කටයුතු සංවිධානය කරයි.

# පන්නිපිටියේ සමිති සමාගම් ප්‍රතිසංවිධානයක්

පන්නිපිටිය මීසමට අයත් දැනට ක්‍රියාත්මක වන සමිති සමාගම් ප්‍රතිසංවිධානය කිරීමක් මේ දිනවල සිදුවෙමින් පවතී. විසෙන්ති පාවුලා, දිව්‍ය හෘදය, තරුණ, ධර්මදූත සහ පූජා උදව් දරුවන්ගේ සංගම් වල ක්‍රියාකාරිත්වය මීසම් සේවක පියවරුන් විසින් නිරීක්ෂණය කරනු ලබන අතර මීසම් වාසින්ගේ වැඩි සහභාගිත්වයක් මෙම සමිති සමාගම් වල සේවාවන් වෙත යොමුකිරීමට අදහස් කෙරේ.

මීසමට අයත් දෙව්මැඳුරු හය තුළම මෙම නව දැක්ම ක්‍රියාත්මක කරනු ලබන්නේ බාල තරුණ හා වැඩිහිටි වැඩි දෙනාගේ දායකත්වය ලබාගැනීම සඳහාය. මේ අතර මීසමේ පූජා උදව් සමිති වල දරුවන් වෙනුවෙන් ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීමටද කටයුතු සංවිධානය වෙමින් පවතී. ධර්මසේවා සංගම් මූලිකයින්ගේ සහය ඇතිව මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා පියතුමාගේ මඟපෙන්වීමෙන් සහය මීසම් සේවක ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමන් විසින් මෙම තරගාවලිය සංවිධානය කරනු ලබයි.

ක්‍රිස්ටෝපර් රණසිංහ

# නයිනමඩම මංගල්ලය පැවැත්වේ

නයිනමඩම වික්ෂෝප මාතා දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය තලවිල සා. ආනා සිද්ධස්ථාන පාලක අතිගරු නිහාල් පයස් පියතුමන් විසින් පවත්වන ලදී.

ප්‍රතිමාව රැගත් පෙරහරට විශාල පිරිසක් සහභාගි වූ අතර අවසානයේදී වික්ෂෝප දේවමාතා ප්‍රතිමාවෙන් ආසිරිගන්වනු ලැබීය. නයිනමඩම මීසම් සේවක ගරු ඇලෙක්සැන්ඩර් ලයිලි ප්‍රනාන්දු හා සහායක ගරු මිලාන් සුසන්ත පියතුමන් විසින් මංගල්‍යය සංවිධානය කරන ලදී.

වෝල්ටර් නික්ලස් පෙරේරා

## "මරිය වසර" ප්‍රකාශයට තව මාස දෙකයි

# විපුල ප්‍රසාද උත්තමිය



**දේව වචනය ගාබ්‍රියෙල් දේවදූතයාගේ හඬින් දේව අම්මා වෙත පැමිණි මොහොතේ දී එය මුළුමනින්ම භාර ගත්තේ "එසේය" යන එකම එක වදන තුළිනි. ඒ මොහොතේ සිට තම මුළු දිවියම දෙවිඳුන්ට පුද දෙමින් තම කුස තුළ මාංශ ගත වූ දේව වචනය සදාතනික කරන ගමන කොන්දේසි විරහිතව ඇරඹූ ඇගේ ගමන් මඟ අති දුෂ්කර එකක් වූවත් හඬා නොවැටී අතරමඟ නොනැවතී මැසිවිල්ලෙන් තොරව සියල්ල සිත්හි නිදන් කර ගනිමින් ගමන් ගත්තේ දේව වචනය විශ්වාසීව භාරගත් නිසාමය.**

ගවහලක් තුළ දරු ප්‍රසූතිය, අව්, පිනි, වැසි, සුළං, දිවා රෑ ක්ෂණිකව දේශයෙන් දේශයට ගමන් කිරීමේ දුෂ්කරතාවය, හදවත සිඳ බිඳලන දිවැසිවර අනාවැකි, දරුවා දින 03 ක් නැතිවීම තුළ ඇති වූ චිත්ත පීඩා, එකම දරුවා විඳි කස පහර, කටු ඔටුන්න, කල්වරි ගිරිශිඛර මරණයේ කුරුස ගස හරහා ශුද්ධාත්ම ආගමනය දක්වා ඇය විශ්වාසයෙන් ගිය ගමන වළකාලන්නට මේ කිසිවක් සමත් නොවීය. මංගලම් දිනයේ දී "විපුල ප්‍රසාද උත්තමිය" යනුවෙන් ගාබ්‍රියෙල් දේවදූතයාගේ මුවින් පිට වූ දෙවියන් වහන්සේගේ වදන් මහිමාන්විත වූයේ අතිදුෂ්කර ගමන් මඟක් තුළ දේව වචනය විශ්වාසයෙන් අයිති කර ගැනීම තුළය. ජන්ම දෝෂයෙන් නිදොස් කන්‍යාවක් ලෙස ස්වර්ගාරෝපණය වීමේ මහිමයට පත් වූයේ දේවදාසිය ලෙසට දෙවිඳුන් තුළ යැපීම නිසාමය.

කිතුනුවන් සැටියට දේව අම්මාගේ ජීවිතාදර්ශය අප ජීවිත තුළට මාංශ ගත කර ගන්නේ නම් දෙවිඳුන් තුළ අප සැම මහිමයට පත්වනු නොඅනුමානය. ඒ වාසනා මහිමය අත්දකින්න මෙවර ආගමන සමයත් සමඟ ප්‍රකාශයට පත්වන මරිය වසරට ඒකරාශි වෙමු. විශ්වාසය තුළින් දේව කැමැත්ත තේරුම් ගෙන දේව වචනය අයිති කරගනිමින් තම ආශා, කැමති, බලාපොරොත්තු, සියල්ල ත්‍යාජ කරමින් දේව වචනය සදාතනික කරන්නට දේව අම්මා ගිය ගමන අපේ දිවියේ පරමාදර්ශය කර ගනිමින් දුෂ්ඨ බලවේග පලවා හරින්නට එතුමිය හා කැප වෙමු. අප නිවසේ සාලය මැද සවස් යාමය වන විට මුළු පවුලම එක්කාසු වෙමින් නපුරේ බල සිඳ බිඳලන ජපමාලය හඬ නගා උච්චාරණය කරන්නට කැපවෙමු.

තමා ශුද්ධවත් වෙමින් අනෙකා ශුද්ධවත් කිරීමේ තේමාව තුළ මෙහෙය වෙන මරිය හමුදා සංඝයට ක්‍රියාකාරීව හා සහකාරව බැඳෙන්නට පෙළ ගැසෙමු. නිවසින් සමාජයට, රටට හා මුළු විශ්වය පුරාවට බැහැපත් නිහතමානී, අසීමිත විශ්වාසයේ ප්‍රතිමූර්තිය වූ දේව අම්මා රැගෙන යමින් ජන හදවත් දහමින් පුබුදුවාලීමට වෙර දරමු. අදහම, අගතිය, අයුක්තිය හා අසාධාරණයට නතුවෙමින් දෙවියන් වහන්සේගෙන් ලත් නිදහස් කැමැත්ත නොමනා ලෙස හසුරුවමින් සමාජ ව්‍යසනයට යොමුවන චින්තනයෙන් මිදී දැහැමියාව තුළට නැඹුරුව තමා සිතන පතන බලාපොරොත්තු වන ලෞකික දෙයට වඩා සදාතනික දිවියේ මහිමාන්විත වරම පතා විශ්වාසයෙන් යුතුව දේව වචනයට "එසේය" කියන්නට දේව අම්මා මෙන් පරිත්‍යාගශීලි වන්නට මේ මරිය වසර තුළ ජීවිත වෙනසකට පියනඟන්නට කැපවෙමු.

✍ පමුණුගම බෙනී ජයමාන්න

### සැබෑ ප්‍රීතිය

වචනයෙන් පව් නොකළාවූද
තමාගේ පව් ගැන ශෝකයෙන්
සිත් වේදනාවක් නැත්තාවූද
මිනිසා භාග්‍යවන්තයෙකි.

තමාටම දෝෂාරෝපණය කර ගැනීමට
හේතුවක් නැත්තාවූද
බලාපොරොත්තු අත් නොහරින්නාවූද
මිනිසා භාග්‍යවන්තයෙකි

උපුටා ගැනීම - උපදේ. 14:1-2

✍ අයේෂා ද සිල්වා

### සවිය දුන්නේ ඔබයි සමිඳුනි

කඳුලැලි ...නින්දා...
අපහාස... ගැරහුම්
නිමක් නැතිව නැගෙන විට
මගේ ජීවිතයට..
බරවූ කුරුසියක් මගේ
කරපිට බව දැනුනා සමිඳුනී
ඔබ මා වෙත හැරී බැලුවා වරක්
නොව දස දහස් වතාවක්
මා වැටේ දෝ කියා...
කලකිරී පසුතැවී මා ජීවිතේ
පලා යන්නට සිතූ හැම විට
ඔබ දෑත දිගු කර බලා සිටියා
ජේසුනී,
මා සිප වැළඳ ගන්නට..
එබැවින් මම නැගිට එන්නම්
ජීවිත කුරුසිය කරට ගෙන..

✍ තුෂාරි සංගපාලආරච්චි




"එදිනෙදා ජීවිතයේ දී අපට මුහුණ දෙන්නට සිදුවන විවිධ ගැටලු ප්‍රශ්න රෝග පීඩාදියට විසඳුම් සෙවීම සඳහා අපෙන් විය යුතු කොටස අමතක කර දමා දෙවියන් වහන්සේ ප්‍රාතිහාර්යයන් මගින් ඊට විසඳුම් දෙනවා යැයි බලාපොරොත්තු වීම යුක්ති සහගත නොවේ."

(කුලියාපිටියේ - රීටා සේනානායක)

### ඉන්නා තුරු නොදැනුනි "මා පිය අගය"

අම්මේ මට දුන් කිරි සුවඳ අදයි මට දැනෙන්නේ - පියාණනි මට ඔබ දුන් ජීවය අදයි මට දැනෙන්නේ
දෙමාපිය හඬින් "පුතේ" කියනු අදයි මට ඇහෙන්නේ - පියේ මවේ මගේ හදවතේ දැනෙනා විට දුක කාටද මා කියන්නේ
ඉන්නා තුරු දැනුනේ නැහැ ඔබ දෙපළගේ අගය - දන්නා කාලෙක මගෙ යුතුකම් අමතක වුවෙ මගෙ තිබූ දඟය

සිතන්නට වේලාවක් නැත මගේ සිත අද මලැයි - පතන්නට සිතයි දහසක් දේ ඔබ දෙපලම මගේ සහය
සිහිනෙන් පෙනී පෙනී මා දකින දේ - කියන්නට සිත නොමදෙයි
සිහිනෙන් දුටු දෙය මා ඉටුවේ නම් - මගේ සිත නිශ්චල වෙයි

✍ ජූඩ් ජේ. ප්‍රනාන්දු - ගෙලි ඔය

## "යමෙක් ඔබේ වම් කම්මුලට පහර දුන්නොත්...?"



**පසුගිය සතිය හා සබැඳේ...**

**කෙසේ වෙතත් සුබාරංචිය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ළඟ තිබූ පොල් අත්තත් හනසු දෙකකුත් ප්‍රසාද දීමනා ලෙස ලබා ගත් ගුණවතී වත්තෙන් පිට විය.**

මෙසේ කරුණු සියල්ල සිදුවෙත්දී හාමුගේ ඇසට එනම් ආරක්ෂක කැමරා පද්ධතියට සියල්ල අසු වී තිබිණි. පීටර් අයියා මිදුලට ගොඩ වන විටම නඩු විභාගයට මුහුණ දෙන්නට සිදුවිය. "ගමේ ගැනුන්ට තමන්ගේ දේපොළ බෙදන්නේ මන්දැ"යි යන පැනයට පිළිතුරු ලෙස "ඇඳුම් දෙකක් ඇත්තා ඉන් එකක් නැති තැනැත්තාට දිය යුතුය" යන සුබ ආරංචිය හාමුට ප්‍රකාශ කරන්නට ගොස් කම්මුල් පාරක් ද කෑමට පීටර් අයියාට සිදුවිය.

"යමෙක් ඔබේ වම් කම්මුලට ගැසුවොත් ඔහුට දකුණු කම්මුලත් හරවන්න" ඉතින් පීටර් අයියා දකුණු කම්මුලත් පෑවේය. "චටාස්" තරු විසිවෙන පහරක් එයට ද ලැබිණි. පීටර් අයියාට තද විය. එතනින් එහා කළ යුතු දේ ජේසු ද කියා ඇති බවක් මතක නැත. "තොගේ කැඳවත් මට එපා" කියා වහාම ක්‍රියාත්මක වන ලෙස සේවයෙන් ඉල්ලා අස්විය. අඩුම් කුඩුම් සියල්ල අකුලාගෙන පල්ලම් බැස්සේය. අවාසනාව ඉස්සරහටම හමු වුණේ ඩිංගිරා ය. කිසි ඇහිල්ලක් බැලිල්ලක් නැතිව අත දිග හැර කනේ පහරක් ඩිංගිරාට එල්ල විය. ඩිංගිරා අන්ද මන්ද විය. කිසි වරදක් නොකර ගුටි කෑමට ඔහු සූදානම් නැත. එපමණක් නොවේ. "යමෙක් වම් කම්මුලට ගැසුවොත් ඔබේ දකුණු කම්මුලත් හරවන්න" කියූ දේව වචනය ද ඩිංගිරා දන්නේ කොහොමද? ඔහු වැස්සකටවත් පල්ලියට ගොඩ වන්නෙක් නොවේ. එහෙයින්ම ප්‍රතිචාරය රළු විය. ඩිංගිරා ද පෙරළා පහර දුන්නේ ය. පීටර් අයියා ද කිඹුලා කෑ විට ඉවසුවත් කොහිල කටු ඇනෙන විට ඉවසන්නට සූදානම් නැත. හබය දුර දිග නොගියේ පල්ලියේ පියතුමා එතනින් යන්නට ආ හෙයිනි.

දීර්ඝ පැහැදිලි කිරීම්, ආඩපාලි, ඇනුම් බැනුම්, දුක් ගැනවිලි රාශියකින් පසු සිදු වී ඇති දෙය තේරුම් ගැනීමට පියතුමාට හැකි විය. පීටර් අයියාවද කැඳවා ගෙන පියතුමා ලැගුම් ගෙදරට ගියේ පීටර් අයියාට ද යන්නට එන්නට තැනක් නොතිබූ නිසාය. හාමු මහත්තයාගේ රැස් වළල්ල ද ඉක්මනින්ම අවසන් වුණේ ඇරපු සෝඩා බෝතලයක් සේය. ඇරත් පීටර් අයියා නැති විට තම දකුණු අත නැති වීම හා සමානය. හාමු මහත්තයාම ගොස් පීටර් අයියාව ආපසු කැඳවා ගෙන ආවේ "වැරදීම මිනිස් ගතියක්, සමාව දීම දේව ගතියක්" කියමන මතක් කර දීමෙන් පසු පීටර් අයියා දෙවි කෙනෙක් වීමට කැමති වීම නිසාය.

- නිමි -

✍ ඇලෙක්ස් පී.ඩී. ශ්‍රී චන්ද්‍ර

## ආපහු ගෙදර එන්න...

**පසුගිය සතිය හා සබැඳේ**

**වර්තමාන වෙළෙඳ ෆැන්ටසි හා විශ්ව ගම්මාන සංකල්ප වලින් ඇස් නිලංකාර වෙලා ඉන්න අප, මේ විශ්ව සත්‍යය තේරුම් ගන්නේ කවදා ද? අපි බලමු අපේ දෑස් තුළින් බොඳවී යන මේ සැබෑ විමුක්තියේ සිත්තම අපට හැකි පමණින් තේරුම් ගෙන කිතු තුමාගේ විශ්ව පණිවුඩය හා අනුගත වන්න.**

**අපි යමු පැරැණි ගිවිසුමට, "දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක. දෙවියන් වහන්සේගේම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක..." (උත්පත්ති 1:27)**

අපි මෙතැනින් පටන් ගනිමු. කතෝලිකයන් වශයෙන් අපි මේ විශ්වාසය තුළ සිටිනවාද? දිව්‍ය පූජාවේදී "උන්වහන්සේ උකුත් වූ සේක. උන්වහන්සේ උත්ථාන වූ සේක. උන්වහන්සේ නැවත වඩින සේක" කියා මහා ශබ්දයෙන් අපේ විශ්වාසය ප්‍රකාශ කරනවා වගේම, පැරැණි ගිවිසුමේ සඳහන්ව ඇති ඉහත දැක් වූ අති ප්‍රබල ප්‍රකාශය අපි පිළිගන්නවාද? එසේ නම්... එය අප සැමට සංකල්පීය වශයෙන් "කකුල තියාගන්න හොඳ පාගලක්" නොවේද? එනම්, අපිව මවා ඇත්තේ, "දෙවියන් වහන්සේගේ ස්වරූපයට" මයි. මේ ස්වරූපය යනු, භෞතිකව පෙනෙන අපේ නහය - කට - අත - පය සහිත මේ දිරා යන රූප ස්වභාවය නොවන බව ඔබට තේරුම් ගත හැකියි.

උන්වහන්සේගේ ස්වභාවයට අපව මවා ඇතැයි යනු, අප මෙලොවට බිහිවන විට ඇති අපගේ චිත්ත ස්වභාවය" හා අපේ "ආත්මික ස්වභාවය" වන බව ගැඹුරින් තේරුම් ගනිමු" සරලව කියනවා නම්, අප මෙළොවට බිහි වන්නේ දේව ස්වරූපයේ විඥානමය ස්වභාවයෙන් යන්න යි. කොටින්ම අද වන විට "යක්ෂ පැටව්" ලෙසින් මේ සුන්දර ලෝකය අසුන්දර කරන්නේ, මුලදී අවිහිංසකව හා නිර්මලව බිහිවුණු "දේව පැටව් ටිකක්."

අද අපි පෙළෙන මෙම ආධ්‍යාත්මික පරිහානියට මූලික හේතුව වන්නේ, අපි කකුල් තියාගෙන ඇති ස්ථානය පිළිබඳව අපටම ඇති අවිශ්වාසය යයි මට නිතරම හිතෙනවා. විශ්ව මැවුම්කරුගේ ස්වභාවයට මවා ඇතැයි ශු. බයිබලය විසින් අපට දී ඇති සහතිකය, අප කනකටවත් ගෙන නෑ වගෙයි. සමස්තයේ කොටසකට කිසිදා සමස්තය බවට පත්විය නොහැකි බව සත්‍යයක් වුවත්, මහා සාගරයේ කොතැනින් හෝ ලබාගත් දිය බිඳුවක, මහා සාගරයේ රසායනික ගුණය ම තිබෙනවා. එබැවින් දිය බිඳුවක් සාගරයට පතිත වීම, සාගරය දිය බිඳුව තුළට ඇතුල් වීම ලෙසින් ආධ්‍යාත්මිකව නිර්වචනය කළොත් එය ඔබට දරාගන්න පුළුවන්ද? මේ පිළිබඳව මඳක් මෙනෙහි කර බලන ලෙසින් ඉතා ආදරයෙන් ඉල්ලා සිටින්නේ, ඔබගේ සැබෑ විභව්‍යතාවය පිළිබඳ සරළව මතක් කර දීමටයි. නැතිව, ඔබව වචන තුළ අතරමං කරන්න නොවේ.

එලෙස දෙවිඳුන් අප තුළ සිටින විට අප මේ තරම් බියවී කටයුතු කරන්නේ ඇයි? මේ තරම් දුෂ්ටකම් අප තුළ ඇත්තේ කෙසේද? මේ තරම් ඊර්ෂ්‍යාවක්, උඩඟුකමක්, හෙළාදැකීමක්, සැකයක්, වෛරයක් අප සිත් සන්තානයන්හි පැළපදියම් වන්නේ කෙසේද? මේ අපට "මුල අමතක වීමේ රෝගය" හැර වෙන කුමක් ද? එබැවින් අපගේ ආරම්භය හෙවත් අපේ "සැබෑ මූලය" වෙත වහාම පියඹා යාමත්, විසඳුමේ කොටසක් බව ඔබට වැටහෙනවා නම් ඔබ ඉන්නේ ජයකණුව ආසන්නයේම යි.

මෙන්න, විශ්ව ධර්මයේ ලෝක ස්වභාවය දැක්වෙන මෙම ව්‍යවස්ථාව "අවලංගු කිරීමට නොව, එය මානවීය ආදරයකින් ක්‍රියාත්මක කිරීමට" පැමිණි දෙවියන් වහන්සේගේම පෘථිවි ස්වරූපය වූ ක්‍රිස්තු තුමාගේ හඬ, "ඒකාන්තයෙන් මම ඔබට කියමි. යමෙකු නැවත නූපන්නොත්, ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැකිය" (ජුවාම් 3:3)

මේ එතුමා කියන දෙයින් ගම්‍ය වන්නේ කුමක්ද? එහි අර්ථය, ඔබට ඔබේ මුල් ස්වරූපය හෙවත් සංකල්පීය වශයෙන් මුල් අවිහිංසකත්වය සොයා යෑමට කෙරෙන ආරාධනයක් නොවේදැ"යි ඔබෙන්ම විමසා බලන්න. අපේ මේ මුල් ස්වරූපය කුමක්ද?

වෙනත් අවස්ථාවක දී ක්‍රිස්තු තුමා "දරුවන්ට මා වෙත එන්න ඉඩ හරින්න. ස්වර්ග රාජ්‍යය පවතින්නේ මෙවැන්නන් අතර"යි කී බව ශුද්ධ ලියවිලි පවසනවා. මෙසේ මෝල් ගහෙන් ඇන ඇන අපට පෙන්වාදෙන පණිවුඩයේ හඬ ඔබට ඇසෙනවාද? දරුවකුගේ සැබෑ ස්වභාවය වූ "නිර්මල බව" පූර්ව නිගමන වලින් තොරව ලෝකය දෙස බැලීම", "මොහොත තුළ ජීවත් වීම" වැනි සොඳුරු ගති ලක්ෂණ නිසා ඔවුන් ජීවත්වන සැහැල්ලු බව වෙත යන්න අපටත් නිතරම හිතෙනවා. එම සැහැල්ලු හා සාමකාමී බව අපේ සිත් වලින් දුරු වෙලා හුඟක් කල් නිසා, එක අතකට අපිට අපේ එම මුල් ස්වභාවය වෙත දුවයන්න සිතෙන එක පුදුමයක් ද නොවේ. අපේ ජීවිත පිරිලා තියෙන්නේ "පරණ වැරදිවල මතකයන් ගෙන්", "අතීතය ගැන කම්පා වෙමින්" "අනාගතය පිළිබඳව වූ අනවශ්‍ය බියවලින්" වැනි සෘණ කුණු ගොඩවල් වලින් නිසා, අප තුළ මුලින් තිබුණු සැහැල්ලුව පැල දොරින් පැන ගිහින්. මේ නිසා තමයි අපට අපේ මුල් ස්වභාවය වෙතට යාමේ අවශ්‍යතාවය තව තවත් මතුවෙමින් එන්නේ.

ඒ නිසා අපේ සිත් තුළ පවතින පිලුනු ස්වභාවය හැරදා නැවතත් අපේ මුල් ස්වභාවය වන අපේ මුල්ගෙදර හෙවත් මහ ගෙදර වෙත යන්න සූදානම් වෙන්න. කොටින්ම මහ ගෙදරින් බොහෝ දුර ඈතට ගිහින් හති වැටී ඉන්න අපට, ආපහු අපේ ගෙදරට එන්න කරන මේ කිතු තුමාගේ ආදරණීය ආයාචනය වෙත හැරෙන්නට ධෛර්යය ගනිමු. අකීකරු පුත්‍රයා නැවත "ආපහු ගෙදර එනතුරු" සියලු වැරදි වලට සමාව දෙන ආදරණීය තාත්තෙක් බලා ඉන්නවා. ශුද්ධවූ ලියවිලි අතර එලෙස දිදුලන "මිණිකැට" හඳුනා ගෙන ඔබේ වත්මන් දිවි මඟ ප්‍රීතියේ සහ ප්‍රමුදිත බවේ මාවත වෙත හරවා ගන්නට අවැසි නැණ නුවණ ඔබට ලැබේවායි පතමින් ම තවත් මිණිකැටයක් ද ඔබ්බවා මේ ලිපිය අවසන් කරන්නෙමි.

"මිනිස් සිතේ වටිනා අදහස්, ගැඹුරු ළිඳක වතුර වැනිය. නැණ නුවණ ඇති අය එය ඇද ගනිති." (හිතෝපදේශ 20:5)

-නිමි-

✍ ප්‍රීති ජයසූරිය

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## දෙවන සතිය බදාදා සැඳෑ යාම යැදුම

### 62 වැනි ගීය

**පසුගිය සතිය හා සබැඳේ...**

පර්වතය... බලකොටුව : මෙම සංකල්ප හෙබ්‍රෙව් ආගමික සාහිත්‍යයෙහි "දෙවියන් වහන්සේ උදා කරන ගැලවීම" හැඟවීම සඳහා නිතර භාවිත වේ (ද්විතිය 32:4, 2 සාමුවෙල් 22:2, ගීතා 18:2, 46:7).

නොසැලී සිටිමි : සුරක්ෂිත භාවයේ ජීවිත අරමුණ ගැන මෙනෙහි කිරීමේදී එහි සැබෑ අත්තිවාරම වන්නේ දෙවි සමිඳාණන් වහන්සේ බව පැහැදිලිය (ගීතා 16:8, 30:7). දුබල බව, කැළඹිලිබව දැනෙන අවස්ථාවලදී සැදැහැවතා දෙවි සමිඳාණන් වෙත ඇදහිල්ලෙන් යොමුවීමෙන් උන්වහන්සේ සලසන සුරකි බව අත් දකින්නේය.

**සෙලවෙන තාප්පයක් :** "තාප්පය" නැතහොත් "බිත්තිය සංකේතවත් කරන්නේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීම සඳහා ගන්නා පියවර ලෙසිනි.

කෙසේ වෙතත් සතුරු බලවේග හා පීඩා මැද එවන් තත්ත්වයක දී දෙවි සමිඳාණන් කෙරෙහි ඇදහිල්ලෙන් පසුවන සැදැහැවතා සන්සුන් බව සහ සුරැකියාව හිමිකර ගන්නේය. (ජෙරමියා 1:18-19, 15-20, හිතෝප. 18:11)

**බොරු කීමට ප්‍රිය වෙති :** "සත්‍යයට පිටුපාන අයගේ ජීවිත අසත්‍යයේ සහ නිසරු බවේ බලපෑම් වලට යටත්වය. ශුද්ධ බයිබලයේ ප්‍රඥා සාහිත්‍යය අසත්‍යයේ ආකල්ප තරයේ හෙළා දකියි. (ගීතා. 119:163, හිතෝප. 30:8, ජෝබ් 21:34).

**මගේ සිතට සහනය :** හෙබ්‍රෙව් පිටපතට අනුව "මගේ බලාපොරොත්තුව" යනුවෙන් දැක්වෙන මෙම යෙදුමින් විශ්වාසයේ හා බලාපොරොත්තුවේ තේමා මනාව කැටිකොට පෙන්නුම් කෙරේ. එය සැදැහැවතා තුළ ඇති දෙවියන් වහන්සේගේ ගැලවීමදායක ක්‍රියාවන් අරබයා ඇති දැඩි ආශාව විදහා දක්වන්නේ ය. (ජෙරමියා 14:22, ගීතා 39:7, 146:5).

ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

**(64)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

☛ ලබන සතියට

## ගරු හෙන්රි සිල්වා පියතුමා




### එළිදරව්වෙහි 01 පරිච්ඡේදය පිළිබඳ විවරණයක්

මෙතැන් පටන් අප ආරම්භ කරන එළිදරව් ග්‍රන්ථයේ විවරණය තේරුම් ගැනීමට පසුගිය කලාප දෙකෙහි පළ වූ එළිදරව් සාහිත්‍යයටත් එළිදරව්ව ග්‍රන්ථයටත් කළ හැඳින්වීම බෙහෙවින් උපකාර වෙනු ඇත. එළිදරව් ග්‍රන්ථය කියවා තේරුම් ගැනීමට අපහසු යැයි අප සිතන සෑම වගන්තියක් පාසා විවරණයක් කළ යුතු බව අප පිළිගන්නා අතර එය ලුහුඬින් කිරීම අසීරු බව සඳහන් කිරීම යෝග්‍යය. කරුණු කෙසේ වෙතත්, එය හැකිතාක් දුරට සම්පූර්ණ ලෙසත්, පැහැදිලි ලෙසත් කිරීම අපගේ බලාපොරොත්තුවයි. විවරණය පැහැදිලි කිරීම සඳහා ශු. බයිබල සිංහල පොදු අනුවාදයේ (1982) උපුටා ගත් වගන්තීන්හි ග්‍රීක පිටපතට අනුකූලව වචන නිවැරැදි කිරීම් වස් වෙනස්කම් කරැති බව සළකන්න.

**එළිදරව්ව සංස්කාරක පෙරවදන - 1:1-3**

**1 වෙනි වගන්තිය -**

"ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ එළිදරව්ව මේය. දෙවියන් වහන්සේ එය ඔවුන් වහන්සේට දී ඇත්තේ ඉක්මනින් සිදුවිය යුතු දේවල් තම සේවකයින්ට දක්වනු පිණිසය. ඔවුන් වහන්සේ තම දූතයා එවමින් ඒ දේවල් තම සේවක ජොහාන් හට දැන් වූ සේක."

ජේසු නමැති ආලේප කරනු ලැබූ එනම් ක්‍රිස්තුන් වහන්සේ විසින් කරන අනාවරණයක් ලෙස එළිදරව් පොත ඉදිරිපත් කෙරේ. එකී අනාවරණය ඔවුන් වහන්සේට දෙවියන් වහන්සේගෙන් ලැබී ඇති නිසා ඔවුන් වහන්සේ ඒ දේව අනාවරණයේ මධ්‍යස්ථකයාණන් වෙති. (හෙබ්‍රෙව් 1:1 බලන්න) දේව අනාවරණයේ කර්තෘවරයාණෝ දෙවි ස්වාමින් වහන්සේම ය.

**"ඉක්මනින්"** යන්න මෙහි ඇති ප්‍රධාන අදහසකි. දරුණු ආගම් පීඩනයට අසුවී සිටින කිතුනු සැදැහැවතුන් දිරිගන්වා ඔවුන් විශ්වාසයේ ස්ථිර කිරීමේ පරමාර්ථයෙන් ඔවුන්ගේ ගැළවීම සඳහා දෙවියන් වහන්සේගේ මැදහත්වීම ආසන්න බව සඳහන් කර ඇත. එම නිසා ඔවුන්ගේ දුක් විඳීම සීමාවක් දකින බවක් හඟවයි. එහෙයින් ඉවසීම අත්‍යවශ්‍යය.

**"සිදුවිය යුතු දේවල්"** අනාවරණය වන්නේ සිදුවිය හැකි දේ ගැන නොව සිදුවිය යුතු දේ ගැනය. එනම්, සැදැහැවතුන් මැදි වී සිටින ආගමික පීඩනය ද, දේව සැලැස්මේ අංගයකි. එය දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය යටතේ සිදුවේ. එය සැදැහැවතුන්ගේ ජයග්‍රහණයත් සතුරන්ගේ පරාජය හා දඬුවමත් ය.

# ඔක්තෝබර් මාසය ජපමාල මාසයයි



ආදර දුවේ, පුතේ එළඹෙන ඔක්තෝබර් මාසය ජපමාල මාසයයි. එදා ලූර්දු, පාතිමා නගර වලදී ඔබ වැනිම වූ දරුවන්ගෙන් අප දේවමාතාවන් ඉල්ලා සිටියේ පවට නැඹුරු වූ ලොව, ශුද්ධවත් කරන්න නිරතුරු ජපමාලය යදින්න කියාය.

ජපමාල බැතිය මාසයකට සීමා වූවක් නොවේ. දරුවකුට මවකගේ රැකවරණය අවශ්‍යමය එසේම අද අප සමාජය තුළ කතෝලික දරුවකු වශයෙන් යහගුණ ඇතිව ආරක්ෂාකාරීව ජීවත් වීමට මේ දේව අම්මාගේ රැකවරණය අත්‍යවශ්‍යමය. ක්‍රිස්තු ප්‍රතිපත්ති වනසාලන අදේව වාදී ධර්මයන් මේ උතුම් ආදරයට පටහැනිය. අසහනය බිය, සැකය, මුලාව අද ලොව රජයයි. අප බාල පරපුර වෙතින් මේ උතුම් භක්ති අභ්‍යාසයට ඇති ලැදියාව ගිලිහී යාම කණගාටුදායකය. පරිගණකය, ජංගම දුරකථන, රූපවාහිනිය, ඔවුන්ගේ ලෝකය ගිලගෙන හමාරය.

දරුවනි, ඒවායින් ඔබ ජීවිතයට වැඩදායි දේ පමණක් ලබා ගන්න. බුද්ධිමත්ව ඒවා හසුරුවන්න ප්‍රවේශම් වන්න. ඔබේ වැඩකටයුතු කලට වේලාවට නිම කර සවස දෛනික යැදුම් වලදී මහත් බැති සිතින් ජපමාලය කියා මෑණියන් පුදන්න. ඔබේ පවුලේ සියලු දෙනාවම ඊට එක්කර ගන්න වෙර දරන්න. සියලුම සැනසීමේ උල්පතවන මරිය මාතාවන්ගේ පිහිට ඔබට අනිවාර්යයෙන්ම ලැබෙනු ඇත.

ජීවිතයේ සැඳෑ සමය ගෙවනා ඔබේ ආදර වැඩිහිටියන් දෙස බලන්න. ඔවුන් ජපමාලයට දක්වන්නේ ඉමහත් භක්තියකි. ගමන් බිමන් යන විට මුදල් පසුම්බියේ රුවාගත් ජපමාලය මුමුනමින් යාම ඒ අයගේ සිරිතකි. ජපමාලය ඒ අයගේ ප්‍රාණ නාලිය විය.

ආදර දරුවනී, ඔබත් කුරුස කර තබාගෙන වැටි වැටි යන මේ ජීවිත වන්දනා ගමනේ දී ජපමාලය යදිමින් අප ආදර මෑණියන්ගේ පිහිට ලැබ ඒ මගින් අප සුර පුතනුවන්ගේ මුහුණ දැකීමේ භාග්‍යය උදා කර ගන්න.

✍ දහම් ආචාරිනී
**ඩබ්. ඒ. සී. ෆොන්සේකා**

## පූජා සතිය සැප්. 29 - ඔක්. 06 දක්වා

| | |
|---|---|
| 29 ඉරිදා | **සාමාන්‍ය සමයේ විසිහයවන ඉරුදින (ජාතික ධර්මෝපදේශ දිනය)**<br>(කොළ) ආමොස් 6:1,4-7<br>ගීතාවලිය 146:5බී - 10<br>1 තිමෝති 6:11-16 ලූක් 16:19-31 |
| 30 සඳුදා | **සාන්ත ජෙරොම් මුනි අනිවාර්ය අනුස්මරණය**<br>(සුදු) සෙකරියා 8:1-8<br>ගීතාවලිය 102:15-20,28,21-22<br>ලූක් 9:46-50 |
| 01 අඟහරුවාදා | **සා. තෙරේසා කන්‍යාව මංගලෝත්සවය**<br>(සුදු) ඉසයියස් 66:10-14<br>ගීතාවලිය 131:1-3 මතෙව් 18:1-4 |
| 02 බදාදා | **ශුද්ධවූ රැකවල් දූතයෝ අනුස්මරණය**<br>(සුදු) නික්මයාම 23:20-23<br>ගීතාවලිය 91:1-6, 10-11 මතෙව් 18:1-5,10 |
| 03 බ්‍රහස්පතින්දා | (කොළ) නෙහෙමියා 8:1-12<br>ගීතාවලිය 19:7-10 ලූක් 10:1-12 |
| 04 සිකුරාදා | **ශුද්ධවූ ප්‍රැන්සිස් අසීසි මුනි අනිවාර්ය අනුස්මරණය**<br>(සුදු) බාරුක් 1:15-22<br>ගීතාවලිය 79:1-5, 8-9 ලූක් 10:13-16 හෝ ගලාති 6:14-18 ගීතාවලිය 16:1-2,7-8,11 මතෙව් 11:25-30 |
| 05 සෙනසුරාදා | **කතෝලික ගුරු දිනය**<br>(කොළ/සුදු) බාරුක් 4:5-12,27-29<br>ගීතාවලිය 69:32-36 ලූක් 10:17-24 |
| 06 ඉරිදා | **සාමාන්‍ය සමයේ විසිහත්වන ඉරුදින**<br>(කොළ) හබකුක් 1:2-3,3:2-4<br>ගීතාවලිය 95:1-2,6-9<br>2 තිමෝති 1:6-8, 13-14<br>ලූක් 17:5-10 |

# ආත්මාර්ථයෙන් මිදී අසල්වැසියාට සංවේදී වෙමු




## සාමාන්‍ය සමයේ 26 වන ඉරුදින

**අද දින සුවිශේෂය ලාසරස් සහ ධනවතා උපමාව අප වෙත ඉදිරිපත් කරයි.**

මනුෂ්‍යයන් වශයෙන් අප සියලු දෙනාම කැමතියි සැප සම්පත් වලින් පූර්ණ වී සතුටින් ජීවත් වන්නට. මෙයයි අපි කවුරුත් දන්නා ලෝක සත්‍යය. අප ජීවත් වන සමාජය තුළ අපගේ සෑම සිතුවිල්ලක්ම, සෑම ක්‍රියාවක්ම හා අප කරන සියලුම වැඩකටයුතු වල මූලික අරමුණ හා පරමාර්ථය වන්නේ ද එයයි.

මේ හේතුව නිසාම අප කිසියම් වැඩකටයුත්තක් හෝ රාජකාරියක් කරන සෑම අවස්ථාවකදීම අප උත්සාහ කරනුයේ එය උපරිමයෙන් කර කෙලෙස හෝ ඉදිරියට යන්නටයි. පවුල තුළ වේවා, පාසල තුළ වේවා, දේවස්ථානයේ සමිති සමාගම් වල වේවා, මීසම තුළ වේවා, කාර්යාලයේ වේවා මේ සියලුම අවස්ථාවල දී අප උත්සාහ කරනුයේ කිනම් හෝ ආකාරයකින් තමන්ව උසස් කරගන්නටයි.

එය වරදක් නොවෙයි. නමුත් එය වරදක් වන්නේ එම ක්‍රියාව කරන මොහොතේ අප තුළ තිබෙන සිතුම් පැතුම් අනුවයි. අපි අපගේ ඉලක්කය කරා යන්නේ කෙලෙසද යන කාරණාව අනුවයි. අපේ දියුණුව තකා ක්‍රියා කරන අවස්ථාවන් වලදී අප උත්සාහ කරනුයේ කොහොම හරි මගේ වැඩේ කරලා ඉදිරියට යන්නටයි. එවැනි අවස්ථාවන් වලදී අපි බොහෝ දුරට ආත්මාර්ථකාමී වන අවස්ථා ද අනන්තයි, අප්‍රමාණයි. අන් අය කෙරෙහි සංවේදී නොවන අවස්ථා ද එමටයි. අපි බොහෝ දුරට අනෙකාව නොසලකා හරිනවා. පහත් කොට සලකනවා. මේ සියලු දේට අන් අය කෙරෙහි සංවේදී නොවීමේ ප්‍රතිඵලයක්.



මේ පිළිබඳව අද පළමු කියවීම තුළ සහ ශු. සුපුවත තුළ මනාව අපට පැහැදිලි කර දෙනවා. අනෙකා කෙරෙහි සංවේදී වන්නට ඇරයුම් කරනවා. එම නිසා තමයි අද පළමු කියවීම තුළ ආමොස් තුමා අපට අභියෝග කරන්නේ. එතුමා අභියෝග කරනුයේ පොහොසත්, සැප සම්පත් තිබෙන ජනතාවට නොවෙයි.

නමුත් අනෙකා කෙරෙහි සංවේදී නොවන තමන්ගේ සතුට වෙනුවෙන් අනෙකා නොසලකා හරින ජනතාවටයි. එලෙසම අද ශු. සුපුවත තුළ ධනපතියා සහ ලාසරස්ගේ කතා පුවත තුළින් අපට ආරාධනා කරනුයේ ද අනෙකාට සංවේදී වන්නටයි.

සුවිශේෂය තුළ අපට පැහැදිලිව පෙනී යනවා ලාසරස් කියන පුද්ගලයාව ගෙනත් තබනවා ධනපතියාගේ වැරැද්ද ඔහුට පැහැදිලි කර දෙන්නට. මෙහි සඳහන් වන්නේ නැහැ ලාසරස් පැමිණියා කියා. නමුත් ඔහුව ගෙනත් තබනවා. එය දේව සැලැස්මක්. නමුත් ධනපතියා අපොහොසත් වනවා ඔහුගේ දුර්වලතාවය වටහා ගන්නට. ධනපතියා තමන් ගැන පමණක් සිතන නිසාම ලාසරස් කෙරෙහි අසංවේදී වෙනවා.

තමන් සතු දේ බෙදා හදා ගන්නට අපොහොසත් වෙනවා. අපි මේ ජීවත්වන සමාජය තුළත් අප කරන නොයෙක් වැඩකටයුතු වලදී දෙවියන් වහන්සේ අප ඉදිරියේ නොයෙක් පුද්ගලයින්ව, ගමන් කරවන්නට අවස්ථා අප ඉදිරියේ තබනවා. ඒ අපව නිවැරදි මාර්ගයට ගන්නටයි. නමුත් අපි ඒ ගැන කෙතරම් දුරට සංවේදී වෙනවා ද?

අද දින සුපුවත පවසන අන්දමින් මේ ලෝකය තුළ කෙතරම් උසස් ලෙස ජීවත් වූවත් අන් අය පිළිබඳව සංවේදීතාවයක් අප තුළ නැතිනම් අපටත් ධනපතියා මෙන් මරණයෙන් පසු සිදුවන්නේ දුක් විඳීමටයි. මෙලොව ඇති සැප සම්පත් මත අප ජීවිත රඳවා නොගෙන අනෙකා වෙනුවෙන් කැපවී ජීවත් වීම දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමකි.

✍ ජාතික දෙව්සත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ
**ගරු සෙබස්තියන් සුදර්ශන් සහෝදරතුමා**

# මරිය වසරේදී සෑම කතෝලික නිවසකට දේවමාතා ප්‍රතිමාවක්



**කතුතුමනි,**

ආගමන කාලයේදී මරිය වසර ප්‍රකාශයට පත්කැරේ. කතෝලික පවුල් ඇඩි ගෞරවයෙන් දේවමාතා ප්‍රතිමාවක් තබා මල් පහන් පුදා ජපමාලය උච්චාරණය කරති.

බොහෝ නිවෙස්වල දේවමාතා ප්‍රතිමා නොමැත. පුංචි දේවමාතා පින්තූරයක් තබාගෙන දෙව්මව් යදින අයුරු දැක දැක්කෙමි. විශේෂයෙන් මුහුදුකරයේ ධීවර පැල්පත්වල මෙම දසුන දැකිය හැකි අතර ගමේ නගරයේ කියාද වෙනසක් නොමැත.

මේ මරිය වසරේදී සහා ශ්‍රේෂ්ඨ උතුමාණන්ගේද මීසම් සේවක ගරු පියතුමන්ගෙ 'ද උපදෙස් ලබාගෙන ඇති හැකි අය බරපැන දරා සාමාන්‍ය ප්‍රමාණයේ දේව මාතා ප්‍රතිමාවක් සෑම කතෝලික නිවසකට බෙදාදීමට කටයුතු කරන්නේ නම් අරුත්බර යැයි මට සිතේ. එය විශේෂ ආසිරි ගැන්වීමකට ලක්කර මරිය වසරේ සිහිවටනයක් ලෙස මෙන්ම මරියතුමියට කරනු ලබන උපහාරයක් හා ගෞරවයක්ද, ලෙස ලබාදියහැකි නම් ඉතා වටනේය.

**රෝයල් ප්‍රනාන්දු**
රද්දොලුගම

# මරියතුමිය මගින් ප්‍රශ්නවලට විසඳුම් ලබාගනිමු

**කතුතුමනි,**

ඉදිරියේ ඇරඹෙන ආගමන සමයත් සමග මරිය වසර ප්‍රකාශයට පත්කිරිමට නියමිතය. වර්තමානයේ අප රටේ ඇතිවී තිබෙන විවිධ අර්බුද ප්‍රශ්න යනාදියට මරිය තුමිය වෙතින් පිළිසරණ ලබාගත හැකි මාර්ග යකි ඇත අතීතයේදී ජපනුන් ලංකාවට බෝම්බ හෙලීමේදී එම විපතින් රට බේරාගැනීමට හැකිවූයේ මරිය වහන්සේට කන්නලව් කිරීමෙනි.

ධීවර ජනතාවගේ ඇවෙන ප්‍රශ්න, ගොවි ජනතාවගේ ප්‍රශ්න, වන අලින්ගෙන් සිදුවන හිරිහැර කරදර වලින් ගැලවීම, බීමට පිරිසිදු ජලය නොමැතිව පීඩා විඳින ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාග ැනීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවී තිබෙන ගැටලු, ඌ කියා නොමැතිකමින් අසහනයට පත්වී සිටින තරුණ තරුණියන්ගේ ප්‍රශ්න විනාශකාරි මත්ද්‍රව්‍ය වලින් අප ජනතාව ඇතුළු දරුවන් බේරාගැනීම, ලිංගික අපරාධ හා විවිධ දූෂිත ක්‍රියා නිසා හිරිහැරයට පීඩාවට පත්වන තරුණ තරුණියන්ට හා අනෙකුත් ජනතාව එයින් බේරා ගැනීම, විවිධ ප්‍රශ්න නිසා භේද භින්න වී ඇති හා දික්කසාද වීමට වෙර දරන පවුල් බේරා ගැනීම. මේ ආදි ප්‍රශ්න රාශියක් වර්තමානයේ අප රටේ පැන නැඟී ඇත.

මේ සියල්ලට විසඳුම් ලබාගැනීමට මරියවහන්සේ තුළින් දෙවි මහෝත්තමයාණන්ගෙ න් පිහිට ආශිර්වාදය බලය ලබාගත යුතුමය. ඒ සඳහා අප ආදර අම්මා දේව අම්මා අපගේ මැදිහත්කාරිය වනු ඇත. අවශ්‍යවනුයේ අපගේ අයැදීම් කන්නලව් ඇය වෙත ඔප්පු කිරීමය. විශ්වාසයෙන් යුතුව ඇයගේ පිහිට අයැදීමය. එතුමිය අපගේ එම සියලු ප්‍රශ්නවලට විසඳුම් දෙවි පියාණන් වෙතින් ලබාදෙනු ඇත.

**කේ. නිහාල් ප්‍රනාන්දු**
බෝලවත්ත

# මරිය හමුදා කතුවැකියට තුති!

**කතුතුමනි,**

"මරිය හටයන් උඩ පැන හඬ නඟා නළල් තල බිම තලා ගන්නෝ නොවෙති" යැයි සැප්තැම්බර් 01 ඉරුදින 'ඥානාර්ථ ප්‍රදීපය' කතුවැකියේ සටහන ගැන මරිය හටයකු වශයෙන් කර්තෘ පියතුමාට මම ප්‍රශංසා කරමි.

කතුවැකියේ සිරස සඳහන් වී තිබුණේ "මරිය හමුදාව බලගතුම ගිහි අපෝස්තලික සංවිධානය" යනුවෙනි. ඒ වගේම තව යමක් කිව යුතුය. අපගේ සේවාවන් දේවස්ථානයේ රැස්වීම්වලට පමණක් සීමා නොවේ. අප නිවෙස් බැහැදැකීම් වලින් එම පවුල්වල ප්‍රශ්න සාකච්ඡා තුළින් විසඳුම් ලබාදීමද අපගේ අරමුණයි. ඒ වගේම ජනවන්දනා කටයුතු සූදානම් කිරිම දෙව් මව්ට අදාල සියළු මංගල්‍ය සංවිධාන සූදානම් කිරීම ආදියටද උරදෙන්නෙමු. මරිය හමුදාව මීසමක බලගතු ගිහි දූත සේවාවකි.

**රන්ජිත් කුරේ**
මොරටුව

# තේවත්තේ මංගල්ලයදා බස් ගාස්තුව හිතූමතේ වැඩිකරලා !

**කතුතුමනි,**

ප්‍රසුගියදා රාගම තේවත්ත ශ්‍රී ලංකා අපස්වාමිදුගේ ජාතික බැසිලිකා සිද්ධස්ථානයේදී පැවැති වාර්ෂික සුවදානයේ මෙහෙයට දිවයිනේ සතර දිග් භාගයෙන් පැමිණි ජන ගඟ වක්කඩක් කැඩුවාක් විලස සිද්ධස්ථානය අවට වැලිදැමුවාත් බිම නොවැටෙන පරිදි රැඳී සිටියහ.

මෙදින සිද්ධස්ථාන පරිපාලක ගරු ප්‍රියජයමාන්න පියතුමන් විසින් ගරු පූජක, පැවිදි ගිහි කමිටුව හා අත්වැල් බැඳගෙන මෙම ආගමික උත්සවය මැනවින් සංවිධානය කර තිබුණත් කතෝලික මෙන්ම අන්‍ය ආගම් ලබ්ධිකයන් මෙම සිද්ධස්ථානයට සුව සහනය පතා ආගමනය වීමේදී ලංකා ගමනා ගමන සේවයෙන් සිදුවු අකටයුතුකමක් නිසා ජනතාව බෙහෙවින් කළකිරීමකට පත්ව සිටියහ.

රාගම නගරයේ සිට තේවත්ත අප ස්වාමිදුගේ සිද්ධස්ථානය පුද බිමට ලඟාවීමට වෙනදා එක් අයකුගෙන් රුපියල් 12/= ගමන් ගාස්තුවක් අයකරන අතර මෙදින රාගම සිට තේවත්ත පුදබිම සමීපයට යෑමට රුපියල් 15/= ක් අයකරගෙන ඇත. මගීන් ඒ ගැන කොන්දොස්තර මහතුන් ගෙන් ප්‍රශ්න කිරීමේදී වෙනදාට රු. 12/= තමයි නමුත් අද රුපියල් 15/= ක් අයකරන්නේ ඉහළින් ආ ඕඩරයක් අනුව යයි පවසා ඇත. මෙම අසාධාරණ ගසා කෑම ගැන සත්‍ය අසත්‍යතාවය සොයාබැලීමට කතෝලික බැතිමතකු වන මොහාන් මෝසස් මහතා මේ ගැන අදාල වගකිවයුතු බලධාරීන් කිහිප දෙනෙකුට ඔහුගේ ජංගම දුරකථනයෙන් කරුණු විමසීමේදී ඔවුන් ගොළුවත රැකි බැව් පැවසේ.

සාමාන්‍යය දවස්වල නියමිත බස්ගාස්තුව ජාතික සිද්ධස්ථානයක මංගලෝත්සව දිනවල වැඩියෙන් අයකරන්නට හේතු කවරේද? මෙය කිතුනු ජනතාව අවතක්සේරුවකට පත් කිරීමක්. වගකිව යුත්තන්ගේ අවධානයට වහා යොමුවිය යුතුය.

**ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා**
කළුඑළිය

# දරු පරපුර නොමග යෑමට ජනමාධ්‍යද වගකිව යුතුයි

**කතුතුමනි,**

රටක උතුම් වස්තුව ළමා පරපුරයි. ජීවනාලිය තරුණ දූ පුතුන්ය. සෑම වසරකම ඔවුන් වෙනුවෙන් ළමා දිනයක්, යොවුන් දිනයක්, පැවැත්වූවත් සභ්‍යත්වය, සදාචාරය, ගුණදම් අතින් පිරිහුනු සමාජයක, අද ඔවුන්ට ජීවත්වීමට සිදුවී ඇති බව පිළිගත යුතු සත්‍යයකි.

අද අපේ දූ දරුවන් නොමඟ යවන්නේ අද පවතින සමාජයමය. අද ඇතැම් ජාවාරම් කරුවන්ගේ අතකොළු බවට පත්වී සිටින ඇතැම් පිරිස් අපගේ දූ දරුවන්, දූෂිත ව්‍යාපාරයන් සඳහා පොළඹවා ගන්නට දරණ වෑයම ගැන, නිතර නිතර අසන්නට ලැබුනත්, ඒවාට එරෙහිව නැගී සිටින අයව මර්දනය කරන්නේද, ඒවාට අනුබල දෙන්නේද, රටේ වගකිව යුතු නිලතල දරණ පුද්ගලයන් බව ජනතාවගේ මතයයි. හොරාගේ අම්මාගෙන් පේන අහනවාසේ ප්‍රශ්නයන්ට විසඳුම් ලබාදිය යුත්තේ ඔවුන්ම නොවේද? අපගේ දූ දරුවන් නොමඟ යවන්නේ පුද්ගලයන්ම පමණක් නොවේ.

ජනමාධ්‍ය මගින්ද අද දරුවා නොමඟට යොමුවන බව කවුරුත් දන්නා කරුණකි. එපමණක් නොව, අද චිත්‍රපට ශාලාවල දරුවන්ගේ මනස වියවුල් කරන රූප රාමුය. වැඩිහිටියන්ටවත් බැලීමට නොහැකි රූපරාමු තුළින් චිත්‍රපටයේ අන්තර් ගතවන දේ ප්‍රකාශ වේ. පාසල් යන දරුවන් ඒවා නොබලා සිටිනු ඇත්ද? දරුවන් චිත්‍රපටය නොබැලුවාට එම රූපරාමුව, දරුවාගේ මනස වියවුල් කිරීමට හොඳටම ප්‍රමාණවත් නොවේද? ඒ එකකි,

රූපවාහිනියේ සමහර නාලිකා මගින් විකාශය වන වෙළඳ දැන්වීම්ද දරුවාගේ දඩබ්බරකම්, අකීකරුකම්, උළුප්පා දක්වන සුළුය. එමගින් කියැවෙන ඇතැම් වචන කට පාඩම් කර ගන්නා දරුවා එම වචන පාවිච්චි කරමින් තම මව්පියන්ට, වැඩිහිටියන්ට එකට එක කීමට පවා පුරුදු වී සිටීම කණගාටුදායක. ඇතැම් වෙළඳ දැන්වීම් වල පෙනී සිටින දරුවන්, ආහාර අනුභව කරන සැටි දැකීම පවා අප්‍රිය සහගතය.

කුඩා කල සිටම යහපත් චර්යාවක් ඇතිව, විනයග රුකව, දරුවන් හදාවඩා ගැනීමට එදා අපේ මව්පියෝ සමත් වූහ. එහෙත් අද රූපවාහිනිය මගින් පෙන්වන මෙවැනි දර්ශණ නිසාත් අසභ්‍ය චිත්‍රපට, වෙළඳ දැන්වීම් නිසාත් සාරධර්ම ගුණාංගයන් අපේ කිරි සප්පයන් තුළ ඇතිකරන්නට හැකිවේද? සමාජය ගැන කිසිත් නොදන්නා ළමා ළපටින්ගේ මනස වියවුල් කරන්නේ වැඩිහිටියන්ම නොවේද?

එමෙන්ම, රූපවාහිනියේ ඇතැම් නාලිකාවල විකාශය කරන ටෙලි නාට්‍ය බොහෝ විට කිසිදු හරයක් නැති ඒවාය. විවාහ දිවියේ උත්තරීතර බවට නිගා දෙමින් ගෙතුණු කතා බොහෝ විට විකාශය වන අතර එමගින් සමාජයට දෙන පණිවුඩය කුමක්දැයි වටහා ගත නොහැක. මේවා දකින තරුණ පරපුර විවාහයේ සැබෑ අරුත වටහා ගන්නවාට වඩා එය සැහැල්ලුවට ලක්කිරීමට යොමුවුවහොත්, ඒවාට වගකිව යුත්තෝ කව්රුද?

ජනසංනිවේදනය භාරව වගකිව යුතු උසස් නිලධාරින් පිරිසක් අප රටේ සිටියත්, ඔවුන්ට මේ රූපවාහිනිය තුළින් සිදුවෙන දරුවන්ගේ අධ්‍යාත්මික විනාශය පෙනෙන්නේ නැත. සමහර විට එම වරද පෙන්වන තැනැත්තා වරද කරුවකු විය හැකිය. අපගේ දූ දරුවන් නොමඟ යවන්නන් පමණක් නොව, ඒ සඳහා අනුබල දෙන සෑම මාධ්‍යයක්ම මතු පරපුරේ අනාගතය ගැන වග උත්තර කරුවන් බව අමතක නොකළ යුතුය.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**
දියලගොඩ

**ඉකුත් සතියේ එඬේරමුල්ල බර්නාඩ් පී දාබරේ මහතා ලියූ ලිපියේ සිරස 'විදුලි සංදේශ නියාමන කොමිසමට පැමිණිල්ලක්' ලෙසංශෝධනය විය යුතු බව කරුණාවෙන් සලකන්න.**

# ලන්තෑරුම් එළියෙන් දෙවිඳුන් යදින බැතිමතුන්

**කතුතුමනි,**

ශ්‍රී ලංකා ඒකීය රාජ්‍යය තුළ මිනිසකුට ඕනෑම ආගමක් ඇදහීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදය තුළ හිමි වේ. "බෞද්ධ හෝ වේවා කතෝලික හෝ වේවා අන්‍යාගමිකයන්ට ද කිසිදු බාධාවකින් තොරව ඇදහීමේ නිදහස දිය යුතුය" යන්න අපේ ජනාධිපති තුමා නිතර පවසන දෙයකි.

එහෙත් එවැනි මතයක් දරණ රටක පන්නල ප්‍රාදේශීය සභාවට අයත් හෙණ්ඩියගල දෙව්මැඳුරට විදුලිය ලබාගැනීමට වසර 03 ක් පුරා බලාසිටින්නට සිදුවී ඇත්තේ කාගේ හස්තයට යටවීද? 2012.11.17 වන දින සිට දවස් 21 පුරාවට මළවුන්ගේ දානය සඳහා තාවකාලික විදුලිය ලබාගැනීමට හැකිවීම පිළිබඳව මහෝත්තම දෙවිපියාණන්ට ස්තූති කර සිටිමි. මේ වනවිටත් ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා විසින් බෞද්ධ සහ ආගමික කටයුතු අමාත්‍යාංශයට විදුලිය ලබාගැනීමට අවශ්‍ය ලිපි කටයුතු ලිඛිතව පන්නල ප්‍රාදේශීය ලේකම්තුමියට ලබාදී ඇති නමුදු අනුමතිය ලබාදීම දිනෙන් දින කල්යාමේ ප්‍රවණතාවය වැඩි වේ. කෙසේ වෙතත් කිතුනුවන්ගේ පුද්ගලික දායකත්වයෙන් ලන්තෑරුම් සහ පොල්තෙල් පහන් දල්වමින් දෙවිඳුන් යදිමින් රාත්‍රිය පුරාවට යාච්ඤා මෙහෙයන් පවත්වති. මෙම දේවස්ථානයට බැතිමතුන් විශාල පිරිසක් පැමිණෙති. එහෙයින් විදුලිය ලබාගැනීමට යම් පියවරක් ගත හැකිනම් බැතිමතුන්ට විශාල සහනයකි.

**ප්‍රින්සි රංජනී-** විලගෙදර



ද්ශය

කරුණක් නොවේ.
ශාන්ත සභාවේම ජීවය හා
. ධර්මෝපදේශය දීම
මෙස්ත සදාතනික දේව
ත්වය තුළ පූර්ණත්වයට
න් නිර්වචනයක් ලෙස

ක්‍රිස්තුන්වහන්සේ වෙත
වේ. එපමණක්ද නොව
හා සමග
සුහදතාවයක් ජනිත කිරීම

ර්ෂේත්‍රය විය යුත්තේ
හා දේව පුත්‍රයාණන් වන
ය. ධර්මෝපදේශය
කාලයේ සලකුණු තේරුම්
දුන් VI පාවුලු
ශාවන්ත II ජුවාම් පාවුලු
ගේ ඉතා අද්විතීය

අවසන් වී වසර 20කට
ධර්මෝපදේශය භාග
ාවුලු ශුද්ධෝත්තම පියතුමා
තිරසාර විශ්වීය ග්‍රන්ථයක්
මහි ප්‍රධාන අරමුණු වූයේ
නොව දේව ජනතාව දේව
රීමයි. මේ නිසාවෙන්
ලයේ සිදුවීම් මාලාවට
බව නොරහසකි.
ලැබෙන නම්‍යතාවය හා
ට ජාතික හා පදවි
අනුව එය සකසා ගැනීමට
වැදගත්වේ.
රගකාරීබව, ක්‍රමවේදය
යොමු කිරීම වර්තමානය
ලංගුවී ඇත.

ක්‍රිස්තු කේන්ද්‍රීය දැක්ම
සංසදයේ සිව්වැනි පොදු
මුවීම එක් මංසන්ධියක්
පසුව මෙය මානව
ඒමෙන් කාලයේ සලකුණු
මංගගතවීමට සාක්ෂි දැරූ
යේ එය තවදුටත්
ද්‍රිය වී ඇත. නූතන
න උසස්ම වගකීම වනුයේ
වැඩිහිටියන්ට නූගතුන්ට
යන් නාඳුනන සැමට දේව

ථා කිරීමේදී ඒ සඳහා
වේදයන් වල
ව විද්වත් මතයයි.
කාරී වේගවත් ගමනක
මෝපදේශය ගොඩනැගීම
මේ ක්‍රමවේදය උපකාරීවේ.
ශයට ආවේණික සැලැස්ම
මන් අද ද දැකීම සතුටුවිය
න්ත්‍රණ" සභාවේ සම්මත
කොටස් පිළිබඳව අවධානය
ශ්වාසයේ ජීවිතය, දේව
සහ යාච්ඤාව පිළිබඳව ද

හැන්විය හැකිය. එහෙත්
යෙහිලා ප්‍රථම හා අතී
ව පැහැදිලිය. ප්‍රසාද
ම පන්නරය ලබන කිතුනු
වශයෙන් කාණ්ඩ වූවත්
දේව ආදරය බෙදා දීමයි.
ක්තිමත් වන්නේ, වඩාත්
ව ආදරය ප්‍රකාශවන
පැහැදිලිව හේතු සාධකව

නය" දීම සඳහා වගකීම
ප්‍රයත්නය එදා මෙන් අද
ප්‍රීති විය යුතුය. ශූර ගිහි
ශූර පැවිදි ධර්මෝපදේශක
තා වෙහෙසක් දරමින්
ට පත්වෙමින්, මග
මිල සේවාව අගය කළ

*ැන ගැනීමට අනාගතයේදී*
*!*

# එකසිය විසි පස් වසරක් පුරා දිග හැරුණු වැඩිහිටියන් හට උවටැන් කිරීමේ









කිතු උපතින් වසර දෙදහස් දහතුනක් ගත වන මෙම වසරේ උඳුවප් මස අට වැනි දින, තවත් අසමසම උපතක් සැමරේ. ඒ නම්, එකසිය විසිපස් වසරකට පෙර, දිළිඳු වැඩිහිටියන් හට උවටැන් කිරීමේ ඒකායන අදිටනින්, දිළිඳුන්ගේ කුඩා සොහොයුරියන්ගේ නිවාසයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීම යි. "අපේ කාලයට සරිලන සාන්තුවරිය" යන විරුදාවලියෙන් හැඳින්වෙන ජාන් ජුගාන් සාන්තුවරිය විසින් අරඹන ලද මෙම පැවිදි නිකාය මේ වන විට රටවල් 31 ක් තුළ විහිදුනු නිවාසයන් 191 කින් සමන්විත වෙන නමුත්, එහි ආරම්භය ඉතා සුළු විය. ඔවුන්ගේ නිවාසය හා එය ඉදි කෙරුණු බිම හැරුණු කොට දේව සංරක්ෂණය මත යැපෙන මේ කුඩා සොහොයුරියන් සතුව වෙනත් කිසිදු වස්තුවක් නැත. ඔවුන් කිසිදු තැනක ආයෝජනයක් කර නොමැත; එහෙත් නේවාසිකයන්ගෙන් ද කිසිදු මුදලක් අය නොකෙරෙයි. ගෙයින් ගෙට හිඟමනේ යන ඔවුන් යැපෙන්නේ පිනට දෙන දෙයින් හා පරහිතකාමී හිතවතුන්ගෙන් ලැබෙන ආධාර වලිනි.

### මූලික අඩිතාලම

ප්‍රංශ විප්ලව සමයේ දී ප්‍රංශයේ කැන්කේල් නුවර දිළිඳු පවුලක දැරියක ලෙස 1792 වප් මස 25 වන දින, ශු. ජාන් ජුගන් තුමිය මෙලොව එළිය දුටුවා ය. ඇගේ වයස යන්තම් අවුරුදු තුනහමාරක් වන විට මසුන් අල්ලන්නකු වූ ඇගේ පියා දිනක් මුහුදු ගිය නමුත් ආපසු පැමිණියේ නැත. ඇගේ ළමා කාලයත් තරුණ කාලයත් ගෙවී ගියේ දුක් කම්කටොළු කන්දරාවක් මැද ය. දහ අට වන වියේදී කැන්කේල් නගරයෙහිම විසූ එක්තරා නාවිකයකු ඇයට විවාහ යෝජනාවක් ගෙනා විට ඇය මෙසේ පිළිතුරු දුන්නා ය. "තමන් වහන්සේගේ ම සේවය සඳහා දෙවියන්වහන්සේට මා අවශ්‍ය වී ඇත. මෙතෙක් හෙළි නොකරන ලද, මෙතෙක් නොඅරඹන ලද කාර්යයක් සඳහා ඔවුන් වහන්සේ මා වෙන් කොට තබා සිටින සේක."

### නිකාය ආරම්භ කිරීම

1839 වසරේ ශීත සෘතුවේ එක් දිනක දේව කැමැත්තට අවනතව ඇය ස්ථිර පියවරක් තැබුවාය. ඇගේ ජීවිතය මෙන්ම තවත් සිය දහස් ගණනකගේ ජීවිතයන් උඩු යටිකුරු කිරීමට ඇගේ එම පියවර හේතු යුක්ත විය. හිසට සෙවනක් නොමැතිව අසරණ වූ ඈන් නම් වූ අංගභාගි, අන්ධ, මහළු කාන්තාව ඇයට හමු වූ දින ඇගේ ජීවිතය තවදුරටත් ඇය සතු නොවන බව ඇයට ඒත්තු ගැන්විනි. තමා කුලියට ගත් කාමරයට නගින කවාකාර තරප්පු පෙළ දිගේ ඈන්ව ඔසවාගෙන ගොස් තම සයනය මත තබා, තමන්ගේ ම කෑම වේල ඇය සමඟ බෙදාගෙන කෑ එම මොහොතේ, එය දිගු ගමනක ආරම්භය පමණක් බව ඇයට අවබෝධ විය. "මේ දෙවියන් වහන්සේගේ කාර්යයකි; එතුමෝ අප හට සරණය වන සේක" (ජාන් ජුගාන්)

ඇය කළ දේ ක්ෂණිකව හටගත් කාරුණික හැඟීමකින් ඇති වූ ආවේගයක් හේතු කොට කළ ක්‍රියාවක් නොව ආපසු නොහැරෙන ගමනක ආරම්භය බවත්, මහළු කාන්තාව වෙතට නැඹුරු වූ මොහොතේ තමන් මෙතුවක් කල් සොයමින් සිටි දේ තමාට සම්භ වූ බවත් ඇයට දැනුණි. දේව කැඳවීම" හඳුනා ගත් එදින කිතුනු අපෝස්තලික ක්‍රියාවලිය සඳහා පරිපූර්ණ ලෙස ඇය කැප වූවාය. තම දැතින් ඔසවාගෙන යනු ලබන්නේ ස්වාමිදරුවන් වන ජේසුස් වහන්සේව බව ඇය දැන ගත්තා ය. පසු කලෙක ආධුනික සොහොයුරියන් හට ඇය පැවසුයේ "යාච්ඤාවෙහිදිත්, සංඝය තුළත්, දුප්පත් අසරණයන් තුළත් ඔබට ක්‍රිස්තුන් වහන්සේ මුණ ගැසෙනු ඇත" කියා ය.

ජාන් ජුගාන් තුමියගේ ජීවිත කාලය තුළදීම යුරෝපයේත් උතුරු අප්‍රිකාවේත් ඇමරිකා එක්සත් ජනපදයේත් කුඩා සොහොයුරියන්ගේ නිවාස රැසක් ආරම්භ කෙරිනි. 1879 වසරේ ප්‍රංශයේ සාන්ත පර්න් හි පිහිටි මව් ආරාමයේ ඇය ස්වර්ගස්ථ වන විට යුරෝපයේ ඇමරිකාවේ හා අප්‍රිකාවේ රටවල් 10 ක දිළිඳු වැඩිහිටියන් හට ඇප උපස්ථාන කරන කුඩා සොහොයුරියන්ගේ සංඛ්‍යාව 2400 ක් විය. ඔවුන්ගේ නිකාය ධර්මදූතික මෙහෙය වෙත සැබැවින්ම අවතීර්ණ වූයේ 1882 වසරේ නොවැම්බර් 30 වන දින ඉන්දියාවේ කල්කටාවේත්, 1888 වසරේ ශ්‍රී ලංකාවේ කොළොම්පුරයේත් නිවාසයන් ආරම්භ කිරීමත් සමඟ ය.

### දිළිඳුන්ගේ කුඩා සොහොයුරියන් ශ්‍රී ලංකාවට සැපත් වීම හා නිවාසයක් ආරම්භ කිරීම

1888 නොවැම්බර් 18 වන දින කුඩා සොහොයුරියෝ සත් දෙනෙක් ප්‍රංශයේ සිට ඔක්සස් නෞකාවෙන් කොළොම්තොට බලා පිටත් වූහ. ඔවුන් කොළඹට ළඟා වූයේ දින විස්සකට පසු 1888 දෙසැම්බර් මස 7 දා ය. එවකට පිටකොටුව දේවස්ථානයේ මීසම් සේවක පියතුමා විසින් ඔවුන් පිළිගෙන අගරදගුරු අතිඋතුම් ක්‍රිස්ටෝෆර් බොන්ජීන් තුමා නේවාසිකව සිටි, කොටහේනේ සා. ලුසියා ආසන දෙව්මැඳුර වෙත කැඳවාගෙන යන ලදී. කුඩා සොහොයුරියන්ගේ නිවාසය මරදානේ ඩාලි පාරේ පිහිටුවනු ලැබීය. මුල් වසර සඳහා නිවාසයේ කුලිය සහ නඩත්තුව වෙනුවෙන් බරපැන සැපයූයේ මෝල්ටා ජාතික වෙළෙඳ ව්‍යාපාරිකයකු වූ අසිපාර් මහතා විසිනි. ප්‍රංශයේ සිට කොළඹ දක්වා ඔවුන්ගේ නැව් ගාස්තු ගෙවන ලද්දේ ද ඒ මහතා විසිනි.

1888 දී නිවාසය පිහිට වූ අවස්ථාවේ දී රැස්ව සිටි පිරිස අමතා අගරදගුරු බොන්ජීන් හිමිපාණෝ මෙසේ පැවසූහ. "කුඩා සොහොයුරියන් හා ඔවුන් විසින් බාර ගනු ලබන දුප්පතුන් ඔබගේ කාරුණික සැලකීමට මම බාර කරමි. ඔවුන්ගේ රැකවලුන් ලෙස හා දේව සංරක්ෂණය තුළ ඔවුන්ට අවශ්‍ය දේ සපයන්නන් ලෙසද මම ඔබ සැම පත් කරමි. එසේ කරන්නේ ඔබ විසින් ඔවුන් නොසලකා හරින ලද බව, ඔවුන්ගේ ජීවිත රටාව තුළින් පිළිබිඹු කරනු ලබන අප ස්වාමින් වහන්සේ විසින් දෝෂාරෝපණය කරනු ලැබුමට නොව, මෙලොවේ ඔබගේ ජීවිතාවසානයේ දී මෙවැනි වදන් වලින් ඔවුන් වහන්සේ විසින් ඔබ පිළිගනු ලැබීමට සුදුස්සන් බවට පත්වනු සඳහා ය. "මාගේ පියාණන් වහන්සේගෙන් ආශිර්වාද ලද්දෙනි, ලෝකාරම්භයේදීම ඔබ සඳහා සූදානම් කර ඇති රාජ්‍යය උරුම කරගන්න. මන්ද මම සාගිනිව සිටියෙමි. ඔබ මට කන්නට දුන්නහුය; පිපාසා වී සිටියෙමි, ඔබ මට බොන්නට දුන්නහුය; ආගන්තුකව සිටියෙමි, ඔබේ නිවසට මා පිළිගත්තහුය. නිර්වස්ත්‍රව සිටියෙමි, ඔබ මට වස්ත්‍ර දුන්නහුය" (මතෙව් 25:34,35,36).

සුළුවෙන් ආරම්භ කෙරුණත් ඔවුහු කෙමෙන් වැඩි වර්ධනය වූහ. "1890 දී නේවාසිකයන් 30 40 ත් අතර ගණනක් වීය. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම මේ වැඩිහිටියන් අත් විඳි ප්‍රීතිය හා සතුට සැමගේ ඇගයීමට පාත්‍ර විය" (බොන්ජීන් අගරදගුරු තුමන් විසින් 1890 ජූලි 31 වන දින විශ්වාස අභිවර්ධන පර්ෂදය වෙත VP VIII වන වෙළුම, 258 වන පිටුව, අංක 18) තවත් බාර ගැනීමට අපහසු තරමින් වැඩිහිටියන්ගේ සංඛ්‍යාව වැඩි වූ විට, 1893 දක්වා කුලී පදනම මත සිටි භූමිය රු. 30000 ක මුදලකට සින්නක්කරව ගන්නා ලදී. අක්කර පහක් පමණ වූ මේ ඉඩම මිලදී ගැනීමට ණය වීමට සිදු විය. එම වසරේ ම අගෝස්තු මාසයේ දී රු. 10500/- ක් වැය වෙතැයි ඇස්තමේන්තු කරන ලද ගොඩනැගිල්ල තැනීම ආරම්භ කෙරිනි. ඊළඟ වසරේදී නව අගරදගුරු මැලිසන් මාහිමිපාණන් නිවාසය වෙත පැමිණ එය ආශිර්වාද ගැන්වීමට පෙරාතුවම එම ගොඩනැගිල්ලට ගෙවැදී තිබිණි. ඒ වන විට කන්‍යා සොහොයුරියන් 10 දෙනකුගේ රැකවරණය ලබමින් සිංහල දෙමළ හා බර්ගර් ජාතින්ට අයත් වැඩිහිටියන්ගෙන් සමන්විත වූ පිරිසක් එහි වූහ.

### කොළඹ පිහිටි සාන්ත මේරි නව නිවාසය

මරදානේ නිවාසය පවත්වාගෙන යනු ලැබූ, වසර සියයකටත් වඩා පැරණි ගොඩනැගිලි සංකීර්ණය, කාලයාගේ ඇවෑමෙන් ගරා වැටී වාසයට නුසුදුසු තත්ත්වයට පත් වීය. එහෙත් නැවත වරක්, දේව සංරක්ෂණය කෙරෙහි කුඩා සොහොයුරින් තබන විශ්වාසය තුළින් අවශ්‍ය ගොඩනැගිලි සංකිර්ණය ඔවුනට ලැබිණි. නවීන පන්නයේ මෙම ගොඩනැගිල්ල නවීනතම අංගෝපාංගයන්ගෙන් සමන්විත වේ. දෙවියන් වහන්සේගේ නාමයෙන් රැකබලා ගනු ලබන නේවාසිකයන් හට සුබෝපභෝගීව දිවි ගෙවීමට එහි පහසුකම් ඇත. අසරණයන් වෙනුවෙන් කරනා දේ දෙවියන් වහන්සේටම කරන බව අදහා සිටින කුඩා සොහොයුරියෝ, හැකි උසස් ම අයුරින් ඔවුන් හට ඇප උපස්ථාන කරති. උසස් ම දේ හැර වෙනත් කිසිවක් ඔවුන් වහන්සේට පිරිනැමීම ඔවුන්ට කළ නොහැකිය.

2004 දෙසැ. 18 දින කොළඹ අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසින් නව නිවාසය ආසිරි ගන්වා විවෘත කරන ලදි.

### දිළිඳුන්ගේ කුඩා සොහොයුරියන් විසින් සිදු කරනු ලබන සානුකම්පිත සේවාව

අද වන විට නොයෙකුත් ආගම් හා ජාතින්ට අයත් වැඩිහිටියන් 98 දෙනකු පමණ කොළඹ නිවාසයේ සිටිති. පැවිදි සොහොයුරියන් 16 දෙනෙක් මෙම නිවාසයේ කටයුතු කරන අතර ජාන් ජුගාන් සංගමයේ සාමාජිකයන් හා වැටුප් ලබන සේවකයෝ ඔවුන්ට සහය වෙති.

ශ්‍රේෂ්ඨ මව්තුමියගේ මඟ පෙන්වීම අනුව මෙම නිවසට අලුතින් ඇතුළු කර ගන්නා නේවාසිකයන් හට මෙම නිවාසයට කරදරයකින් තොරව හුරු පුරුදු වීම සඳහා සෑම පහසුකමක් ම සපයා දෙනු ලැබේ.

මුළු තැන් ගෙය බාර පැවිදි සොහොයුරිය විසින් අනෙකුත් සේවකයන්ගේ ද සහාය ඇතිව, සියළුම නේවාසිකයන් හට සම බර ආහාර පාන පිළියෙළ කර දෙනු ලබන අතර, වෛද්‍ය නිර්දේශයන්ට අනුකූලව විශේෂිත ආහාර වර්ග නිර්දේශ කෙරෙන අයගේ අවශ්‍යතාවන් ද සපුරාලනු ලබයි. අංශය බාර සොහොයුරියගේ අධීක්ෂණය යටතේ සේවය කරන රෙදි පිරිසිදු කරන අංශයේ සේවකයන් විසින්, නේවාසිකයන්ගේ ඇඳුම් පැළඳුම් සෝදා මැද දෙනු ලබයි. නේවාසිකයන්ගේ ඖෂධ අවශ්‍යතාවන් ගැන සොයා බලා කටයුතු කරනු ලබන්නේ ඖෂධාගාරය බාර සොහොයුරියගේ මෙහෙයවීම අනුව එහි සේවය කරන හෙදියන් දෙදෙනා විසිනි. එක් එක් අංශයට අනුබද්ධිත සේවක කණ්ඩායමේ සහාය ඇතිව අංශ බාර සොහොයුරියන් විසින් සෑම නේවාසිකයකුගේ ම අවශ්‍යතාවයන් පිරිමසමින් ඔවුන්ට සතුටින් හා සැප පහසුවෙන් ජීවත් වීමට මං සලසනු ලබයි.

නිවාසය හා ගොඩනැගිලි හොඳ තත්ත්වයෙන් පවත්වාගැනීම, පරිපාලනය හා ගණන් තැබීම යනාදි වැඩකටයුතු පිළිබඳ වගකීම, එම කටයුතු බාර පැවිදි සොයුරිය වෙත පැවරී ඇත.

උද්‍යාන සේවකයන් විසින් මනහර උද්‍යානයන් දැකුම්කළු අයුරින් පවත්වාගෙන යනු ලබන අතර නිදන කාමර හා පොදු ස්ථාන පිරිසිදුව තබා ගැනීමට අවශේෂ සේවක පිරිස වගකීමෙන් යුතුව කැපවී සිටිති.

### ස්වෙච්ඡා සේවයේ යෙදීමට ඔබටත් අවස්ථාවක්

ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික යන දෙයාකාරයෙන් ම අත හිත දෙන පරිත්‍යාග ශීලීන් තුළින් කුඩා සොහොයුරියන් වෙත පහළ වන දේව සංරක්ෂණය මොනවට පැහැදිලි වෙයි. කායික වෛද්‍යවරුන්, දන්ත වෛද්‍යවරුන් හා වැඩිහිටියන් සතුටින් තබා ගැනීම සඳහා නොයෙකුත් අන්දමේ වැඩසටහන් ඉදිරිපත් කරන ක්‍රියාකාරින් මෙන් ම ජාන් ජුගාන් සංගමය විසින් ද වැඩිහිටියන් හට සත්කාර කිරීම පිළිබඳ එතුමියගේ දැක්ම තව තවත් ඉදිරියට ගෙන යෑම පිණිස උපරිමව සහාය වෙති.

කුඩා සොහොයුරියන්ගේ නාම සාන්තුවරයා වන ශු. ජුසේ තුමන් කෙරෙහි ඔවුන් තුළ ඇත්තේ අනුපමේය විශ්වාසයකි. "වැඩිහිටියන්ගේ භූමිකාවට අනුබල දීමෙන් හා ප්‍රඥාවේ මූලාශ්‍රයන් මෙන් ම දයාව හා අපේක්ෂාව වෙනුවෙන් සාක්ෂි දරන්නන් සේ සලකා ඔවුන්ට සහය වීම මගින්, සභාවට හා සමාජයට වැඩිහිටියන්ගෙන් ඉටුවන අගනා සේවය සියල්ලන් විසින් අගැයීමට පාත්‍රවීමට සැලසීම යන ඔවුන්ගේ දැක්ම අනුව වසර 125 කට පෙර අරඹන ලද සේවාව නොනවත්වා ඉටු කිරීමට ඔවුන්ගේ එම විශ්වාසය අනුබලයක් වී ඇත.

ජාන් ජුගාන් තුමිය ජීවතුන් අතර අද සිටියා නම් එතුමිය කරන දෙය එනම්, "අවශ්‍ය වන්නේ වැඩිහිටියන් තෘප්තිමත් කිරීමය" යන්න ක්‍රියාවට නැංවීම, මෙම නිකායේ ඒකායන අභිප්‍රාය වෙයි.

ඔබගේ ජීවිතයට නව අරුතක් එක්කර ගනිමින් අසරණ වැඩිහිටියන්ගේ ජීවිත පණ ගැන්වීම සඳහා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වීමට ඔබ කැමති නම් කරුණාකර අපට දන්වන්න.

**දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ**
204, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

කලා සංග්‍රහය

# ශ්‍රී ලංකා කතෝලික සභා ඉතිහාසය හා බැඳුණු රදගුරු පදවි හා පැවිදි නිකායන්

**කර්තෘ - ගරු ජූඩ් දසනායක පියතුමා**
**මිල - රු. 280/=**

මෙරට කතෝලික ඉතිහාසය පිළිබඳ පතපොත කිහිපයක් මෙන් ම ලිපි ලේඛන ද පළ වී ඇතත් බ්‍රිතාන්‍ය යුගය තුළ මෙන් ම ඉන් ඉක්බිති සමය තුළ ද ඉතිහාසය එසේ ප්‍රකාශයට පත් වී නැත. මෙය අප තත්කාලීන සමාජය තුළ විශාල හිස් බවකි.

අප පාසල් තුළ ද ඉතිහාසය මෙන් ම සාහිත්‍යය ද දිගු කලක් කුඩම්මාගේ සැලකිල්ලට භාජනය වීම හේතුවෙන් සභා ඉතිහාසයට ද අහිතකර බලපෑම් ඇති නොවුවා නොවේ. මෙම තත්ත්වය අප තරුණ පරපුර තුළ මෙන් ම කතෝලික තත්කාලීන සමාජය තුළ ද ලොකු අඩුවකි. අප රටේ කතෝලික ඉතිහාසය පිළිබඳව දෙව්සත්හල් ලබා දුන් දැනුම ද කලක් දුර්වලව පැවතුණි. මෙයින් අප කතෝලික ජනතාව දත යුතු බොහෝ දේ නොදැන සිටීමේ විපාක අත්විය.

මෙවැනි තත්ත්වයන් මගහැරලීම සඳහා කලක සිට අප තරුණ පිරිස අතරින් ශාස්ත්‍රවන්ත උගතුන් කණ්ඩායමක් ඉදිරිපත් වී සිටීම සතුටට හේතුවකි. මෙම පිරිස අතර කතෝලික සභාවේ ඈත ඉතිහාසය මෙන් ම මෑත කාලය ගැන ද විමර්ශණ පවත්වන වියත්හු වෙති. අප හිතවත් බිංගිරියේ වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ගරු ජූඩ් දසනායක පියතුමා මෙම පිරිස අතර වේ. එතුමාගේ නවතම ග්‍රන්ථය "ශ්‍රී ලංකා කතෝලික ඉතිහාසය හා බැඳුණු රදගුරු පදවි හා පැවිදි නිකායන් (1505-2012)" ග්‍රන්ථයයි.

මෙම ග්‍රන්ථය සඳහා ගරු ජූඩ් දසනායක පියතුමා ඉතා වැදගත් කරුණු රැසක් පර්යේෂණ කොට සොයා ගෙන ඇති බව පෙනේ. ඈත පෘතුගීසි පාලන කාලය පිළිබඳව මෙන්ම බ්‍රිතාන්‍ය පාලන සමය තුළ කතෝලික සභාව මේ රටේ ව්‍යාප්ත වීමේ ඉතිහාසය මෙහි සඳහන් වේ. ඒ කාලය පිළිබඳව ඉතා සවිස්තරව හදාරා සටහන් කර ඇත. ඈත අතීතයේ ෆුන්කල් රදගුරු පදවියෙන් අප පාලනය වූ සැටිත් ක්‍රමයෙන් දේශීය රදගුරු හිමිවරුන් සභා පාලනය භාරගත් සැටිත්




මෙම ග්‍රන්ථය හෙළි කරයි.

ලේඛන මනා ලෙස හුවා දක්වමින්, එහි සටහන් සාක්ෂි සහිතව ඉදිරිපත් කර ඇත. මෙය පහසු ව්‍යායාමයක් නොවන බවත් ඒ සඳහා විශාල පරිශ්‍රමයක් දැරිය යුතුව තිබෙන්නට ඇති බවත් අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙත් ඒ කාර්ය ඉතා සාර්ථක ලෙස ගරු දසනායක පියතුමන්ගෙන් ඉටු වී තිබේ. මේ නිසා ම ග්‍රන්ථයේ ශාස්ත්‍රීය වටිනාකම ඉතා උසස් වන්නේ ය.

ගරු ජූඩ් දසනායක පියතුමා වටිනා ග්‍රන්ථ කීපයක් මින් පෙර ද පළ කර ඇත. ඒවා සමග සසඳා බලන විට උසස් මට්ටමක සිට තවත් ඉහළ ශාස්ත්‍රීය මට්ටමකට මෙම ගත්කරු පිවිස ඇති බව පැහැදිලි වේ. මේ ගැන අප ඉමහත් සතුටට පත් වන අතර තව දුරටත් ලංකා කිතුනු ඉතිහාසය හදාරා අපෙන් ගිලිහී ගොස් ඇති රසවත් අතීතය තව තවත් ජනතාවට විවෘත කැර දීම සඳහා එතුමන්ට නිරෝගී සුවයත් ඥාන ශක්තියත් අධ්‍යයන පහසුවත් ලැබේවායි පතමි.

**අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස්**
**විශ්‍රාමික අගරදගුරු හිමි**

## ජාතික කතෝලික ලේඛක වැඩමුළුවක් අද ජාඇල මීසමේ

**ජාතික කතෝලික ලේඛක හවුල මගින් යොවුන් ලේඛක ලේඛිකාවන් දැනුම්වත් කරන වැඩමුළුවක් ජාඇල මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියතුමාගේ මූලිකත්වයෙන් සැප්තැම්බර් 29 පෙ.ව. 9.00 ට ජාඇල සා. මරියා දහම් පාසලේදී පැවැත්වේ.**

මේ වැඩමුළුව මැක්සිමස් රෝයි පෙරේරා සංවිධානය කරන අතර, දහම් පාසලේ විදුහල්පති ආචාර්ය සමන්ත පෙරේරාගේ සම්බන්ධීකරණයෙන් වැඩමුළුව පැවැත්වීමට කටයුතු යොදා ඇත. ජාඇල ප්‍රදේශයේ ඕනෑම දරුවකුට සහභාගි වීමට හැකි මෙම වැඩමුළුව සඳහා සහභාගිවන සැම ළමයෙකුටම සහතිකපතක් ලබාදීමටද ජාතික කතොලික ලේඛක හවුල ක්‍රියාකරයි. සියලු තොරතුරු 0112234779 (රෝයි ලේකම්) 011-2232676 (සභාපති) වෙතින් ලබාගන්න.

ෆිලීෂන් අබයකෝන්ගේ
**සුබස** 246

## අක්ෂර මාලාවයි වින්‍යාසයයි

LITERACY බලා හදාගත් ස+අක්ෂර+තාව=සාක්ෂරතාව දෙබසින්ම දෙන්නේ ලිවීමේ කියවීමේ හැකියාව යන තේරුමයි. වචනයක අකුරු පිහිටිය යුතු, යෙදිය යුතු පිළිවෙළ අක්ෂර වින්‍යාසයයි. මාතෘ භාෂාවලත් සිංහලෙත් අක්ෂර මාලාව විද්‍යානුකූලය. ක්‍රමානුකූලය. ස්වර වෙන්කර මුලින්ම දැක්වේ. මහාප්‍රාණ, අඝෝෂ ආදියෙන් අක්ෂරවල කාර්ය හැඟවේ. තාලුජ (තල්ලෙන් උපන්) වැනි වචනවලින් ශබ්දය උපදින් තැන් වචනාර්ථයෙන්ම කියැවේ. දුඃඛ ආදියේ පිහිටි කුඩා බින්දු දෙක විසර්ගයයි. සිංහ, වංශ වචනවල බින්දුව අනුස්වාරයයි.

හල් හා ව්‍යංජන එකම තේරුම ඇති සකුවදන් දෙකකි. ව්‍යංජන සියල්ලම හල්කිරීම් සහිතයි. හල්කිරීම් සහිත ඒ හා ඕ ස්වර ව්‍යංජන තුළට පිවිස කේ කෝ වශයෙන් හල්කිරීම් දිගටම රඳවා ගනී. වචනයක අග ව්‍යංජනයක් ආ විට හලන්තයි. ස්වරාන්තවලට අජන්ත යයිද නමකි. ස්වරයක් ඇතුළුවීමෙන් ව්‍යංජනය සප්‍රාණිකවේ. පිල්ල නම් ව්‍යංජනයක ස්වර ශබ්දය දක්වන ලකුණය. පිළිවෙලට දී ඇති විශේෂ නම් භාවිත කිරීම වැදගත්ය.

සඤ්ඤක හතරත් ඇ ඈ ස්වර දෙකත් ශුද්ධ සිංහලට විශේෂයි. ඍ ස්වරය දමිළ ඍ ස්වරයේ අනුකරණයකි. මූර්ධජ ළ යන්නේ ළු ළූ අකුරුත් ඍ ඎ රු රූ අකුරුත් අනියම් හැඩයක් ගනී. සංස්කෘතේ මූර්ධජ ළ අකුර නැතැයි දන්නේ නම් මලමූත්‍රවලට මූර්ධජ ළ යන්න ලියන්නේ නැත. පාලි සිංහල භාෂාවල මූර්ධජ ළ අකුර තිබුණත් මූර්ධජ හල් ළ යන්නක් සිංහලේ නොපෙනේ. කිසි බසක මූර්ධජ හල් ණ් යන්නක් වදනයක අගට නොවැටේ.

ට ඩ ණ ර ෂ ප්‍රධාන මූර්ධජ අකුරුයි. ච ජ ඤ ශ ප්‍රධාන තාලුජ අකුරුයි. ත ද න ල ස ප්‍රධාන දන්තජ අකුරුයි. ඤ් යන්න වෙනුවට දැන් බින්දුව භාවිත වන නිසා රංජන් රංජිත්, රංජිනි ලියද්දී තාලුජ ජ අකුර සමග දන්තජ න අකුර යෙදීම වැරදිය. සඤ්ඤක ඹ යන්න, තාලුජ ශ යන්න, දන්තජ ල යන්න, දන්තජ න යන්න ලෙසවූ හරි යෙදුම් ඉවත ලෑම නුසුදුසුය.

තත්සම නම් ඊට සම යනුයි. මාතෘ වචන එහෙම්පිටින් ගන්නා විට ඒවා තත්සමයි. උදා. ජල, බල, තල (මතුපිට), නා නා (විවිධ), කේවල, ආඩම්බර, ජංගම, විනිමය. තද්භව නම් ඉන් උපන් යනුයි. සමහර මාතෘ වචන තද්භව වන්නේ යන්තම්නි. භාර - බර, දූර-දුර, රවි- රිවි, රිපු-රුපු උදාහරණයි. නිෂ්පන්න (නිපන්) යනු අපේම දේශීය වචනයි. ඔව්, බැහැ එපා, ඔලුව, බඩ, කට වශයෙන් බහුලව ජනවහරේය.

වත්මන් බැදි අකුරු විධිමත්ය. ක්‍රමවත්ය. අතීත සංයෝග අක්ෂර අතුරින් දැන් ඉතිරි වී ඇත්තේ රකාරාංශයත් යංශයත් ඥ (ජ්+ඤ) යන්නත්ය.

## සතුටින් ඉගෙන ගනිමු




**කර්තෘ - ශිරානි පෙරේරා**
**මිළ - රු. 200/=**

කුඩා දූ දරුවන්ගේ මනස සවිගන්වමින් ක්‍රියාවෙන් ලබන අත්දැකීම් ඔස්සේ දැනුම ධාරණය කර ගන්නට සමත් අපූරු ග්‍රන්ථයක් දැන් නිකුත් වී තිබේ.

3,4,5 ශ්‍රේණිවල දූ දරුවන්ට පන්ති කාමරයේදී ඉගෙන ගත් විෂයධාරාව හා කරුණු කාරණා යළි මතකයට නංවාගැනීමට පාඩම් වනපොත් කිරීමේ ඉපැරිණි ක්‍රමවේදයෙන් ඔබ්බට යමින් කළහැකි අපූරු ක්‍රියාකාරකම් මාලාවක් ලෙස මේ ප්‍රහේලිකා ගොන්න හඳුන්වා දිය හැකිය.

කතුවරිය සිය ගුරු දිවියේදී ප්‍රාථමික පංතිවල දූ දරුවන්ට සිප් සතර බෙදා දෙමින් ලබාගත් අත්දැකීම් මේ ග්‍රන්ථය සම්පාදනයට පිටුවහලක් කරගෙන ඇතිබැව් පෙනේ. දැනුම උරගා බලන්නට සතුටක් ලබමින් විනෝද ක්‍රීඩා ඔස්සේ මේ ප්‍රහේලිකා විසඳීමෙන් අවකාශ ලැබෙන බැව් අතිශයෝක්තියක් නොවේ.

කාලය අපතේ නොහැර බුද්ධිමය නිම්වළලු පුළුල් කරමින් ප්‍රබෝධවත් සිතින් ක්‍රියාවෙන් පුහුණුව ලබන්නට දූ දරුවන්ට ලබා දී ඇති මහඟු අවස්ථාවක් ලෙසද මෙය දැක්විය හැකිය. මේ ප්‍රහේලිකා පරිසරය විෂය ප්‍රමුඛව සෙසු සියලු විෂයයන් පාදක කරගනිමින් සකසන්නට කතුවරිය උත්සුක වී ඇත.

ප්‍රහේලිකා පිළිතුරුද අවසානයේ දක්වා තිබීම පහසුවක් හා නිරවද්‍යභාවය උරගා බලන්නට අත්වැලකි. කිතුනු ගුරුවරියක ලෙස කතුවරිය අපේ දූදරු පරපුරට පිදුමේ අපූරු ග්‍රන්ථය දූ දරු පරපුරට මහාර්ඝ තිළිණයකි. කතුවරියට සුපැතුම්!

## කිතු බැති ගීතාවලිය

හලාවත පදවියේ ගරු ඇලෙක්ස් වීරසූරිය පියතුමාගේ අධීක්ෂණය යටතේ හරබර භාවනාත්මකව රසවිඳිය හැකි ගීතිකා සමුච්චයක් එළිදක්වා ඇත. ජේ. කේ. එස් පෙරේරා ශූරින්ගේ ඉමිහිරි ගීතිකා තනුවලින් අලංකෘතවූ ඉපැරණි ගීතිකා කීපයක්ම මෙයට අඩංගු වී තිබේ. අද නිතර ඇසීමට නොලැබෙන මෙම ගීතිකා නැවත එළිදක්වා තිබීම කාලෝචිත ක්‍රියාවකි.




වර්තමානයේ එළිදකින බොහෝ කිතුනු ගීතවල අඩංගු ඝෝෂාකාරී සංගීතය මෙහි නොමැති වීම විශේෂත්වයකි. අද වැඩිපුරම දක්නට ලැබෙන්නේ ගීතිකා සිංදුය. ඒවායේ ඇති වේග රිද්ම නාද රටා නිසා ආගමික හැඟීමක් හෝ ධාර්මික වටිනාකමක් දැකීම දුෂ්කරය. මෙහි ඉතාමත් මිහිරි ලෙස ආගමික හැඟීම් ප්‍රබෝධවත්වන ආකාරයට ලයාන්විතව ගලායන ස්වරයෙන් ගීතිකා ඉදිරිපත් කර තිබේ.

ගායනය කරන ශිල්පියාට, ගායක පිරිසට ප්‍රධාන ස්ථානය දී පසුබිම් සංගීතය මනා සංයමයකින් හසුරුවා ඇත. මේ නිසා ශ්‍රවනය කරන තැනැත්තා තුළ නැවත නැවත ඇසීමේ ප්‍රබෝධයක් ඇතිවේ. ගායනයෙන් අයිවෝ ඩෙනිස්, නීලා වික්‍රමසිංහ, නෙලූ අධිකාරි, රූකාන්ත චන්ද්‍රලේඛා වැනි ප්‍රවීන ශිල්පින්ද සමූහ ගායනා සඳහා වෙන්නප්පුව සා. ජෝශප් ගායනා කණ්ඩායමද දායක වී ඇත. මෙහි සංගීත අධ්‍යක්ෂණය ලසන්ත ප්‍රනාන්දු ද නිෂ්පාදනයෙන් තනුජ ලක්ෂාන් ප්‍රනාන්දු ද සම්බන්ධිකරනයෙන් ලක්සිරි වීරසිංහද දායක වී ඇත. එයට අමතරව ගරු එමාඩ් දල්පදාදු (නි.ම.නි) පියතුමා අයිවෝ ඩෙනිස්, නිලන්ති ප්‍රනාන්දු සක්‍රීය ලෙස දායක වී තිබේ. අනාගතයේ නිෂ්පාදනය කරන කිතුනු ගීතිකාවලට මින් හොඳ ආදර්ශයක් සපයා දී තිබේ.

**උපාලි රංජිත්**

## අසිරිමත් පුදබිම

**කර්තෘ - ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමා**
**මිළ - රු. 50/=**




මාරවිල කුරුස පල්ලිය ලෙසින් ජන වහරේ ප්‍රචලිත මාරවිල ශ්‍රී කුරුසියේ ජාතික සිද්ධස්ථානයේ පුරාවෘත්තය ග්‍රන්ථාරූඪ කරන්නට සිද්ධස්ථාන පාලක ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමා ගත් වෑයම 'අසිරිමත් පුදබිම' මැයින් දැන් මුද්‍රණයෙන් නිකුත් වී ඇත.

කතෝලික සොහොන් බිමක් තුළ පිහිටා ඇති මෙරට එකම ජාතික සිද්ධස්ථානය ලෙස මාරවිල කුරුස පල්ලිය සැදැහැවත් ජනතාවගේ විශ්වාසය සවිගන්වමින් ඇදහිල්ල තීව්‍ර කරන්නට වසර ගණනාවක් පුරා ඇප කැපවූ බැව් නොරහසකි. විශේෂයෙන් එම සිද්ධස්ථානයේ ඓතිහාසික තොරතුරුද, කුරුස පලලීය හා බැඳි ජනප්‍රවාදයන්ද ග්‍රන්ථාරූඪ කරන්නටත්, ඒ මගින් අනාගත පරපුරට මේ ඓතිහාසික හා අමිල වටිනාකමකින් යුතු තොරතුරු සංරක්ෂණය කර තබන්නටත් කතුවර ගරු පියතුමා ගත් වෑයම එල දරා ඇත. මාරවිල කතෝලික සුසාන භූමියේ ඇති කුරුසියේ ප්‍රතිමාව වටා එක්රොක්වූ ජනතාව සියවස් දෙකකට ආසන්න කාලයක් පුරා තමන් අත්දුටු විශ්වාසයේ සාක්ෂින් කුරුස පල්ලියේ නිහඬ යශෝරාවයේ අපූරු නිදසුන් වේ.

කතෝලික දිවි මගේ ජයග්‍රහණයේ සංකේතය වන කුරුසය කේන්ද්‍රකර ගනිමින් විශ්වාසයේ හා ඇදහිල්ලේ සාක්ෂිය අරුත් ගන්වමින් සැදැහැ බැතියාව නංවාලන මාරවිල ශ්‍රී කුරුසියේ ජාතික සිද්ධස්ථානය පිළිබඳ ඓතිහාසික තොරතුරු ගොනුකර සැකසූ අසිරිමත් පුදබිම සෑම කතෝලිකයකු කියවිය යුතු පොත් පිංචකි. කතුවර පියතුමාට ප්‍රදීපයෙන් සුපැතුම්!

**මෛත්‍රී**

## දිදුලන කිතුනු තරු



**නම - රීතා රණසිංහ**
**ලිපිනය - 255, මඩමපාර, කීනදෙණිය, අඹේපුස්ස**
**දුරකථනය - 0719418697**

අඹේපුස්ස කීනදෙනියේ පදිංචි රීතා රණසිංහ මීරිගම රජයේ කනිටු විදුහලින් සිප්සතර හදාරා අ.පො.ස විභාගයෙන් සමත්ව, පසුව රැකියාවක් ලෙස දෙහිවල කරන්ට් පබ්ලිකේෂන් සමාගමේ සේවාවට බැඳී සේවය කරමින් සිටියදී ලේඛන කලාවට පිවිසියාය. විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් 'ඥානාර්ථ ප්‍රදීපය' කර්තෘත්වය දරා සිටියදී ඇය ලියූ ලිපි, නිර්මාණ පළකරමින් ඇයව දිරිමත් කළ බව සිහි ගන්වන්නීය. පාසල්වියේදී මරදාන විජය විද්‍යාලයය මගින් පැවැත්වූ ලස්සන අත් අකුරු තරගයේ ප්‍රථම ජයග්‍රාහිකාව වූයේද රීතාය. මීසමේ ධර්ම සභාවේ ලේකම් ලෙසද, මීරිගම, සා. මරියා දෙව්මැඳුරේ විසෙන්ති පාවුලා සමිතියේ ලේකම් ලෙසද, දිව්‍ය හෘද සමිතියේ ලේකම් වශයෙන්ද විවිධ තනතුරු රැසක් දැරූ ඇය සභාමාතාවට සිදුකළ ආගමික සේවාවද සුවිශාලය

ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ මීසම් වාර්තාකාරිනිය ලෙසද විපුල සේවයක් සිදුකළාය. උඳුවප් මිහිරට වසර ගණනාවක සිට නිර්මාණ සැපයූ ඇය 2011 දී ප්‍රතිභා සම්මාන උලෙළේදී උඳුවප් මිහිර සම්මානය දිනා ගත්තාය. අපක්ෂපාති තීරණ සමුදායක් තුළ ජීවත්වන ඇය අද අසරණව සිටියත්, ඇය දෙවිඳුන් කෙරෙහි ඇති තිරසාර ඇදහීම අබමල් රේණුවකින්වත් ඇත්වී නැත. අධිෂ්ඨානය, උට්ඨාන වීරිය තුළ දරුවන් දෙදෙනෙකුගේ ආදරය, සෙනෙහස මැද අද දිවිගෙවයි.

සතුරකුට පවා වෛර නොකරන ඇය හදවත මෙලෙක් සිත් ඇති තැනැත්තියකි. දෙවිඳුන්ගේ පිහිට තුළ ජීවත්වන ඇය ඇයගේ නිරෝගි සුවය ලබමින් යාච්ඤාවේ දැහැන්ගතව දිවි ගෙවන්නීය.

**මැක්සිමස් රෝයි පෙරේරා**

# සුදොතුම් පියා වතිකානය වටා සිය රිය පදවයි



1984 වර්ෂයේදී නිෂ්පාදිත රෙනොල්ට් 04 වර්ගයේ මෝටර් රියක් එතුමා විසින්මැ වතිකාන නගරය වටා පදවනු ලබන බැව් වාර්තාවේ. ඉතා පැරණි මෙම මෝටර් රථය දැනට කිලෝමීටර් 300000 ක් පමණ ධාවනය කර ඇතැයි ද දැක්වේ. සුදොතුම් පියා වෙත මෙම මෝටර් රථය ත්‍යාග කරනු ලැබුවේ 70 හැවිරිදි පූජකතුමකු විසිනි.

මුළු කාලය පුරා මෙම මෝටර් රථය ත්‍යාගකළ පූජක තුමා විසින්මැ ධාවනය කරනු ලැබ ඇත. පූජක තුමා සුදොතුම් පියා රැගෙන වතිකාන නගරය වටා ප්‍රථම ගමන ඔහු විසින් මැ ධාවනය කරත. ඉන් ඉක්බිති, වතිකාන ප්‍රකාශක සිරෝ බෙනඩික්ටිනි විසින් ප්‍රකාශ කරනු ලැබුවේ සුදොතුම් පියාණන් විසින්මැ, එම රථය එවක් පටන් ධාවනය කැරෙනා බවයි.

මාස කීපයකට ඉහතදී, සුදොතුම් පියා විසින් පූජකවරුන්ගෙන් ඉල්ලා සිටියේ වටිනාකමින් වැඩි සැප මෝටර් රථ පාවිච්චි නොකරන ලෙසටයි. එලෙස සැප පහසු රථ වලට වියදම් කැරෙන මුදල් දුගීන්ට පරිත්‍යාග කරනා ලෙසට ද එතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. ප්‍රැන්සිස් සසුනිසුරාණන් සුදොතුම් පියා ලෙසින් පත්වීම් ලැබීමට පෙරද කාදිනල් වරයකු වශයෙන් බුවෙනොස් ඒයාර්ස් හිදි ගමන් බිමන් ගියේද සරළ ගමනාගමන මාර්ගයන් ඔස්සේ. එතුමා පොදු බස් සේවාවන් ද පාවිච්චි කළ බැව් වාර්තා වී ඇත. පසුගිය මාර්තු මාසයේදී සිය තනතුරට පත්වීමෙන් පසුව ද වෙඩි නොවදින මර්සිඩස් වාහනයක ගමන් කිරිම එතුමා විසින් ප්‍රතික්ෂේප කරත. ඒ වෙනුවට අනෙක් කාදිනල්වරුන් සමග පොදු වාහනයක ගමන් ගත්තේය. වසර 1300 කට පසුව පාප් තුමකු වශයෙන් පත් යුරෝපා ජාතිකයකු නොවන එතුමාගේ එම සරළ පැවැත්ම හා ගමන් බිමන් යනාදිය සැමදා සරළ අන්දමින් සිදුවන බැව් ද වාර්තා වේ.

ජූලි මාසයේදී රියෝ ද ජනේරෝහිදි ඒ ඒ තැන් කරා, එතුමා ගෙනයනු ලැබුවේ ද එතුමා විසින් මනාපය දැක්වූ පරිදි කුඩා වාහනයකිනි. සසුන් පියා අදටත් ජීවත් වන්නේ සුඛවිහරණ සහිත ස්ථානයක නොවන වතිකානයේ සරල පොදු මැඳුරකයි.

## සුදොතුම් පියාගෙන් බලාපොරොත්තු රහිත දුරකථන ඇමැතුම්



ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගෙන් තමන් බලාපොරොත්තු නොවූ දුරකථන ඇමැතුම් තමන්ට ලැබෙනා බැව් ලෝකයේ ඇතැම්දෙනා විසින් මාධ්‍යයන් වෙත ප්‍රකාශ කොට ඇත. වතිකාන ප්‍රවෘත්ති සේවාව විසින් ද ප්‍රකාශ කරනු ලබන්නේ, ලෝපුරා ඇතැම් තැනැත්තන් බලාපොරොත්තු නොවූ අවස්ථාවන්හිදී පවා සුදොතුම් පියා විසින් අමතනු ලැබීම සත්‍යයක් බවයි.

වතිකානයේ මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මොංසිඤ්ඤෝර් ඩාරියෝ විගානෝ විසින් සුදොතුම් පියාගේ පෞද්ගලික දුරකථන ඇමැතුම් පිළිබඳව එතුමාගෙන් විමසා ඇත. එවිට එතුමා සිය පිළිතුර දී ඇත්තේ මෙලෙසයි. "මා දුරකථනයෙන් කරනා සියළු ඇමැතීම ගැන මාධ්‍යයන් මුළුමණින්මැ නොදැන සිටීම යහපත් කරුණක්." විශේෂිත කරුණු කාරනා හා සිද්ධීන් අරහයා එතුමා විසින් අදාළ තැනැත්තන් අමතනු ලබන බැව් සත්‍යයක් යැයි වතිකානයේ මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ තුමා විසින් ද තවදුරටත් සනාථ කරත. එතුමාගේ උපන් දිනයේදී බලාපොරොත්තු රහිතව සුදොතුම් පියා තමාට සුබ පැතූ බැව් ද එතුමා විසින් පවසනු ලැබීය.

## න්‍යෂ්ටික ආයුධ තුරන් කරන්නැයි කතෝලික සභාව ඉල්ලයි



"මිනිසාගේ ආරක්ෂාව න්‍යෂ්ටික ආයුධ මත රඳවා ගතයුතු නොවේ." එලෙසින් ප්‍රකාශ කරනු ලැබුවේ වතිකාන රාජ්‍ය ලේකම් ඩොමිනික් මම්බෙන්ටි අගරදගුරු හිමිපාණන් විසිනි. එතුමා එලෙසින් අවධාරණය කරනු ලැබුවේ, වියට්නාමයේ පැවැති 57 වෙනි පරමානු බලශක්ති සම්මන්ත්‍රණයට සහභාගි වූ අවස්ථාවේදීය.

පරමානු බලශක්ති සම්මන්ත්‍රණයේ මුඛ්‍ය අරමුණ වන්නේ න්‍යෂ්ටික අවිආයුධ පරිහරණය වළකාලමින් ජාතීන් හා දේශයන් අතර සමගි සංධානයන් සාකච්ඡා මාර්ග යෙන් උදාකරගැන්ම වේ. එම අරමුණු සාක්ෂාත් කරගැන්ම සඳහා ශුද්ධාසනය විසින් සැමදා කාලයත්, මිත්‍රත්වයත්, යැදුමත් යොදනා බැව් දොමිනික් පියතුමා තවදුරටත් ප්‍රකාශ කළ සේක.

තවද න්‍යෂ්ටික අවිආයුධ පාවිච්චිය පිළිබඳව XXIII වෙනි භාග්‍යවන්ත ජුවාම් සුදොතුම් පියාගේ වදන් ද යළි සිහියට ගන්වනු ලැබීය. "සාධාරණ පැවැත්ම ද සාම චින්තනය ද විසින් මොරදෙනු ලබන්නේ න්‍යෂ්ටික ආයුධ පාවිච්චිය හා නිපැයුම සඳහටම නවතා දමන ලෙසටයි." තවද එම සමුළුවේදී දොමිනික් රදගුරු හිමිපාණන් විසින් යෝජනා කරනු ලැබුවේ, මැදපෙරදිග රටවලැ පවත්නා ඇඩි යුධ වාතාවරණය ඔස්සේ එම ප්‍රදේශයන් න්‍යෂ්ටික අවි ආයුධ පාවිච්චියෙන් තොර කලාපයක් ලෙසට වහා ප්‍රකාශ කළ යුතු බවයි."

## සිංගප්පූරුවේ විවිධ ජාතික කතෝලිකයෝ ඇදැහිල්ලෙන් පිබිදෙති

ඇදැහිල්ලේ වර්ෂය තුළදී, සිංගප්පූරුවේ කතෝලික මීසම් ජනතාව සුවිසල් පිබිදීමක් අත්දකිමින් සිටිති. එරටේ මධ්‍ය ප්‍රදේශයේ පිහිටා තිබෙන "ක්‍රිස්තුන් වහන්සේගේ මීසම" විසින් අනෙක් හැම මීසම් වලටම ආදර්ශයක් ගෙනදෙන හා එමෙන්මැ අධ්‍යාත්මය පුබුදුවාලනු ලබන ක්‍රියාකාරකම් රාශියක් ආරම්භකොට ඇත.

පෞද්ගලික ජීවිත මෙන්මැ පවුල ද දෙවිඳුන් කෙරෙහි රඳවාලමින් ක්‍රිස්තු ප්‍රේමයෙන් ජීවිතය පුරා සැබෑ සාර්ථකත්වය කරා ගෙනයනු ලබන වැඩමුළු ද ඇදැහිල්ලේ ජීවිත සාක්ෂි ද පරෝපකාරය ද ආදී ක්‍රියාකාරකම් රාශියක් සැදැහැවතුන් විසින් අත්දකින්නට පටන්ගෙන ඇත. මෙම ඇදැහිල්ලේ ක්‍රියාකාරකම් සාර්ථක කරගැන්ම සඳහා එක් එක් මීසම තුළ 40 දෙනෙකු ගෙන් පමණ සංගෘහිත ගිහි කමිටුවක් පූජා ප්‍රසාදිවරයකුගේ අනුශාසකත්වය යටතේ ක්‍රියාත්මක වේ.

"ක්‍රිස්තුන් වහන්සේගේ මීසමේ" ද මැලේසියාව, චීනය, පිලිපීනය. ඉන්දියාව හා කොරියාව ආදි රටවලින් පැමිණ සංගප්පූරුවේ ජීවත්වන කතෝලිකයෝ ද මෙම ඇදහිල්ලේ වර්ෂය තුළදී උදාවී ඇති අධ්‍යාත්මික පිබිදීම තුළ ජීවත් වෙති. මරිය තුමිය ඇදැහිල්ලේ පරමාදර්ශය වන හෙයින් එතුමියට කැපකොට ඇති ඔක්තෝබර් මාසය තුළදී, එතුමියගේ ආදර්ශය අනුව පොදු හා පෞද්ගලික පිබිදීම අරභයා පොදු හා තනි ජපමාල උච්චාරණයෙන් ජීවිත පුබුදුවාලනු ලැබීමේ අරමුණ කරා යෑමේ මගට සියල්ලන් අවතීර්ණ වී ඇත.

ආර්ථික හා සමාජ අභියෝගයන් මැද භෞතික දියුණුව ඔස්සේ පා නඟනා සිංගප්පූරුව වැනි රටක ජීවත්වන කතෝලිකයාගේ මෙවන් ඇදැහිල්ලේ ගමනක් සැමට පරමාදර්ශයක් යැයි ද වාර්තා වේ."

## සරණාගතයන්ට සේවය කරනා පැවිදි සොහොයුරියට ජගත් සම්මානයක්

කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ පාලනය යටතේ ජීවත්වන සරණාගතයින්ගේ ජීවිත නංවාලීමේ සේවයේ නිරත අංජලික් නමයිකා නම් කතෝලික පැවිදි සොහොයුරිය ජගත් සම්මානයකින් පුදදෙනු ලැබීමට එක්සත් ජාතීන්ගේ සංගමය විසින් තීරණය කරත.

මෙම තීරණය ලොවටමැ ප්‍රකාශ කරමින් හෙළිදක්වා ඇත්තේ, එම සම්මානය මහත් ජාත්‍යන්තර හරසර මැද සති කීපයකින් සිදුකරනා බවයි. වර්ෂයක් පාසා මෙම සම්මානය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්, ලෝපුරා වෙසෙන පරෝපකාරයේ යෙදෙන තැනැත්තන් අතුරෙන් එක් අයෙකුට පිරිනමනු ලබයි. මෙවන් සම්මානයක් තමා කිසිදා බලාපොරොත්තු නොවූ බැව් පැවිදි සොහොයුරිය විසින් ජාත්‍යන්තර මාධ්‍ය වෙත පවසා තිබේ. "මා නිරතව සිටිනා දයාවේ සේවාව මගේ ජීවිත පැවැත්මේ කේන්ද්‍රස්ථානයයි. එමෙන්මැ මාගේ ස්වාමියාණන් වන ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් මා දරණා සාක්ෂියක්. එවන් සේවාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අගැයීමට පාත්‍ර කෙරුම මෙවන් සේවාවන් වලැ නිරත සියල්ලන් ඇගැයීමක් වශයෙන් ද ගිණිය හැක." ඇංජලික් පැවිදි සොහොයුරිය එලෙසින්ද ප්‍රකාශ කළාය. කොංගෝවේ ත්‍රස්ත කණ්ඩායමක් විසින් එරටේ මෙන්මැ මායිම් දේශයන් හී ඇතැම් ප්‍රදේශයන්හී වෙසෙන දුගී ජනයන්ට පහරදෙමින් සතුව ඇති අල්ප දෑ පවා සොරා ගනිමින් ද ස්ත්‍රී හා ළමා දුරාචාරයෙන් ද මහා විනාශයක් කරා විශාල පිරිස් අගාධයට පාත්‍ර කොට ඇත. අවුරුදු ගණනාවක් පුරා සිදුවූ මෙම ත්‍රස්ත ක්‍රියාකාරකම් හේතුකොට ගෙන ස්ත්‍රීන් හා දරුවන් අදත් ජීවිත ගතකරනු ලබන්නේ පීඩිත සරණාගතයින් ලෙසටයි. ඇංජලික් පැවිදි සහෝදරිය විසින් මෙම පීඩිත සරණාගත වනිතාවන් හා දරුවන් නඟා සිටුවීමේ ක්‍රියාකාරකම් හී නියැළී සිටී. දරුවන් හට අධ්‍යාපනය ලබාදීම සඳහා අනෙක් සංවිධානයන්ගේ සහාය ද ඇතිව ඇ විසින් අධ්‍යාපනික වැඩසටහන් ආරම්භ කොට ඇත. සරණාගත වනිතාවන්ගේ ජීවිත පැවැත්ම හා ආත්ම ගෞරවය වඩවාලීමට උපකාර වන සුළු ආදායම් මාර්ග නිර්මාණය කරගැන්මේ අතිසාර්ථක වැඩපිළිවෙළක් ද ඈ විසින් පවත්වාගෙන යනු ලබයි. ජාත්‍යන්තර සම්මානය ලබාගත් පසුව ඇංජලික් පැවිදි සොහොයුරිය ශුදොතුම් පියා හමුවීමට රෝමයට යාමට සූදානම් වන බව ද ඈ ප්‍රකාශ කරයි. තවද කොංගෝ දේශය හා මායිම් දේශයන් තුළ මහා විනාශයක් කොට දැනට සැඟවී සිටිනා ත්‍රස්ත කණ්ඩායම් නායක ජෝශප් කොන් හට ප්‍රසිද්ධ සමාවක් දානය කිරීමට සුදොතුම් පියාගෙන් ඉල්ලීමක් කිරීමට ද ඈ සූදානම් වෙමින් සිටිනා බැව් කතෝලික මාධ්‍ය වෙත ප්‍රකාශ කළාය.

## ෂැන්ෂිබාර් හි කතෝලික පූජක තුමාට ඇසිඩ් පහර

සැප්තැම්බර් මස 13 වෙනිදා ජෝශප් බුවන්ග්අම්බා නමැති පියතුමා ෂැන්ෂිබාර් නගරයේ සිටියදී නාඳුනන පුද්ගලයකුගේ ඇසිඩ් පහරකට ලක්විය. එම ඇසිඩ් පහරින් පූජක තුමාගේ මුහුණ ද උරහිස් ද පිළිස්සී ගොස් ඇත. රෝහල් ගතව සිටිනා එතුමා කතෝලිකයන්ගේ ආරක්ෂාව ලබමින් සිටී.

මේ වසරේදී පමණක් ෂැන්ෂිබාර් හී ගිහි කිතුනු නායකයෝ දෙදෙනෙක් ද ඝාතනය කරන ලදහ. එමෙන්මැ අවස්ථා කීපයකදී. දෙව් මැඳුරු ගණනාවකට ද පහර දී ඇත. දැනට මාසයකට ඉහතදී ෂැන්ෂිබාර් හී වෙසෙන බ්‍රිතාන්‍ය ජාතික කිතුනු ඇරියන් දෙදෙනෙකුට ද ඇසිඩ් පහර යොමුකොට ඇත.

ෂැන්ෂිබාරය, ටන්ෂානියාවට අයත් එක් දූපතකි. එහි වෙසෙනා බහුතරය ඉස්ලාම් බැතිමතුන්ය. ෂැන්ෂිබාර් දිවයිනේ දේශපාලන අරගලයක් ද පවතී. ටන්ෂානියාවෙන් මිදී ස්වාධීන පාලනයක් ගෙනඒමේ අරමුණක් ද ඔවුන්ට වේ. "යුආම්සෝ නම් සංවිධානය" විසින් ෂැන්ෂිබාරය ස්වාධීන රටක් වශයෙන් ගෙනයාමේ අරගලයක යෙදී සිටී. එපමණක් ද නොවේ, එරටේ 1964 සිට පවත්නා පාලන ක්‍රමය අවසන් කොට "ෂාරියා නීතිය" ස්ථාපිත කරමින් ඉස්ලාම් රාජ්‍යයක් බිහිකරලීම එම සංවිධානයේ ඉලක්කය වේ. ඒ නිසාවෙන් කිතුනු බලපෑම් ඊට එරෙහිව පවතින්නේ යයි අවධාරණය කරමින් කිතුනු පීඩාවන් හී යෙදෙනා බැව් ද වාර්තා වේ. මෙවන් පහරදීම් හේතුකොටගෙන කිසිදු සැක කරුවකු පොලීසිය විසින් තවම අත් අඩංගුවට ගෙන නොමැත. තවද "යුආම්ෂෝ සංවිධානයේ" ත්‍රස්ත කල්ලිය විසින් මෙම අපරාධයන් කරනු ලබන බැව් ප්‍රකාශ කෙරුනත් කිසියම් නීතිමය පියවරක් හෝ මෙතෙක් ගෙන නොමැත.

## ජනුයිරස් ශුද්ධවරයාගේ ආරක්ෂිත රුධිරය දියරවීමේ ප්‍රාතිහාර්ය මෙවරත්

ප්‍රාණපරිත්‍යාගී සාන්තුවර ජනුයිරස් තුමාගේ ආරක්ෂිත ඝන රුධිරය දියරවීමේ ප්‍රාතිහාර්ය පෙර කල්හී මෙන් මේ වසරේද සැප්තැම්බර් මස 19 වෙනිදා පෙරවරු 9.12 සිදුවිය. එදින මෙම ප්‍රාතිහාර්ය බලාපොරොත්තුවෙන් විශාල බැතිමතුන් පිරිසක් ඉතාලියේ නේපල්ස් ආසන දෙව් මැඳුර තුළ හා අවට රැඳී සිටියහ.

එම අවස්ථාවේදී, තුන්වෙනි සියවසේදී ඇදැහිල්ල වෙනුවෙන් සිය ජීවිතය පූජාකළ ජනුයිරස් ප්‍රාණපරිත්‍යාගවරයාගේ ආරක්ෂිත රුධිරය දියර බවට පත්ව තුබු වීදුරු බඳුන කාදිනල් ත්‍රේනම්ග්‍රියෝ තුමාගේ දැතින් ඔසවා සැදැහැවතුන් ඉදිරියේ එම ප්‍රාතිහාර්ය ප්‍රකාශ කළ සේක. එවිට සියල්ලෝ, දැත් ඔසවා අත්පොළසන් දෙමින් දෙවිඳුන්ට ප්‍රශංසා කළෝය.

මෙම ආරක්ෂිත රුධිරය දියරවීම පළමුවතාවට හෙළිදක්වනු ලැබ ඇත්තේ වසර 1685 දෙසැම්බර් මාසයේ 10 වෙනිදාය. එම ප්‍රාතිහාර්ය නිසාවෙන් එදා සිදුවන්නට තුබු භූමි කම්පාව වැළැකී ගිය බැව් ද ඇදැහිලි වන්තයන්ගේ විශ්වාසයයි. තවද සැදැහැවතුන්ගේ ඇදැහිල්ලේ පෙරහරක් සැම අවුරුද්දකමැ මැයි මාසයේ පළමු ඉරුදින සිදුකැරේ. එදිනද ජනුයිරස් ශුද්ධවරයාගේ ආරක්ෂිත රුධිරය දියරවීමේ ප්‍රාතිහාර්ය සිදුවන බැව් ද නේපල්ස් නුවර කතෝලිකයෝ විශ්වාස කරති.

ජනුයිරස් තුමා රදගුරු වරයකු ලෙස නේපල්ස්හී සේවයේ නිරතව සිටියදී දියෝක්ලේසියානු බළධාරින් විසින් එතුමාගේ ගෙල සිඳුවා ඝාතනය කරනු ලැබ ඇත. එතුමා ලේ වගුරුවමින් ජීවිතය පුදදෙද්දී අවට සිටි කාන්තාවක් විසින් සිරුරෙන් ගලා යන රුධිරයෙන් කොටසක් භාජනයක් තුළට ගෙන එම රුධිරය ආරක්ෂක තත්ත්වයෙන් රඳවා තබා ඇත. අදත් ප්‍රාතිහාර්ය පානා එම රුධිරය ජනුයිරස් තුමාගේ ආරක්ෂිත රුධිරය යයි ඇදැහිලි වන්තයෝ පිළි ගනිති.

ජනුයිරස් ශුද්ධවරයා ඉතාලියේ නේපල්ස්හි නාම සාන්තුවරයාය. විද්‍යාත්මක කණ්ඩායමක් විසින් මෙම ආරක්ෂිත රුධිරය පරික්ෂා කරනු ලැබීමෙන් පසුව ප්‍රකාශ කරනු ලැබ ඇත්තේද එම රුධිරය මිනිස් රුධිරයක කොටසක් බවයි.

බැසිල් ෆොන්සේකා විසිනි

සංවාද මණ්ඩපය

ප්‍රවීන මාධ්‍යවේදී කුසල් පෙරේරා මහතා කළ දෙසුමක් ඇසුරිනි

## පළාත් සභා සුදු අලියෙක් නොවෙයි. සුදු අලියෙක් බවට පත් වෙලා තියෙන්නෙ පාර්ලිමේන්තුවයි

මේ දිනවල ප්‍රධාන මාතෘකාව බවට පත්වෙලා තියෙන්නෙ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයයි. මේ ව්‍යවස්ථා සංශෝධනය ආවේ පළාත් සභා පිහිටුවන්නයි. එහෙත් සංශෝධනයේ පෙරමඟ සැලසීම 1948 තරම් ඈතට දිවයනවා.

පළාත් සභා ක්‍රමයට විරුද්ධ මත දරන අය මෙය අහෝසි කළ යුතු යයි කියනවා. එහෙම කියන්නෙත් පළාත් සභා මැති ඇමතිකම් දරමින්. තවත් සමහර අය ඉඩම්, පොලිස් බලතල නොදී තබා ගත යුතුයි කියනවා. තවත් කොටසක් කියනවා තවත් බලතල දීලා වත්මන් අර්බුදයට විසඳුමක් දෙන්න කියලා. තවත් කොටසක් කියනවා එහෙම වුනොත් උණ්ඩයෙන් කරගන්නට බැරි වුන දේ පළාත් සභා මඟින් කර ගන්නට මාන බලනවා කියා. තවත් සමහරු කියනවා මෙය විශාල ධනස්කන්දයක් වැය කරන සුදු අලියෙක් කියා. එහෙත් අද සුදු අලියෙක් වෙලා තියෙන්නෙ පාර්ලිමේන්තුවයි. අද අධිකරණ විදේශ කටයුතු, ණය පරිපාලන, මූල්‍යමය කටයුතු හැරෙන්න සෑම දෙයක්ම කරන්නෙ පාර්ලිමේන්තුවෙන් කොටින්ම කියනවා නම් මේ රටේ 2 /3 ක කාර්යභාරයක්ම කරන්න පළාත් සභා තුළින්. ඉතිරි 1/3 ක් පමණයි පාර්ලිමේන්තුවෙන් කෙරෙන්නේ. ඉතින් පාර්ලිමේන්තු මන්ත්‍රීන් 225 දෙනාට විශාල කැබිනට්ටුවකට මුදල් වැය කිරීම තේරුමක් නැහැ. අද පවතින තත්ත්වය අනුව එදා 1947 - 1956 දක්වා සිටි මංත්‍රීන් 95 දෙනා අදටත් හොඳටම ඇති. ඇත්ත වශයෙන් ජනමතයත් එයයි. ඒ අනුව සුදු අලියෙක් වෙලා තියෙන්නෙ පළාත් සභා නොව පාර්ලිමේන්තුවයි.

මැතිවරණ ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීමට පත් කළ දිනේෂ් ගුණවර්ධන කමිටුවෙනුත් සමානුපාතික ඡන්ද ක්‍රමය සම්පූර්ණයෙන්ම බැහැර කිරීමට නිර්දේශ වෙලා නැහැ. සමානුපාතික ඡන්ද ක්‍රමය තුළ යම් අඩු පාඩු තිබුණත් සුළු ජන කොටස් සම්බන්ධව අනුකූලතාවයක් තිබිය යුතු බව පිළිගත යුතු වෙනවා. එහෙත් දිනේෂ් ගුණවර්ධන කමිටුවෙන් පාර්ලිමේන්තු මංත්‍රීන් සංඛ්‍යාව තවත් වැඩි කිරීමට යෝජනා කිරීම ප්‍රශ්නයක්. ඉන්දියාවේ හරියානා ප්‍රාන්තයේ ජනගහනය මිලියන 29 යි. අප රටේ ජනගහනය මිලියන 20 යි. ඒ ප්‍රාන්තයෙන් ලොක් සභාවට තෝරා යවන්නෙ දහ දෙනයි. අපි කොහොමද කරන්නෙ. මෙරට මහජන නියෝජිත ආයතන වලට පත්වන අය කොහොමද පැවැත්ම සඳහා පාතාලය සම්බන්ධ අයවලුන්ට තමයි අපේක්ෂකත්වය දෙන්නෙ. ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂය ද මෙය කරනවා. එය ප්‍රජාතන්ත්‍රවාදයට අභියෝගයක්. උගත් බුද්ධිමත් අය මහජන නියෝජිතයන් වීම වැදගත්.

මා කලින් සඳහන් කළ පරිදි පළාත් සභා ක්‍රමයට ඒමට පෙළ ගැසුනේ ඊට වසර දශක තුනකට ඉහතදීයි. එදා සෝල්බරි කොමිසම ආ විට නිදහස උදා කර ගැනීමේ චේතනාවෙන් සියලු මතවාද අතහැර එක අරමුණක සිට ක්‍රියා කළා. එදා ද්‍රවිඩ කොංග්‍රසය සිංහල මහා සභාව, සිංහල ජාතික සංගමය උරෙන් උර ගැටී ක්‍රියා කළා. 1970 මහ මැතිවරණයෙන් උඩරට ඡන්ද කොට්ඨාශ වලින් ඉන්දීය සම්භවයක් ඇති වතු කම්කරු ජනතාව තම ජාතිය අපේක්ෂකයන් පත් කර එව්වා.

1947 රජය සිංහල මහ සභාවේ සාමාජිකයන්ගෙන් ද සමන්විත වුණා. එවක රාජ්‍ය නායකයන් ද මෙය උවදුරක් ලෙස සලකා ඉන්දීය පුරවැසි පනත මඟින් උඩරට වතු කම්කරු ඡන්ද අයිතිය අහිමි කළා. මේ හේතු කොටගෙන සී. සුන්දරලිංගම්, පී. ජී. පොන්නම්බලම් (ජ්‍යෙෂ්ඨ) වැනි අය රජයෙන් ඉවත් වුණා. සිංහල ජන නායකයන් දමිල ජනතාවට සලකන හැටි මෙහෙමයි. අන්ත ජාති වාදී හැඟීම් මෝදු වන්නට වුණා. 1957 ශ්‍රී. ල. නි.ප. බිහිවීම ජාතිකත්වයට නැඹුරු වීමක් වුණා. උතුරු නැගෙනහිරට ලබා දී තිබූ කන්කසන්තුරේ සිමෙන්ති කම්හල, පරන්තන් රසායන සංයුක්ත මංඩලය, පුල්මුඩේ ඛනිජ වැලි සංස්ථාව හා වාලච්චේන කඩදාසි කම්හල යන කර්මාන්ත හතරෙම සේවකයන් වශයෙන් පත් කර එව්වේත් සිංහලයන්.

K.K. S. සිමෙන්ති කම්හල නිසා සිංහල විදුහලක් ඇරඹුවා. මේ හේතුන් නිසා දමිල ජනතාවගේ නොසතුට වැඩෙන්නට වුණා. රජයත් ජනසතු යයි කියමින් කළේ රජ සතු කිරීමයි.

1956 වන විට ජාතික හැඟීම් උත්සන්න වන පසුබිමක් ඇතිවුණා. සිංහල රජ බස කිරීම ප්‍රධාන සටන් පාඨය වුණා. රාජ්‍ය බලය ඒ අනුව පෙළ ගැසෙන තත්ත්වයක් උදාවෙමින් තිබුණා. 1956 ම. එ. පෙ. රජය ජයග්‍රහණයෙන් පසු 1958 දෙමළ කෝලාහල සත්‍ය ග්‍රහ වැනි ක්‍රියාදාම රටට අහිතකර තත්ත්වයක් උදා වුනා. බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුම මහ සංඝරත්නයේ විරෝධතා මැද ඉරා දැමීමට සිදුවුනා. දෙපාර්ශ්වයේම සිවිල් වැසියන් පවා මරණයට පත්වුණා. කොල්ලුපිටියේදී රතනසාර ස්වාමින් වහන්සේ අපවත් කරවූවා.

දමිළ ජනතා අයිතීන් පිළිබඳව සටන් කරමින් සිටි දමිල ජන නායකයන් දමිල දේශපාලන පක්ෂ එක්කොට ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ වඩුක් කොඩෙයි පිහිටුවා ගත්තා. 1977 මහජන මැතිවරණයෙන් ඔවුන් දමිළ රාජ්‍යයක් බිහිකිරීම සඳහා තමනට ඡන්දය දෙන ලෙස ඉල්ලීම් කළා. ඒ අනුව උතුරු නැගෙනහිර දමිළ ඡන්ද දායකයින්ගෙන් සියයට 91.4 ක් ඔවුනට ඡන්දය ප්‍රකාශ කළා. එවැනි ප්‍රතිඵලයක් ගෙන ඒමට 1972 ජන රජ ව්‍යවස්ථාව ඉදිරිපත් කළ දමිළ කොන්දේසි පිළි නොගැනීම සිංහල භාෂා ප්‍රවනතා විභාගය 1974 භූගෝලිය පදනම මත සරසවි ප්‍රමිතරණය ඇති කිරීම යනාදිය මුල්වුණා.

සකස් කළේ තියබෝල්ඩ් සමරතුංග

# ශ්‍රී ලාංකේය කතෝලිකයා කෘතවේදී ද?



කෘතවේදීත්වය මහත්මා ලක්ෂණයකි. නොඑසේ නම් ධර්ම ගුණයකි. කතෝලික අප කෘතවේදී දැයි පැනයක් නැගුනහොත් සෘජු පිළිතුර "නැත" යන්නයි. ශ්‍රී ලාංකේය කතෝලිකයා කෘතවේදී වුවා නම් ජුසේ වාස් පියතුමන් මේ වන විට ශ්‍රී ලංකා ධරණී තලයේ ප්‍රථම ශුද්ධවරයාව සිටිය යුතුව තිබිණ. නමුත් අදත් ඒ මහා ධර්මදූතයා "භාග්‍යවත් ඇමතුමෙන් ඇමතුම් ලබයි.

ජීවමානව සිටියදී පවා උන්වහන්සේ මඟින් දෙව් පෙළහර විදහා දැක්වුනේ වරක් දෙවරක් නොවේ. අප රට තුළ පමණක් නොව උන්වහන්සේ ජීවත් වූ ගෝව පුරයේ දී පවා කුඩා දරුවකුව සිටි සමයේදීත් උන්වහන්සේ පෙළහර පෑ බව පොත පතෙහි දැක්වේ. උන්වහන්සේගේ දැහැමි, අල්පේච්ඡ ජීවිතයට ද්වේශ කළවුන් වරක් රාත්‍රියක උන්වහන්සේ රවටා හුදකලා කන්දක් වෙත පමුණුවා මරා දැමීමට තැත් කළ නමුත් දේව හස්තය උන්වහන්සේ මත වූයෙන් උන්වහන්සේ මරණයෙන් ගැළවිණ. මරණයට සූදානම්ව දෙදණ බිම ඔබා උන්වහන්සේ යදින්නට පටන් ගත්තේ අත වූ කුරුසිය එම කඳු මුදුනෙහි පොළොව මත තමා ආසන්නයේ බිම සිටුවා තබාගෙන ය. උන්වහන්සේ වටා මහා ආලෝකයක් පැතිරයත්ම සතුරෝ ත්‍රස්තව උන්වහන්සේ හැර පියා පලා ගියහ.

ජුසේ වාස් පියතුමා දණ ගසා යාච්ඤා කොට මරණයට සූදානම් වූ එම කඳු මුදුනෙහි පොළොව මත අද පවා උන්වහන්සේගේ දෙදණ තිබූ බිමෙහි වළවල් දෙකක් සටහන්ව තිබෙන බව ප්‍රකට ය. එයටත් වඩා ප්‍රාතිහාර්යය වනුයේ උන්වහන්සේගේ භාග්‍යවරයට එසැවීමේ විශේෂ දේව මෙහෙය අවස්ථාවේ මහිම ගීය ගැයෙද්දී එම වළවල් දෙකින් අහසට ජලය විදිමින් දේව ප්‍රසාදය පළවීමයි. උන්වහන්සේ භාග්‍යවරයට ඔසවන අවස්ථාවේ දිව්‍ය පූජාවට සහභාගි වීමට අවස්ථාව මඟ හැරී ගිය ගෝවේ රාජගුරු පූජාප්‍රසාදිතුමන් පෙර කී කඳු මුදුනෙහි ප්‍රාතිහාර්යමය දෙදණ වළවල් පිහිටි බිමේ දිව්‍ය පූජාව ඔප්පු කරන අතර තුර මෙම අහසට ජලය නිකුත් වීම සිදු වූ බව පැවසේ.

ගරු පියතුමකු ජල හිඟයට පිළියම් ලෙස එම සුවිශේෂී ස්ථානයේ "දෙදණ වළවල්" සමීපයෙහි වතුර සොයා අඩි 60 ක් ගැඹුරට කැණ ඇතත් ජලය හමුව නැත. බැතිමතුන් විසින් එම ස්ථානය බැහැදැකීමට ගොස් දමන ලද කාසිවලින් එම ලිං අඩිය පිරී පැවතුනද අද හෝ එහි ජලය දක්නට නැත. අද එම පියස සංරක්ෂිත පෙදෙසකි.

ඉතින් ජුසේ වාස් පියතුමා ශුද්ධවර භාවයට පත්ව නැතැයි අපට පැවසිය හැකිද? ශුද්ධවූ අන්තෝනි මුනිතුමා ජේසු බිළිඳුන් සුරතෙහි දරා සිටියා සේම ජුසේවාස් පියතුමා ද ජේසු බිළිඳුන් අත දරා මහා ආලෝකයක් මැද හුදකලාව යාච්ඤා කරනු දුටුවන් ඒ බව තම දරුවන්ට පැවසූ බව අප රටෙහි ජුසේ වාස් පියතුමා රහසින් සැඟවී සිටි ලාංකීය ප්‍රදේශවල මුඛ පරම්පරාවෙන් පවතින කතා තවමත් පවතී. අප අද කතෝලිකයන්ව සිටිනුයේ ජුසේවාස් පියතුමාට පිංසිදු වන්නටය. නමුත් එවන් "තෝරාගත් ජනතාවක්" වන අප බහුතරයකට අදත් මේ ආශ්වර්යවත් දහම් දෙටුවාගේ ධර්මදූත සේවය ගැන භක්තියක් හෝ හරි වැටහීමක් නැත. "ඇත්තටම කවුද අනේ ජුසේවාස් පියතුමා?" යි කුතුහලයෙන් විමසන බොහොමයක් කතෝලිකයින් කියන්නේ "අපේ සුවාමිලා අපට ඒ ගැන කිසිදෙයක් බරපතල විදියට කියල දීල නැහැනෙ. අපි හිතුවේ ජුසේ වාස් පියතුමා ගෝවේ හිටපු කෙනෙක් කියලනෙ. උන්වහන්සේ ලංකාවෙ කොහෙද ඉඳල තියෙන්නෙ? එතුමන් නමින් පල්ලියක්වත් තියෙනවද?" මේ ආකාරයේ විමසුම් තොරක් නැතිව ඇහෙද්දී ඒ විමසුම්ද ප්‍රාතිහාර්ය තරමටම අපව විස්මයට පත් කරන්නේ මෙතරම් ධර්මධර, විනයධර, සුපේශල, ශික්ෂාකාමී ධර්මදූතයෙකු වශයෙන් ආදර්ශමත් අල්පේච්ඡ ජීවිතයක් ගෙවූ ජුසේ වාස් පියතුමා ගැන අපේ අවබෝධයේ තරම හැඟෙන විටය.

කාගේ හෝ වරදින් මේ සිදුව ඇත්තේ නොසිදුවිය යුත්තක්මය. වැඩිහිටි, තරුණ පිරිස් මෙපමණ ජුසේ වාස් පිය සේවාව පිළිබඳව දුරාවබෝධයකින් සිටියදී සිසුන් ගැන කවර කථාද? බොහෝ විට ශ්‍රී ලාංකේය කතෝලිකයා තවමත් අල්පේච්ඡතාවය නොහඳුනන්නේ ජීවිතයට හෝ දේවස්ථානයට වැද්ද නොගන්නේ ජුසේ වාස් කුලකයේ කතෝලිකයන් විය යුතු අප මහත් අත්වැරදීමකින් මුලාවකින් බටහිරට ආවඩන බටහිර අනුකාරක රැල්ලට වැටී ඉබාගාතේ යන්නවුන් වීමෙන් යයි සිතේ.

☛ ලබන සතියට

✍ ඇන්ටනි සමරවික්‍රම
පැල්ලන්දෙනිය

## අපේ කාලයේ භාවනාවක්! - 07

## නිවැරදි ගිහි පැවිදි නායකත්වය

ශ්‍රීසමට සුවාමිලා එනවා යනවා. බොහෝම ස්වල්ප දෙනෙක් තමයි ගමේ ඉතිහාස පොතට එක්වන්නේ ඒ උන්වහන්සේලා කළ කී දෑ නිසානේ. ඒ දවස්වල පල්ලියට සුවාමි කෙනෙක් එනව කියන්නෙ, ගමට ජනාධිපති කෙනෙක් වගෙයි. පිටිපන ගම් පියැස දියුණු කරන්ට ආ ප්‍රංශකාර ෆීලික්ස් මෙවල් ගරු පියතුමා අදත් පැරැන්නෝ මතක් කරන්නේ මහත් භක්ත්‍යාදරයෙන්.

ඉන්න, හිටින්න තැනක් නැති ගමේ අහිංසකයින්ට ධීවර සමිති එක්ක එක්කාසුවෙලා හිසට සෙවණක් දුන්නු හැටි අදත් රස කරමින් මතක් කරනවා. ගමේ කෙළවරක පල්ලියට අයිති මුඩු බිමක්. ඒ කියන්නෙ අපේ ගම ගොඩ කරන්න මුහුදෙන් වැලි ඇද්ද හැටි, සුවාමි පෙරමුණ ගත්තු හැටි, තවමත් චිත්‍රපටයක් වගේ මිනිස්සු විස්තර කරනවා. ප්‍රංශකාර ෆීලික්ස් මෙවල් නාමය අපේ වුනේ අන්න එහෙමයි.

හැටේ දශකයේ රජ කරපු චාර්ල්ස් සුවාමි කට ඇති, හොඳ හිත ඇති, බය දන්නෙවත් නැති කෙනෙක්නෙ. කිසිම අවැඩකට, නුගුණකට, කොලුගැටයින්ට යොමුවෙන්න ඉඩ දුන්නේ නැහැ. පල්ලිය වටා රොක්වුනු තරුණ ගැටවුන්ගේ වීරයා වුණේ චාර්ල්ස් සුවාමිනේ. සුවාමිත් එක වෙලාවකට කොල්ලො අතර හරි හරියට කොල්ලෙක්. දුප්පතාගේ හිතවතෙක්. හැබැයි ඉතින් අද වගේම එදත් සුවාමිගෙ හොඳකම ප්‍රයෝජනයට ගෙන කිඹුල් කඳුළු හෙලල, උන්වහන්සේගේ ඇහැට වැලි ගහල, මුදල් කොල්ලකාපු කෛරාටිකයො එදත් අපෙ ගමේ ඉඳ තියෙනවනේ.

අදටත් ප්‍රසිද්ධ පිටිපන මාළු ලෙල්ලම ගමට ගේන්න පුරෝගාමියා වුනේ මේ සුවාමිනේ. ඒකට පුංචි යුද්ධයක් කරන්න වුනා කියන්නෙ. ඒ කාලෙ ඉතින් ඉරිදා පූජාව ඉවර වෙච්ච ගමන් කොල්ලො කුරුට්ටො විතරක් නෙවෙයි වයසක උන්දලත් පොරකනව පුංචි පල්ලිය පැත්තෙ ප්‍රොජෙක්ටරයෙන් පෙන්වන "දස පනත" බලන්න. ඇයි? "කවුබෝයි", "ක්වීන්ද ඔෆ් ද ජන්ගල්" හැම සතියෙම මොකක් හෝ අපූරු ඉංග්‍රීසි චිත්‍රපටයක්. ඒ කාලෙ අද වගේ ටී. වී. තිබුණේ නැහැනේ. අපිට එව්වා හරි අගෙයි. අපිට පල්ලිය, සුවාමිව අගෙයි. ඒ කාලෙ ගම්වල "කුඩු" තිබුණෙ නැහැනේ. තිබුණ නම් එහෙම ඒවා කුඩේ කුඩු කරන්න අපෙ සුවාමිල පසුබට වෙන්නෙ නැහැ. අම්මප ඇත්තමයි.

කාන්තාරයක්ව තිබුණු දේවස්ථාන වත්ත දවල්ට ගිනියම් වෙනවා. කාෂ්ඨකේ නැති කරලා ඒ හරිය සුන්දර වනපෙතක් කරල පල්ලිය අවට සිසිලසක් කර දේවස්ථානයට යාබදව ලූර්දු ගුහාවක් ඉදි කළ ප්‍රැන්සිස් ප්‍රනාන්දු ගරු පියතුමාව අදත් ගම්මු සිහි කරන්නේ මහත් භක්ත්‍යාදරයෙන්. ගමේ අහිංසකයින්ට ගෙවල් හදල දුන්න ප්‍රැන්සිස් සුවාමි අදත් අපි අතර ඉන්නවා.

හැත්තෑව දශකයේ අග භාගයේ අපේ පල්ලියට ආපු තව ස්වාමිකෙනෙක්ව ඉතා ඉහළින් කතා බහට ලක්වුනා මට මතකයි. සමහරුන්ගෙ නොසන්සුන්තාවයටත්, සමහරුන්ගෙ ආදරයටත් මෙතුමාව ලක්වුණු හැටි බලන්නකො. ඒ කාලෙ පල්ලියෙ ටයිල් අල්ලල තිබුනේ නැහැනේ මුහුදු හුළං පොද වැදි වැදි අප වාඩිවුණේ බිමනේ. හැබැයි පල්ලිය ඇතුළෙ මොන වෙලාවකටත් "හ්ම්" කියන්ඩ බැහැ. ඒ ජේසු ජීවමානව වැඩසිටින හින්දම නොවෙයි. පොඩි අපි ජේසුටත් වඩා බය වුනේ මිටි, සුදු, ටිකක් ඇස්ලොකු ජොසපින් ස්කොලෙ නෝනටනේ. දහම් පාසල් ළමයි විතරක් නෙවෙයි ලොකු පොඩි භේදයකින් තොරව ළමයි විතරක් නෙවෙයි. ලොකු පොඩි භේදයකින් තොරව කවුරුත් ගමේ ගරු කෙරුවනේ ඉස්කෝලෙ නෝනට. ඒ නපුරු බැල්ම හෙටක් වෙනුවෙන් හෙලුව ආදරණීය බැල්මක් කියල වැටහෙන්නෙ අපට අදයි.

තම මල්ල පුරවගන්න අදහසින් පල්ලිය හා සබැඳි වැඩ වලට හේත්තු වෙන්නෙ නැතිව, ගමේ පල්ලියේ හෙට වෙනුවෙන් තමකම නැසූ ගිහි නායකත්වය. දැන් ඉතින් අපි කතාවට එමුකො.

ඔන්න ඉතින් අපි ලොකු පොඩි කවුරුත් පූජාවට ගිහිල්ල ඉඳගන්නෙ බිමනේ. හැබැයි ගමේ ලොකුයි කියාගත්තු මහත්තුරු, නෝනලා කීප දෙනෙක් පමණක් තම වලව් වලින් සුවිසාල ගෙවල් වලින් තඩි පුටු ගෙනල්ල පල්ලිය ඇතුළෙ පේලියට අයිනක අසුන් ගන්නවනෙ. ඒක ඉතින් ඉස්සර ඉඳලම එන පුරුද්දක්නෙ.

මෙන්න බොලේ දැක්ක අපේ අලුතින් ආපු සුවාමි මේ වැඩේ.

හැමෝටම පුටුවක්, බංකුවක් උඩ වාඩිවෙන්න තිබුණනම් තමයි හොඳ. උන්වහන්සේ ඉරිද පූජාවක කිව්වෙ නැතැයි.

පල්ලියෙ සල්ලිත් ආල, ගමෙත් උදවු ඇතිව ඔන්න පල්ලිය පිරෙන්න පේළියට ලස්සනට බංකු. යස අගෙයි. දැන් භේදයක් පෙනෙන්ට නැහැ. කාලයාගේ ඇවෑමෙන් අර වලව් පුටු ටික දිරල ගියා නොවැ.

"ඇති හැකි", "නැති බැරි" භේදය පල්ලියෙන් තුරන් කරන්න ගත්තු පියවර බලන්නකො. උන්වහන්සේගේ කාර්යාලයේ ගහල තිබුණු අබා පියා ඇත / නැත කියල බෝඩ් එකක් නේ. "අබා පියා නැත" කියලා දැකපු දවසක් මට නම් මතක නැහැ. හෙළ බසට, මිනිසුන්ට ආදරය කළ උන්වහන්සේව පොළෝ තලයෙන් අතීතයේ මූසල දවසක බලහත්කාරයෙන් ස්වර්ගස්ථ කෙරුවනෙ. හැබැයි ගරු අබා කොස්තා පියතුමා මගෙ විතරක් නෙවෙයි ගමේ කාගෙත් හිත් තුළ තවමත් "ඇත" තමයි.

අපෙ මීසමේ විතරක් නොවෙයි. මේ වගේ රත්තරං සුවාමිල, සිස්ටර්ල සිරිලක පුරාම, දේවස්ථානවල එදත් හිටිය, අදත් ඉන්නවා. අර මම කියපු ජොසපින් ස්කොලෙ නෝනලත් එදත් හිටිය අදත් ඉන්නවා. එවැනි නිවැරදි ගිහි, පැවිදි නායකත්වයට මෙම පුංචි භාවනාව තුති මල් මිටක් ලෙස උපහාර වේවා!

✍ මෙරිල් මීපුර

# දුම්රිය හරස්මගේ වෙහෙසෙන මිනිස්සු




**දුම්රියක ගැටී සිදුවන ඕනෑම අනතුරක් හදවත සසල කරවන එකක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. තවද එවැනි අනතුරකින් ජීවිතය බේරාගැනීමට හැකිවනුයෙ බොහෝ පින් ඇති වාසනාවන්තයින්ට පමණි. මාරාන්තික අනතුරු වල කඳුළු මතකයන් ඔබ්බට තවත් සිතන්න බොහෝ දේ එම අනතුරු විසින්ම මෙරට සමාජය හමුවේ ඉතිරිකර තිබේ.**

එයින් ප්‍රධානතම එකක් වනුයේ මෙරට දුම්රිය හරස් මාර්ගවල ඇති අතිශයින්ම අනාරක්ෂිත ස්වභාවයයි. අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග රාශියක නාම ලේඛනයක් එක හුස්මට කියාගෙන යා හැකි එබැවිනි. ලෝකයේ අන් කිසිදු රටක දුම්රිය හරස් මාර්ග මේ අයුරින් අනාරක්ෂිත නැත. රටපුරා විසිරි ඇති දුම්රිය මාර්ග පුරාවට මෙවැනි අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග දැක ගැනීමට ඇත. මෙවැනි ස්ථානයන්හි සිදුවන බිහිසුනු අනතුරු වලින් කියාපානුයේ අන් කිසිවක් නොව මෙරට මගී ආරක්ෂාව විෂයේ පවතින බරපතල දුබලතාවයි.

මුහුදු බඩ දුම්රිය මාර්ග යේ කොළඹ සිට දකුණට ගමන් කිරිමේදී පළමුව හමුවන අනාරක්ෂිත හරස් මාර්ගය වනුයේ රත්මලාන, අඟුලාන අතර (අඟුලාන පොලිසිය) ආසන්නයේ පිහිටා ඇත. අනිත් අනාරක්ෂිත මාර්ග යද අඟුලාන දුම්රිය පොල පසුකොට ඉදිරියට ගිය විට හමුවන අඟුලාන කලපුව අසන්නයේ පිහිටා ඇත. මේ කිසිදු හරස් මාර්ගයක් සඳහා ගේට්ටුකරුවෙක් නොමැති වීම හේතුවෙන් අනාරක්ෂිතව පවති. විශේෂයෙන් අඟුලාන කලපු සංවර්ධන මධ්‍යස්ථානය මුහුදු තීරයේ පිහිටා තිබීම හේතුවෙන් දිනපතා විශාල වාහන ප්‍රමාණයක් මේ හරස් මාර්ගය හරහා ගමන් කරයි. අවම වශයෙන් අවදානම හඟවන පුවරුපවා මෙහි සවිකර නොමැත. මොරටුව පසු කොට ඉදිරියට යෑමේදී මෝදර පාලම ආසන්නයේ තෙවන අනාරක්ෂිත මාර්ගය පිහිටා ඇත. විශේෂයෙන් මෝදර ධීවර වරායට ගමන් ගන්නා වාහන වැඩි ප්‍රමාණයක් මේ අවදානම අතරින් ගමන් කරති. පානදුර



පසුකොට ගමන් කිරීමේදි වාද්දුව,පොතුපිටියෙ පිහිටි හරස් මාර්ගයද පෙර සඳහන් කළ පරිදිම අනාරක්ෂිතව ඇත. මේ පිළිබඳව පොතුපිටිය ප්‍රදේශයේ පදිංචි සිමොන් සිංඤෝ මහතා මේ ස්ථානය පිළිබඳව හොඳ දැනුමක් ඇති අයෙකි. "මේක මේ අද ඊයේ ඉඳලා පවතින ප්‍රශ්නයක් නොවෙයි. ප්‍රේමදාස මහතාගේ කාලේ පිහිටුවා තිබුණු බම්බු ගේට්ටු ඉවත් කළායින් පසු විටින් විට මේ වගේ අනතුරු සිද්ධ වුනා. කොටින්ම මීට අවුරුද්දකට කලින් අපේ ගමේ තරුණයින් දෙදෙනෙකු පවා මේ ස්ථානයේ දී මිය ගියා. මේ හරිම අවාසනාවන්ත තත්ත්වයක්, මෙම ස්ථානය හැරෙන්නට මේ වගේ තවත් බොහෝ අනාරක්ෂිත දුම්රිය හරස් පාරවල් මේ ප්‍රදේශයේ තියෙනවා. කළුතර උතුර ඉඳන් පානදුර දක්වාම තත්ත්වය මෙකයි. මේ පිළිබඳව උනන්දු වෙන්නේ නැහැ. අනතුරක් සිදු වුනාට පස්සේ දවස් දෙක තුනක් මේ ගැන කතා කළාට එතනින් එහාට හැමෝටම අමතක වෙනවා" යැයි ඔහු කීය. ඔහු පැවසූ ලෙසම මීටර් 200 ක් පමණ ඔබ්බට අනෙක් දුම්රිය හරස් මාර්ගය පිහිටා තිබේ. කළුතර පසුකර ඉදිරියට ගියවිට ප්‍රදීපය ඇතුළු විවිධ මාධ්‍යයන් මගින් අනාවරණය කළ කළුතර - කටුකුරුන්දේ සා. සෙබස්තියන් දේවස්ථානයට හා වෙනත් ස්ථානයන් වෙත ගමන් කරන සා. සෙබස්තියන් පාර හරහා ඇති දුම්රිය හරස් මගද අනාරක්ෂිතව ඇත. මෙහි කලින් ගේට්ටුකරුවකු සේවය කළද අද වනවිට ඔහු සේවයෙන් ඉවත්කර ඇත. දේවමෙහෙයන් පවතින අවස්ථාවන් හිඳි ඇතුලු ප්‍රදේශයේ පවතින සංචාරක හෝටල් සඳහා විශාල වාහන ප්‍රමාණයක් දිනකට මේ මාර්ගය හරහා ද ගමන් කරන අතර කොපමණ ඉල්ලීම් කළද මෙතෙක් මෙයට විසඳුමක් ලැබී නොමැත. මේ අතර මග්ගෙ ාන සා. මරියා දේවස්ථානයට ගමන් කරන දුම්රිය මාර්ගයට ඉහලින් ඉදිකර ඇති පාලම් මාර්ගයද දැඩි ලෙස අබලන්වී ඇත. ගාල්ල හා මාතර දක්වා ගමන් කිරීමේදිද පෙර සඳහන් කළ පරිදිම අනාරක්ෂිත හරස් මාර්ග බොහෝ ප්‍රමාණයක් දැකගැනීමට හැක. ඉන්දීය ණය ආධාර ක්‍රමය යටතේ මුහුදු බඩ දුම්රිය මාර්ගය සංවර්ධනය කරනවායයි පවසා ඉන්දියානු රජය ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ප්‍රතිපාදන ලබාදී තිබියදීත් මෙවැනි අනාරක්ෂිත ස්ථාන සංවර්ධනය කිරීමට අවශ්‍ය බව දුම්රිය බලධාරින්ට නොපෙනීම අභාග්‍යය සම්පන්න කරුණකි. තවද මේ මාර්ගය සංවර්ධනය කිරීමේදී විවිධ දූෂණ හා අක්‍රමිකතා සිදුව ඇති බව දුම්රිය සේවකයෝ පවසති.

දකුණු මුහුදු තීරයට අයත් නොවුවද පසුගිය කාලේ අතිශයින්ම ජනප්‍රිය වූ තවත් අනාරක්ෂිත හරස් මාර්ග පිරිවරාගත් දුම්රිය මගක් ගැන නොලියාම බැරිය. එනම් රාගම සහ හොරපේ, එඬේරමුල්ල, වෙඩි කන්දේ ඇති දුම්රිය හරස් මාර්ග ඇතුළුව හලාවත මාර්ග යේ ඇති අනාරක්ෂිත ස්ථානයි. මීගමුව දුම්රිය ස්ථානයට ආසන්නයේ පිහිටි එක්තරා දුම්රිය හරස් මාර්ගයක් අසල පදිංචි කතෝලික බැතිමතකුවු උයද සෝවිස් මහතා අරුම පුදුම චරිතයකි. ජීවිතයේ සැඳ සමය ගතකරන ඔහුගේ දින චරියාවට එකතුවූ සත්ක්‍රියාවකි ඇත. එනම් උදේට සහ සවස වාහන එන යන විට දුම්රිය හරස් මාර්ග අද්දරටවී දුම්රිය එනවාදැයි බලා සිග්නල් දීමයි. ඔහුගේ ඇති පරාර්තකාමීත්වය නිසා එසේ කළද එය කිසිසේත්ම මෙම ප්‍රශ්නයට විසඳුමක් නොවෙ. "මෙතන අනතුරුවලට නම් දරාපු තැනක්. මීට මාස දෙකකට කලින් ත්‍රිරෝද රථයකුත් මෙම ස්ථානයේ දී දුම්රියක ගැටුනා, ඊට කලින් මෝටර් සයිකලයක් දුම්රියක ගැටී මේ ගමේ පදිංචිව සිටි හමුදා සෙබලෙක් මිය ගියා. මෙතන වාහන නිතරම ගමන් කරන මාර්ග යක්. උදේටත් සවසටත් පාසල් වෑන් පහකට වැඩිය ගමන් කරනවා. සංචාරක හෝටල් තියන නිසා විදේශිකයනුත් ගමන් කරනවා. මම මේ ගැන නොයෙකුත් දෙනාට කියලා තියෙනවා. නමුත් කිසිම කෙනෙක් මේ දේවල් ගණන්ගන්නේ නෑ. ඇතැම් විට මෙතන අනතුරක් සිදු වුනාම නිලධාරින් ඇවිල්ලා කිඹුල් කඳුළු හෙළනවා. ඊට එහා ක්‍රියා මාර්ගයක් ගන්නේනෑ" යැයි සෝවිස් මහතා පැවසීය. දෙහියාගාත, ජා-ඇල හා කපුවත්ත දුම්රිය ස්ථාන අතරද මෙවැනි අනාරක්ෂිත හරස් මාර්ග දෙකක් දැකගැනීමට හැක. මෙහි එක් ගේට්ටුවක් බාරව කිතුනු බැතිමතකුවන මවින් සිල්වා මහතා සේවය කරයි. අනිත් ගේට්ටුව සඳහා ප්‍රදේශයේ ව්‍යාපාරිකයින් කීපදෙනෙකුගේ දායකත්වය මත සුළු මාසික වැටුප් සහිතව ගේට්ටුකරුවකු යොදවා ඇත්තේ මෙතැනින් සිදුවන අනතුරු වලක්වා ගැනීමේ උතුම් අරමුණ පෙරදැරි කොටගෙනය. ප්‍රධාන දුම්රිය මාර්ගයේ රජරට හා උඩරට යන මර්ගයන්හි යම් තරමක් සංඛ්‍යාත්මක අනාරක්ෂිත හරස් මාර්ග අඩුවක් දකින්නට ලැබුනත් කැලණි වැලි මාර්ගය පිළිබඳව අනාවරණයක් නොකළහොත් විශාල අඩුවකි. කොස්ගම කනිෂ්ඨ විද්‍යාලය. හන්වැල්ල සෞඛ්‍ය නිලධාරි කාර්යාලය සහ බැරේගල් ජනපදය පිහිටා ඇත්තේ කැලනි වැලි දුම්රිය මාර්ගය ආසන්නයේය. දිනපතා විශාල මගින් පිරිසක්ද කුඩා දරුවන් සමග මවුවරුන් සෞඛ්‍ය සායන සඳහා මේ අනාරක්ෂිත හරස් මග හරහා ගමන් කරති. කලින් සවිකර තිබු ගේට්ටුව මාස කීපයකට පෙර ඉවත් කර තිබීමෙන් ජනතාව වඩාත් අපහසුතාවයට පත්ව ඇත. පාදුක්ක, පින්නවල, කොස්ගම, කහහේන වැනි ප්‍රදේශයන්හි ඇති හරස් මාර්ග මෙසේ අනාරක්ෂිතව ඇත.

වර්තමානයේ දුම්රිය හරස් මාර්ගයේ සේවය කරන උණබබ්බුගේට්ටු කරුවකුගේ මාසික වැටුප රු. 3000 වන අතර අද ජීවන වියදම අනුව එම වැටුප කිසිසේත් ප්‍රමාණවත් නොමැත. තවද මෙම සේවය හැරයාමට හේතුවද මේ සොච්චම් වැටුප නිසාය. නිසි ලෙස දුම්රිය ධාවන කාල සටහන් ද මාසික වැටුපද අදාල ආසන්න දුම්රිය ස්ථානයෙන් නිසි කලට නොලැබෙන බව ඔව්හු පවසති. කුමක් හෝ අනතුරක් සිදුවුවහොත් තමාගේ සේවය ඉවත්කරන අතර බොහෝදෙනෙක් තමන්ගේ රැකියා පළපුරුද්ද මත සේවය කරති. වයස අවුරුදු 50-60 පැන්න අය වෙත්. කිසිදු රැකියාවක් සිදු කිරීමට නොහැකිව මේ රැකියාව කළද ඔවුන් තුළ කිසිදු ආත්ම තෘප්තියක් නොමැත.

**චින්තක ද මැල්**
සමස්ත ලංකා දුම්රිය
මගී සංගමය

# ජූලි වර්ජක නඩත්තුවට අතදුන් කිතුනු දායකත්වය

**වැඩ වර්ජනය කී සැනින් මෙරට බහුතර වැඩකරන ජනතාවගේ මතකයට එන්නේ නවසිය තිස්ගණන් වල මුලින්ම වැඩ වර්ජනයෙන් මියැදුන ගෝමින් ද සාමිය. එසේ නැත්නම් 1947 මහා වැඩ වර්ජනයෙන් මියැදුන කන්දසාමිය. එහෙමත් නැත්නම් 1980 ජුනි 05 මියැදුන සෝමපාලය. මොවුන් සැම දෙනම ජීවිතක්ෂයට පත්වුනේ පාලක පක්ෂයේ වෙඩි උණ්ඩයට මුහුණ දීමෙන්. වසබී මියගිය ජූලි වර්ජකයෝ 60 ඉක්මවති.**

අද මෙම ලිපියෙන් කියැවෙන්නේ එදා දිනකට රු. 10 ක වැටුප් වැඩිවීමකුත් ජීවන අංකයට රුපියල් 5 ක වැඩිවීමකුත් ඉල්ලා කළ ජාතික විරෝධතාවය හමුවේ සෝමපාල මහතාට එල්ලවූ මාරාන්තික ප්‍රහාරයකට පාදක කර ගෙන පැවති 80 ජූලි මහවර්ජනය වසර තිහ සපිරීමත් එයින් අසරණව අනාථ වුන වර්ජන සේවක පවුල් වල නඩත්තුව සඳහා කතෝලික සභාව හා ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය දැක්වූ දායකත්වය සනිටුහන් කිරීමත්ය.

1980 වකවානුව වූ කලි 1977 මහා මැතිවරණයෙන් 5/6 ක බලයක් හිමිකර ගනිමින් උද්දාමයට පත්වූ රජයක් පාලනය කරන සමයකි. ගැහැනියක් මිනිසකු කිරීමත් මිනිසකු ගැහැනියක කිරීමත් හැරෙන්නට ඕනෑම කාර්යයක් කිරිමට හැකි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අප සතු යයි හඬ නැගූ රාජ්‍ය පාලකයකු සිටි සමාජයක වැඩ වැරීම රාජ්‍ය විරෝධී ක්‍රියාවක් ලෙස ගැනුන හොත් ප්‍රතිඵලය කුමක්ද යන්න සිතාගත නොහැකි වකවානුවක් එදා පැවතින.

මෙවන් තත්ත්වයක් හමුවේ අසරණවූ වැඩවර්ජකයනට ඔවුන්ගෙන් යැපෙන පවුල් වලට ආධාර උපකාර කිරීම අනර්ථකාරී ප්‍රතිඵල වලට මුහුණදීමට සිදුවන සේයාවන් හැම අතින්ම දිස්විය.

ඇතැම් දේශපාලකයෝ මැතිවරණ සමයකදී මනාපය ගතහැකි යයි ඊට අනුබලදී මැතිවරණයක් එනතුරු නිහඬව ඉවත බලා සිටින සෙයක් දිස්විය. කල දුටුකල වල ඉහගත් ප්‍රතිපදාවේ සිටි ඇතැම්හු බොරදියේ මාළු බෑමක යෙදුනහ. ජූලි වර්ජකයෝ තමන්ගේ අසරණ තත්ත්වය කියාපාමින් ආගමික නායකයන්ටද ආයාචනය කළහ.

එහෙත් කතෝලික සභාව හැරෙන්නට වෙන කිසිදු ආගමික නායකයකු ඔවුනට අත දීමට ඉදිරිපත් නොවිය. මා හට මෙම අවස්ථාවේ රත්නපුර ජූලිවර්ජක නායකයකුවූ පී. එල්. වින්සන්ට් කුරේ මහතා රත්නපුර යෙහියා ගෙ ාඩනැගිල්ල තුළ පැවත්වූ ජූලි වර්ජක රැස්වීමේදී එහි ජාතික සභාපති පී. අමරදිවාකර මහතා විසින් 'අප ජූලි වර්ජක අසරණ පවුල්වලට කතෝලික සභාව දුන් සහයෝගය ගෞරවපූර්වකව සිහිපත් කරමි යන ප්‍රකාශය මතකයට ලක්වෙයි. එවක අගරදගුරු තුමාත්, ජෝසප් ඇන්තනි මංචනායක මහතාත් ඒකාබද්ධව කරන ලද ක්‍රියාකලාපය තිස්වසර සපුරන මෙම අවස්ථාවේ ගෞරවපූර්වකව සිහිපත් කළ යුතුය.

ජූලි වර්ජක ප්‍රශ්නය සම්බන්ධව අවධියෙන් සිටි එවක ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාර ජාතික නායකයකවු ඇන්ටනි මංචනායක, එම්මැනුවෙල් පීරිස්, හියුගෝ අල්විස් වැනි නියමුවන් අග රදගුරු හිමිපාණන් හමුවී අසරණව සිටි වැඩකරන ජනතාවගේ දරු පවුල් වලට ආධාර කිරීමේ ඇවසියාව අවධාරණය කරනු ලැබින. ඒ අතර ජූලි වර්ජක නායකයන් විසින් ආධාර පතා ආගමික නායකයන්ට යැවූ ලිපිවල පිටපත්ද අගරදගුරු හිමිපාණන්ට ලැබී තිබුනි.

එහි ප්‍රතිඵලයක් ලෙස අගරදගුරු පදවියේ මීසම් වල ඉරුදින එකතු වන පඬුරු මුදල් තමන් වෙත යොමු කරන ලෙස දන්වනු ලැබින. ඒ අනුව කිතුනු කම්කරු නායකයන් විසින් අමරදිවාකර මහතා ප්‍රමුඛ කණ්ඩායම අගරදගුරු නිවසට කැඳවා අගරදගුරු හිමිපාණන් විසින් එකතුවූ රුපියල් එක්ලක්ෂ පනස්දහසක මුදල භාරදෙනු ලැබින.

එයින් නොනැවතුන කිතුනු කම්කරු නායකයන් විසින් කම්කරුවන් කෙරේ විශේෂිත අවධානයක් යොමුකරන පිණිස එවක බදුල්ල රදගුරු ලියෝ නානායක්කාර හිමිපාණන් හමුවී සාකච්ඡා කිරීමක්ද, මහනුවර රදගුරු වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ සහයෝගයෙන් ජූලි වර්ජකයනට ආධාර කිරීමටද ක්‍රියා කෙරින.

එදා ජූලි වර්ජනයට සහයෝගය පතා රැස්වීමක් තැබීමට ස්ථානයක් දීමටද හිමිකරුවන් බියවූයේ පාලක පක්ෂයේ අතවරයට ලක්විය හැකි නිසාය. එවන් පසුබිමක් තුළ සවන පාවුලු මධ්‍යස්ථානයේ C.W.M කාර්යාලය ඔවුනට රැස්වීම් තැබීමට ඉඩකඩ සැලසුවේද වැඩකරන ජනතාවගේ සුවසෙත අරමුණු කරගෙනය.

ජූලි වර්ජන ඉතිහාසය දෙස බැලීමේදී ඔවුනගේ ඓතිහාසික ජයග්‍රාහි වසරක් වූයේ 1989 යි. ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ මූලිකයන් විසින් රාජ්‍ය පාලන අධිකාරිය වෙත අවධානය යොමුකරවීමේ ප්‍රතිඵලයක් ලෙස ජූලි වර්ජකයන් හා එවක බස්නාහිර පළාත් විපක්ෂ නායක ඔසී අබේගුණසේකර මහතා සමග ජනපති ප්‍රේමදාස මහතා සාකච්ඡාවක් පැවත්වින. ඒ අනුව 1989 මැයි 2 ජනපති විසින් විශ්‍රාම වැටුප් සහිත හිගවැටුප්ද දිවිනසාගත් අය වෙනුවෙන් රුපියල් ලක්ෂය බැගින් වන්දියක්ද සංස්ථා සේවකයනට පාරිතෝෂිත මුදල් සහිත හිඟ වැටුප්ද අනියම් සේවකයන්ගේ හිඟ වැටුප්ද රැකියාවද දීමට සැලස්වින.

මෙම ජයග්‍රහණයට ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මූලිකත්වය ගත් නිසා ක්‍රිස්තියනි කම්කරු ව්‍යාපාරයේ ජාත්‍යන්තර උපාධ්‍ය පෘතුගිසි ජාතික ගරු ඩිමැන්ටලි පියතුමාගේ සහභාගිත්වයෙන් ජූලි වර්ජක උපහාර උලෙළක් පැවත්වින. එය ඇන්ටන් මංචනායක මහතා සංවිධානය කළ අතර මෙයට දස දෙස ගිහි ඇතුලු ගරු අර්නස්ට් පෝරුතොට, වින්සන්ට් ඩෙප්, රීඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු යන පියවරුද සහභාගිවූහ.

පසුව ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මෙහෙය වීමෙන් ජූලි වර්ජකයනට ආධාර පිණිස ආර්. ආර්. සමරකෝන් මහතාගේ 'කැලණිපාලම' නාට්‍ය පෙන්වූ අතර නන්දා මාලිනිගේ 'පවන' සංගීත ප්‍රසංගයද පවත්වනු ලැබීය.

එදා සී. අමරසේකර මහතා ජනමාධ්‍යයට කරන ලද ප්‍රකාශනයකට අනුව 40,000 ක් ජූලි වර්ජනයට එක්වූ අතර නැවත සේවයට පැමිණෙන ලෙස රජය කළ ඉල්ලීමට අනුව නයි පොලොගු වැනි සර්පයන් දෂ්ට කළ බවට අයදුම්පත්වල සටහන් කර ඇති නිසා 30,000 කට පමණ නැවත රැකියා ලැබෙන බවත් 12,000 කට පමණ රැකියා අහිමිවුන බවත් ප්‍රකාශ කර ඇත. මේ අනුව ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මැදිහත්කම තුළින් 1989 ලැබූ ජයග්‍රහණය නිසා ප්‍රශ්න විසඳිණි. ජූලි වර්ජක සංඛ්‍යාව සීමිත වී ඇත.

ලංකාවේ වැඩකරන ජනතාව වෙනුවෙන් ඇති එකම කතෝලික ගිහි සංවිධානය වූ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මැදිහත් විය. කතෝලික සභාවෙන් ලද අනුපමේය දායකත්වය ස්තුති පූර්වකව සිහිපත් කරනු ලබයි.

ක්‍රිස්තියානි කම්කරු
ව්‍යාපාරයේ
ජාතික සභාපති
**තියබෝල්ඩ් සමරතුංග**

දැල්වෙන පහන්

# පානදුරට පහනක්වූ කිතුනු ගිහියා
# මග්ගොන පීටර් ගුරුන්නාන්සේ

**විවිධ වාද - විවාද නිසා කිතුනුවන් උදාසීනව දිවිගෙවූ යුගයක් 20 වන සියවසේ පැවතියේය. එකල ඇතැම් කිතුනුවෝ සිය කතෝලික භාවය හෙළිකිරීමට පවා මැලිවූහ. පුනරුද ව්‍යාපාර වල බලපෑම තැන්තැන්හි දිස්විය. මෙබඳු යුගයක සැදැහැවතුන් පුබුදුවා ලීමට ගරු පූජාප්‍රසාදි වහන්සේලා හා එක්වීමට ඇතැමුන් පෙරමුණ ගත්තද නිසි අධ්‍යාපනයක් ලබාගතහැකි සිංහල කිතුනු විදුහලක් පානදුරේ නොමැතිවීම බලවත් අඩුවක් විය.**

මේ අඩුපාඩුව පිරිමසාලීමට දෙවිඳුන් දුන් තිළිණයක් බඳු කිතුනුවකු ලැබීම සැබවින්ම වාසනාවක් විය. වසර 1938 දී වාද්දුව මීසම් සේවකව සිටි ගරු ලීනස් ද සිල්වා පියතුමා පානදුර කෙළින් වීදිය (ආතර වී දියස් මාවත) අසල කිතුනු ඉංග්‍රීසි විදුහලක් ගෙ ාඩනැංවිය. රටගැන හිතන්නට "සිංහලයන්ට සිංහලෙන් ඉගැන්විය යුතුය" යි පැවසූ වදන් නිබොරුවන ලකුණු පහළ වන්නට විය. ඉංග්‍රීසි විදුහලට යාබදව සිංහල කතෝලික විදුහලක් ඒසමයේම බිහිවිය. එය පානදුරේ රෝමානු කතෝලික සිංහල මිශ්‍ර පාඨශාලාවයි. මෙහි දෙවන ලොකු ගුරුතුමා වූයේ අප ප්‍රස්තුතය වූ ඒ. පී. ප්‍රනාන්දු මහතාය. (මග්ගොන පීටර් ගුරුනාන්සේ) වසර 1909 දී මග්ගොනදී උපත ලබා මග්ගොන කතෝලික විදුහලින් අත්පොත් තැබූ එතුමා මග්ගොන ගුරු ඇබෑසි විදුහලෙන් ගුරු පුහුණුව ලැබීය. වසර 1941 දී පානදුර රෝමානු කතෝලික විදුහලට මෙතුමාව විදුහල්පති වශයෙන් පත්කරන ලදී. එකල 60 ක් වැනි සුළු සිසු සිසුවියන් හා ගුරුවරුන් 3 කගෙන් සමන්විතවූ මෙම විදුහල මෙතුමා වසර 1959 දී මාරුවී යන විට සිසු සිසුවියන් 700 ක් පමණ සහ ගුරුවර ගුරුවරියන් 21 ක ගුරුමණ්ඩලයකින් සමන්විත වූයේ මෙම ගුරු පියාගේ දූරදක්නා නුවණ, මනා පරිපාලනය හා ආත්මපරිත්‍යාගශීලී සේවය නිසාය. ජාති - ආගම් භේද නොසලකා සැමට එකසේ සැලකීම මෙම විදුහල නොබෝ දිනකින් ජනාදරයට පත්වීමට හේතුකාරක විය. විද්‍යොදය සරසවියෙන් ශාස්ත්‍ර විශාරද වාගීශ්වර පණ්ඩිත උපාධිය ලත් ගුරුතුමා ජංගම පුස්තකාලයක් විය. සිරුරෙන් කුඩා වුවද සිය පෞරුෂය නොනසා තබාගත්තේය. විදුහල සෑම අංශයකින්ම උසස් තත්ත්වයකට පත්කිරිමට ඇදුරු මඬුල්ලේ මෙන්ම දෙමාපියන්ගේද පූර්ණ සහයෝගයද ලබාගත්තේය. සුදු රෙද්දකින් සහ සුදු කබායකින් සැරසී සිටි ඔහු උදෑසන දැකීම මංගල කරුණක් ලෙස ප්‍රදේශ වාසිවූ සැලකූහ.

### රැකවරණය හා අධ්‍යාපනය

එතුමා පියෙක් ලෙස සිය විදුහලේ ගුරු මඬුල්ලද සිසු සිසුවියන්ද ආරක්‍ෂා කළේය. එතුමාගේ මූලික ඉලක්කය වූයේ තම සිසුදරුවන් සමාජයේ නැංවිය හැකි උසස් තැන්වලට ගෙනයාමය. රජයේ අධ්‍යාපනික පරීක්‍ෂණවලින් සෑම වසරකම උසස් ප්‍රතිඵල දරුවනට ලබාදීමට හැකිවූයේ ගුරු දෙගුරු සබැඳියාව තිබුණු නිසාය. ගාලු පදවියෙ ෘගරු මොල්ලිගොඩ මෝසස් පෙරේරා පියතුමා සහ පාර්ලිමේන්තු මැතිසබයේ පළමුවන 'හැන්සාඩ්', සිංහල වාර්තාකරු වන සරික්කාලිමුල්ලේ ඩබ්ලිව්. මතියස් එම්. ප්‍රනාන්දු මහතා (දැනට ජාඇල පදිංචි) වැනි මිණිකැට මේ විදුහලින් බිහිවිය. පානදුර බෞද්ධ ජනතාවද එතුමාට විශේෂ ආදර ගෞරවයක් දැක්වූහ. වසර 1959 දී එතුමා ඉහත පාසලෙන් මාරුකරන ලද අවස්ථාවේදී එය අවලංගු කරගැනීමට පානදුර බෞද්ධ පිරිසක් අතිඋත්තම අග්‍රරාජගුරුප්‍රසාදීන් වහන්සේව හමුවීමටද ගියහ.

### විෂය බාහිර අධ්‍යාපනය

සිංහල යතුරු ලියනය හා කෙටිකුරු (Shorthand/ Typing) පුහුණුව මෙතුමා මෙම විදුහලේ ආරම්භ කළේය. ක්‍රීඩා සඳහා වෙසෙසි උනන්දුවක් දැක්වූ බැවින් සුදුසු ගුරුවර, ගුරුවරියන් යොදවා පුහුණු කිරීම් කළ නිසා පානදුර අනෙක් පාසල් පරදවා ලැබූ ජයග්‍රහණ ජනතා ප්‍රසාදය වඩාත් ලැබීමට හේතුවක්ද විය. සරඹ සහ නාට්‍ය තරගවලදි මෙතුමාගේ පාසල ප්‍රථම ස්ථානය දිනාගත්තාවූ අවස්ථා බොහොමයකි.

### උසස් අධ්‍යාපනය

කතෝලික සභාව විසින් ගුරු ප්‍රවේශ පන්ති පැවැත්වීමට මෙතුමාගේ පාසලටද අවසර දෙන ලදී. සිසු සිසුවියන්ගෙන් ඉතා සුළු මුදලක් ගත් අතර අපහසුතා තිබූ අයට නොමිලේ අධ්‍යාපනය ලබා දුන්නේය. මෙතුමා නිසා ගුරුවර ගුරුවරියන්ද විශාල සංඛ්‍යාවක් බිහිවූහ.

### ගායනා කණ්ඩායම

ගරු ජෝශප් ජයසූරිය පියතුමා වසර 1942 දී මෙතුමා පානදුර දේවස්ථානයේ ගායනා කණ්ඩායම් නායකයා ලෙස පත්කළේය. ඕගන් භාවිතය ප්‍රචලිතව නොතිබූ එකල තමන් සතු සර්පිනාව රැගෙන මීසමේ අනෙක් දෙව් මැඳුරුද කරා ගොස් දරු දැරියන් දෙවිඳුන් පැසසුමට යොම ුකරන ලද්දේ ස්වෙච්ඡාවෙනි. මෙතුමාගේ ආදර්ශයෙන් ගරු පියතුමන්ලාගේ මඟපෙන්වීම සහ අනුශාසකත්වයෙන් මීසමේ සෑම දෙව්මැඳුරකම ගායනා කණ්ඩායම් බිහිවිය. පානදුර දේවස්ථානයට අයත් සියළුම පාහේ සැදැහැවතුන්ගේ අවමංගල්‍ය කටයුතු සඳහා මෙතුමා තනිවම හෝ සහභාගි වී යාච්ඤා හා ගීතිකා කටයුතු සංවිධානය කළේය. පුරා වසර 30 ක් පමණ වූ දිගුකලක් ගායනා කණ්ඩායම මෙහෙයවා වසර 1974 දී ඉන් ඉවත් විය.

### දෙව්මවුන් වෙත බැතිය සහ කතෝලික සාහිත්‍ය සේවය

එතුමා ග්‍රන්ථ කරණයේ නියැලෙමින් විශේෂයෙන් කතෝලික පොත් රාශියක් පළකළේය. දෙව්මවුන් වෙත විශේෂ භක්තියක් දැරූ මෙතුමා ඒ යුගයේ පළවූ 'කන්නි මරියාගේ හැටි' නමැති ඉතා නින්දිත සහ අශ්ශීල පොතට විරුද්ධව "මෙන්න මරිය කුමරිය" නමින් විශිෂ්ඨ කෘතියක් ලියා පළකර මැණියන් වහන්සේ වෙනුවෙන් ප්‍රසිද්ධ වේදිකාවල දේශනා පැවැත්විය. එමනිසා එකලදී අප කතෝලික සභාව එතුමා හැඳින්වූයේ "පානදුර රිදී සීනුව" නමිනි. පානදුර දේවස්ථානයේ සියළුම උත්සවයන්හිදී ඉතා සාරවත් පිළිගැනීමේ සහ ස්තුති කතාවන් වසර ගණනාවක් පුරා කරන ලද්දේ මෙතුමා විසිනි.

ගුවන් විදුලිය මගින් කෙරුනු "දවසේ සිතුවිලි" කථාව පැවැත්වීමටද මෙතුමා වාසනාවන්ත විය. කලක් මෙතුමා මරිය හමුදාවේ සිංහල අංශය විසින් පළකළ "මරිය හඬ සඟරාවේ සංස්කාරක ධූරයද හෙබවිය. පාසල් රජයට ගත් කාලයේදී පිහිටවූ සමස්ත ලංකා කතෝලික ගුරු සංගමයේ ප්‍රථම ලේකම් තුමා වූයේද මෙතුමාය.

ගුරු වෘත්තියෙන් විශ්‍රාම ගත් පසු මෙතුමා ප්‍රසිද්ධ නොතාරිස් වරයකු ලෙස මියයන තුරුම කටයුතු කළේය. එවකට පැවති රජය විසින් මෙතුමා මුළු රටටම බලපාන පරිදි සාමවිනිසුරු වරයකු ලෙස 1985 දී පත් කරන ලදී. කතෝලික සභාව විසින් වසර 1987 දී පවත්වන ලද කතෝලික සාහිත්‍ය උලෙලේදී කිතු නන්දන ප්‍රණාමයද මෙතුමාට පුද කරන ලදී.

එතුමා විශ්‍රාම ගත් අවස්ථාවේදී ආදි ශිෂ්‍යයන් විසින් සංවිධානය කළ උත්සවය සඳහා පළ කළ "ගුරු සේවයක සිහිවටනය" නමැති පොත් පිංචෙ මෙසේ සටහන් වේ. දිනක් එතුමාගේ පාසලට පැමිණි පාඨශලා පරීක්‍ෂකවරයකු එතුමාගේ උගැන්වීම පිළිබඳව මෙසේ සටහනක් කර ඇත. "ඔය විදියට උගන්වනවානම් මාත් වාඩිවී ඉගෙන ගන්නට සතුටුයි."

ඥානාර්ථ ප්‍රදීපය කතෝලික පුවත් පතට නිතර සාරවත් ලිපි ඉදිරිපත් කළ මෙතුමා පහත සඳහන් හරබර කතෝලික පොත් රාශියක් කළේය. ඒවා වනගත අඟණ, නාසරෙත්හි පුෂ්පය, ගිනි දේවි, සේවියර් බණ්ඩාර, සා. ජෝන් බොස්කෝ, තෙරේසා නියුමන්, මග්ගොන කතෝලික ඉතිහාසය, කතෝලික සභාව සහ විද්‍යාව, විද්‍යාව හා මැවීම. මාක්ස් වාදය, දෙවියන් වහන්සේ, රුසියන් මායිම් මාලාව, කතෝලික ප්‍රයත්නය, කතෝලික පූජකවරයා හා ලෝක ශිෂ්ඨාචාරය, යක්ෂයාගේ දේශනාව, මරිය වහන්සේ, මෙන්න මරිය කුමරිය, රෝමයේ සිරකරුවා, පානදුර මීසමට වසර 50 ක් පිරීම යනාදියයි.

එවකට කතෝලික පාඨශාලා සාමාන්‍යාධිකාරි අති ගරු ඩී. ජේ. ඇන්තනි පියතුමා මුලසුනේ සිටි සම්මේලනයකදී අප ගුරුතුමා "සිංහල කතෝලික සාහිත්‍ය" යන මැයෙන් කළ ව්‍යක්ත කථාවේදී කතෝලික සාහිත්‍යයට සේවය කළ කතෝලික ගිහි පැවිදි උතුමන් රාශියකගේ දිගු විස්තරයක් ඉදිරිපත් කර ඇත. මුලසුනේ කථා වාරයේදී අති ගරු ඇන්තනි පියතුමා මෙසේ පවසා ඇත. "ඒ. පී. ප්‍රනාන්දු මහත්මයා සිංහල සාහිත්‍ය ගැන බොහොම සාරවත් කථාවක් කළ නමුත් ඒ කථාවේ බොහොම ලොකු එක අඩුපාඩුවක් තිබෙනවා. එනම් එම මහතාගේ නම එම ලැයිස්තුවට ඇතුලත් නොකිරිමයි."

සිය දහමටත් පොදුවේ මව් බිමටත් විශේෂ සේවාවක් ඉටුකළ මේ හෙළයාට ඒ සඳහා සිය බිරිඳවූ ලූසී ප්‍රනාන්දු ගුරු මැණියන්ගෙන් මහත් සහයෝගයක් ලැබිණි. පින්වත් දූ පුතුන් 5 දෙනෙකුගේ දයාබර පියකුවූ මෙතුමා වසර 2002 ඔක්තෝබර් 24 වනදා සැමගෙන් සමුගෙන සගපුර දිනීය. මෙතුමාගේ දේහය පානදුර දේවස්ථානයට ගෙන ආ අවස්ථාවේදී ලංකා කතෝලික සභාවේ ශ්‍රේෂ්ඨයන් විසින් එතුමාගෙ න් සභා මාතාවට සිදුවූ සේවය අගැයීමක් ලෙස දිව්‍ය පූජායාගයක් පැවැත්වීමට අවසර දෙන ලදී. එයද එතුමාගෙන් සිදුවූ විශිෂ්ඨ සේවයට කදිම සාක්ෂියකි.

**පානදුරේ පී. ඩී. ජී. කෙලමන්ට්**
විශ්‍රාමලත් ප්‍රධානාචාර්ය

## පූජක දිවියේ විසිපස් වසරක් සපිරූ ගරු ජෝ කුරේ පියතුමන්හට කැපුන්ගොඩින් පිදෙන උපහාරයකි

*සැරදේ පියතුමෙනි!*

අඳුර මකාලන පහන් සිළුවක්සේ අප අතරට පැමින පුරා පස් වසරක් අධ්‍යාත්මිකව අප පෝෂණය කළ අදරැති පියතුමෙනි ඔබ තුමන්ගේ පූජක දිවියේ විසිපස් වසරක් නිමා වූ මේ මොහොතේ පැතීමට ආසිරි මටද අවසර

**කැපවූ සේවෙට දෙව් සමිඳුන්ගේ**
**අදරැති පියතුමෙනි ඔබ තුමගේ**
**ගෙවිලා විසි පස් වසරක් එමගේ**
**පතනෙමු ආසිරි දෙව් සමිඳුන්ගේ**



තබාගෙන නිරන්තර සිනහ වත කමල තුළ ඇමතුවා සැමදෙන පුතා යනුවෙන් කියා රැඳී තිබුනේ වදන් සෙනෙහෙබර මුවගේ පිබිදුනා මුළු ගමක් ඔබගෙ කටහඬ තුළින් කෙරුවෙ ආරාධන ජේසු තුළ ගමනකට ගියා ඒ ගමන අප ඔබ තුමන් සමගින්ම නිමා වූවත් පියේ ඇසුරු කළ පස් වසර රැඳී ඇත අප තුළ ලබාගත් පෝෂණය පියතුමෙනි ඔබ හට පතනෙමුව සැම විටා මරිමවුන් සමගිනා දෙව් වරම් ලබනටා

**රංජනී මුතුකුඩආරච්චි**
කැපුන්ගොඩ

## දැහැමින් කිතු සමිඳුන් සෙවූ මානව හිතවාදියෙකි ඔබ

**භක්තිමත් කතෝලිකයකු මෙන්ම සැබෑ මානව දයාව පිළිබිඹු කරමින් ආගමික, සමාජයීය හා පොදු යහපත වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ දුර්ලභ ගණයේ ජනතා සේවකයකු වූ බෝපිටිය ඒපාමුල්ලේ ජෝර්ජ් හල්පේ මහතා සගසුව දිනීය.**

ඒ මහතා මෙසේ වියෝවූයේ එවැනිම සමාජ සේවිකාවක වූ තම දයාබර බිරිඳ මානෙල් ජයමහ මහත්මියද සගසුව දිනා සතියකින් පසුවය. වැල්ලබඩ ශුද්ධ වූ ජූඩ් තද්දේවුස් මුනිඳුන්ගේ දෙව්මැඳුර ගෙ ාඩනැගීමෙහි මූලිකයෙක්වූ හල්පේ මහතා මරිය හමුදාවේ සහ තවත් සමිති ගණනාවකටම ක්‍රියාකාරී සාමාජිකයෙක් විය.

ලෝහෝර් ආර්යාණය අරමුදලේ සහ රාජ්‍ය ස්කාගාර සංස්ථාවේද උසස් නිලතල දරමින් අගනා සේවයක් කළ හල්පේ මහතා ජනෝදය සජීවකයකු ලෙස අසරණ සරණ කටයුතු කරමින් නැති බැරි අයට සහන සැලසීය. පොදු ජනයාට එරෙහි අසාධාරණ ක්‍රියාවලට විරුද්ධව නිතර හඬ නැගූ ඒ මහතා ජේසුස් තුමාගේ සැබෑ



අනුගාමිකයෙක් බව වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්ද ඔප්පු කළේය. ඒ මහතාට සහ මහත්මියටද සදා මොක්සුව පතමු.

**එස්. කේ. ජේ. කුරේරා**

## වැලිවිට දහම් සේවිකාවකගේ නික්මයාම

**කිසියම් පුද්ගලයකුගේ සිය ජීවිතයේ සැඳෑ සමයේ ඒකායන පැතුම යහපත සිදුකිරිම තුළින් සුබ මරණයක් ලබාගෙන මරි මව සෙවණට පිවිසීමය. සිය දෙමාපියන් උපන්ගෙයිම හිරකොට, තනිකොට ඩොලර්, පවුම්, ඩිනාර් සහ විවිධ වරදාන පතා විදෙස් රටවලට පියාඹන දරුවන් සිටින යුගයක දරුවන්, මුණුපුරන්, මී මුණුපුරන් 40 දෙනෙකු පමණ තමා අවටම රඳවාගෙන සිය දිවියේ සැඳෑ සමය ගතකරනට තරම් වාසනාවක් ලද 1928.02.23 වන දින මෙලොවට ජනිතවූ වැලිවිට පව්ස්තිනා කොඩිකාර මහත්මිය අසූ පස්වන වියේ දී සුබ මරණයකට හිමිකම් පෑවේ කිසිඳු වේදනාවකින් තොරවය.**

වැලිවිට සා. මරියා දේවස්ථානයේ හතවරන නුවාන කොට්ඨාශය නියෝජනය කරමින් නුවාන මූලිකයකු ලෙසින් මීසම් ධර්මසේවා සභාවේ ජ්‍යෙෂ්ඨතම සමාජිකාව ලෙසින් මීසම් සභාව නියෝජනය කරමින්ද, මරිය හමුදාවේ



සභාපති, උපසභාපති ලෙස දීර්ඝ කාලීනව සාමාජිකත්වය ලබමින්ද, ශ්‍රී හෘද සමිතිය, වැඩිහිටි සමිතිය ආදී විවිධ සංවිධාන ඔස්සේ සංසයේ සියළුම ආධ්‍යාත්මික සේවාවන්හි නියැලෙමින් කෙනෙකුගේ උපතේදී, විවාහ මංගල්‍යයකදී රෝගීව අසරණ වූ විටදී සහ රෝහල් ගතවීමකදී වේවා නොපැකිල එතැනට ගොස් යාච්ඤා මෙහෙයයන්, ශුද්ධවූ පැය සංවිධානය කරමින් වැලිවිට දේවස්ථානයේ සේවයට පැමිණෙන ගරු පියවරුන් පැවිදි සොයුරියන් හටද ආදරබර අම්මා කෙනෙකු/ සොයුරියක වෙමින් ඇවැසි සියළුම ආධාර උපකාර නොපැකිලව ඉටුකරමින්, සියළුම ආගමික කාර්යයනට දිවා රෑ නොබලා අතහිත දෙමින් ඥානාර්ථ ප්‍රදීපය, භක්ති ප්‍රබෝධනය ආදී කතෝලික ප්‍රකාශනයන් 4 වන නුවාන කොට්ඨාශය වටා පා ගමනින් ගොස් බෙදාහරිමින්, කිසිදු වරප්‍රසාදයන්. තාන්න මාන්න නොතකා වැලිවිට මීසම් අවට මීසම් වාසීන්ගේ පවා නොමඳ පැසසුමට ලක්වෙමින්, දුගී දුප්පත්, පොහොසත්, උසස්, පහත් කිසිදු භේදයකින් තොරව සැමටම එකහා සමානව සලකමින් සිට පසුගිය මැයි මස 05 වන දින දැයෙන් සමුගත්තේ 85 වන වියේදීය. එතුමියගේ ආත්මයට නිත්‍ය සැතපීම ලැබෙන ලෙස අපි දෙවිඳුන් යදිමු.

**වැලිවිට එම්. ජෝ. පාරිස්**

## භාග්‍යවත් ජුසේවාස්.... 1 පිටුවෙන්

පැවිදි හා ගිහි සැදැහැවත් ඔබ සැමගෙන් ඉල්ලා සිටිනුයේ එබැවිනි. භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් ශුද්ධවන්ත භාවයට එසැවීම සඳහා වන ක්‍රියාවලිය සඵලමත් කරගැන්ම සඳහා අප ලද මෙම අවස්ථාව, සැබැවින්ම මෙම විශ්වාසයේ වසර තුළ අප ලැබූ මහඟු දේව වරප්‍රසාදයක් බව නිසැකය.

එබැවින්, අපගේ සියළුම මීසම් වල, පැවිදි නිවාස වල, සියළු කතෝලික පවුල් වල, කිතුනු පාසල් වල සහ ආයතනයනවල භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් ශුද්ධවන්ත භාවයට එසැවීම සඳහා වන යැදුම භක්තියෙන් උච්චාරණය කිරීම ඉතාමත් වැදගත් වේ. එලෙසම, පවුල් ජපමාල උච්චාරණයෙන් අනතුරුව එම යැදුම් මෙන්ම භාග්‍යවන්ත ජුසේ වාස් මුනිඳුන්ගේ ගීතිකාව ගායනා කිරීම ද අතිශයින් වැදගත් වනු ඇත. ඉරුදින දිව්‍ය පූජාව අවසානයේදී ද එසේ කිරීම වැදගත්වේ.

මෙම ඔක්තෝබර් මාසය තුළ, අපගේ අසහාය අපොස්තුළුවරයාණන් වන භාග්‍යවන්ත ජුසේවාස් මුණිඳුන්ගේ ආදර්ශමත් දිවි පැවැත්ම අනුකරණය කරමින් ලෙඩුන් බැහැදැකීම, දිළිඳුන්ට ආධාර දීම ආදී පුණ්‍ය ක්‍රියාවන්හි වඩාත් ජ්වලිතමත් කමින් නිරත වීම ද මෙම දේව වරම වෙනුවෙන් ඉටුකරන ලෙස ඉල්ලා සිටිමු.

එකම ශ්‍රී ලාංකීය කතෝලික සභාව ලෙසින් අප එකට එකතුව උද්යෝගිමත් ලෙස ගැඹුරින් හා භක්තියෙන් යාච්ඤා කරමු නම්, අප භාග්‍යවත් අපෝස්තුළුවරයාණන් විශ්වීය සභාවේ සාන්තුවර සංඛ්‍යාවට ඇතුළත්කිරීමේ මහා වරප්‍රසාදය අප වෙත ඉක්මනින් උදාවනු නියතය.

**අති උතුම් වියානි ප්‍රනාන්දු රදගුරු හිමි - සභාපති**
**ගරු ඇන්තනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා - ලේකම්**
භාග්‍යවන්ත ජුසේ වාස් කාර්යාලය
රදගුරු නිවස
873, පේරාදෙණිය පාර
මහනුවර

## අපොල්ලොස්ගෙවත්, පාවුළුගෙවත්... 1 පිටුවෙන්

පාවුළුගේවත් කණ්ඩායමට නොව ක්‍රිස්තුන් වහන්සේගේ කණ්ඩායමට බව සදහම් මෙහෙවර කණ්ඩායම අවධාරණය කර සිටි.

බයිබලීය වචනය ගැන පමණක්ම විවිධ තාක්ෂණික ශබ්ද නාද හමුවේ ජනතාව කාල සීමාවකට කොටු කරනු ලැබුවත් දිව්‍ය පූජාවෙන් ලබන අධ්‍යාත්මික ශක්තිය ලබාගන්නට ඉන් නොහැකි බවත් සක්‍රමේන්තු අත්දැකීම තුළින් ලබන ශක්තිය එකී ජනරැළි තුළ ලැබීමට නොහැකි බවත්, සිහිකැඳවන සදහම් මෙහෙවර කණ්ඩායම මීසමේ දේවස්ථානය වටා පමණක් ඒකරාශී වී දහම අදහන්නේ නම් එයම වටින බව අවධාරණය කරයි.

## පකිස්ථාන ප්‍රහාරයට විරෝධය

*ඉකුත්දා පකිස්තානයේ පෙෂාවාර් සියලු සාන්තුවර දෙව්මැඳුරේ 83 දෙනෙකු ජීවිතක්ෂයට ලක්වූ ප්‍රහාරය පිළිබඳව ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය මූලස්ථානයේ පැවති විශේෂ රැස්වීමකදී සාකච්ඡාවට බඳුන් විය.*

ජාතික සභාපති තියබෝල්ඩ් සමරතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති තත්රැස්වීම ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ දකුනු ආසියා කලාපීය නියෝජිත ඇන්ටනි මංචනායක මහතා දකුණු ආසියාවේ නැගී එන ආගමික අන්ත වාදයේ රැල්ල විශේෂ අවධානයට ලක් කරමින් ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාර මහ ලේකම් බෙටිනා බියුටේ සොයුරියත් අවධානයට ලක් කළ යුතු බැව් පැවසීය. මේ පිළිබඳව සාකච්ඡාවට ජාත්‍යන්තර සම්බන්ධිකාරක ශිරාන් මෛත්‍රි, ජාතික ලේඛිකා සුධර්මා පෙරේරා, උප ලේකම් කාන්ති වර්ණකුල හා අයිරින් ප්‍රසාද මහත්මින්ද කොළඹ පදවි සභාපති ජෙරාඩ් ඩයස් මහතා ද අදහස් දැක්වූහ.

## සදු සාමය දිනති

බලගල මීසම් සේවක ගරු ජූඩ්රාජ් ප්‍රනාන්දු පියතුමාගේ දයාබර පියාණන් වූ ගොඩ්වින් ප්‍රනාන්දු මහතාද පේරලන්ද මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි පියතුමාගේ දයාබර මෑණියන් වූ බී. පවුලින් වැනීෂියා පෙරේරා මහත්මියද, කොළඹ අගරදගුරු මැඳුරේ සේවය කළ වැලිහේනේ රොබට් ප්‍රනාන්දු පුල්ලේ මහතාද ඉකුත් දිනවල සග සුව දිනූහ. එම ආත්මයන්ට සදා සාමය පතා යදින්නැයි ප්‍රදීපය ඔබ සැමගෙන් ඉල්ලා සිටී.



පේරලන්ද ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ මීසම් සේවක ගරු පැට්‍රික් පෙරේරා පියතුමාගේ මෑණියන් වූ බී. පවුලින් වැනිෂියා පෙරේරා මහත්මිය නොබෝදා දිවියෙන් සමුගත්තාය. දේහය මිහිදන් කිරීම සඳහා රැගෙන ගිය අවස්ථාව මෙහි දැක්වේ. ගරු පැට්‍රික් පෙරේරා පියතුමාද බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල මහතාද ඥාති මිත්‍රාදීහුද ඡායාරූපයේ වෙති. **(නිමල් පෙරේරා)**

# දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් පිළිබඳව පළවන ප්‍රහේලිකා




**හරහට (12 න් පහල)**
1. කුරේ හිමියන් මෙම නුවණින් පූර්ණවුවෙකු බව කාගෙත් මතයයි.
4. කුරේ හිමිපාණන් උපන්නේ මීගමුවේ සිට සැතපුමක් ඇතින් පිහිටි මෙම ග්‍රාමයේ ය.
6. මෙතුමා මෙම සෞන්දර්යයට බොහෝ සේ ඇලුම් වූවෙකි.

**පහළට**
2. කුරේ හිමිපාණන්ගේ ප්‍රියතම තනි අකුරේ ශාකය මෙයයි.
3. මෙම ධූරයෙන් පිදුම් ලැබූ ප්‍රථම සිංහල ජාතික පියතුමා මෙතුමාය.
5. කුරේ හිමිපාණන්ගේ නමේ කොටසකි.

**අගරදගුරු පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථානය අගරදගුරු මැදුර කොළඹ 08. ඔක්තෝබර් 05 ට පෙර මෙම ලිපිනයට එවන්න.**

**හරහට (16 න් පහල)**
1. කුරේ හිමිපාණන් විසින් කැකිරාව මීසමේ ඇති කළ කතෝලික ගම්මානයකි.
3. දිළිඳු යන්නට තවත් පදයකි.
6. කුරේ හිමිපාණන් උපන්නේ 1909 වර්ෂයේ මෙම මාසයේදීය.
8. උන්වහන්සේ නිදාගත්තේ මෙම ලණුවලින් වියන ලද ඇඳක පැදුරක් දමාගෙනය

**පහළට**
1. මෙම ධූරයෙන් පිදුම්ලැබූ ප්‍රථම සිංහල ලාංකීක පියතුමා මෙතුමාය.
2. ලංකා අප ස්වාමිදූ වෙනුවෙන් කුරේ හිමිපාණන් විසින් ප්‍රදානය කළ උතුම්ම තිළිණය ලෙස සැළකිය හැකි බැසිලිකාව පිහිටියේ
5. කුරේ පියතුමන් මෙම නුවණින් පරිපූර්ණ පුද්ගලයෙකු බව කාගෙත් විශ්වාසයයි.
7. මෙතුමා අගරදගුරු ධූරයට ඔසවනු ලැබුයේ 1947 වසරේ මෙම මාසයේදීය.







**හරහට (18 න් පහල)**
2. කුරේ හිමියන්ගේ පියාගේ නම මෙයයි.
4. කුරේ හිමියන් කාදිනල් ධූරයට නම් කෙරුණේ 1965 වසරේ මෙම මාසයේය.
5. සාන්තුවරයට එසවීම සඳහා යෝජනා කිරීමෙන් ඒ සඳහා ශුද්ධාසන අනුමැතිය ලැබීමෙන් පසු එකී පුද්ගලයා හඳුන්වනු ලබන්නේ මෙම නාමයෙනි.
8. මෙතුමාගේ දේහය බැසිලිකාවේ දෙව්මැදුරේ මෙම මහලේ තැන්පත්කර ඇත.
10. බිෂොප්ධූරය එකළ ගැමියන් හැඳින්වූයේ මෙනමිනි.

**පහළට**
1. මෙම ධූරයෙන් පිදුම් ලැබූ ප්‍රථම ස්වදේශිකයා කුරේ පියතුමන්ය.
3. මෙතුමා විසින් ගොඩ නැගුනුකාගම කතෝලික ගම්මානය අයත්වන්නේ මේ මීසමටය.
6. කුරේ හිමිපාණන් විශ්‍රාමිකව සිටියේ තේවතු පුදබිමේ මෙම නිවසේය.
7. එකල ගැමියන් කුරේ හිමිපාණන් හැඳින්වූයේ මෙනමිනි.
9. සොබා ධර්මයට ප්‍රියකළ කුරේ හිමිපාණන් විද්‍යා වේදියෙකුවේ.
11. කාදිනල් හම්පාණන් අයත් වූ නිකාය කෙටියෙන් හඳුන්වන්නේ මෙලෙසයි.

## හෙළ සංගීතයේ පෙර ගමන්කරු

සුනිල් සාන්තයන් ගේ
අමරණීය ගී පෙළහර
ලංකා ලංකා
98 වන ජන්ම වස් සැමරුම
අයිවෝ ඩෙනිස්, වික්ටර් රත්නායක, සුනිල් එදිරිසිංහ,



ටී. එම්. ජයරත්න, එඩ්වඩ් ජයකොඩි,
දීපිකා ප්‍රියදර්ශනී, ක්‍රිස්ටෝෆර්
පෝල්, දර්ශන ප්‍රමෝද්, දෙව්මිණි
ප්‍රනාන්දු ඇතුළු ශිල්පීන් රැසක ගේ
සහභාගිත්වයෙන්, චන්න විජේවර්ධන
ගේ නර්තනයෙන් සහ රෝහණ
වීරසිංහ ගේ සංගීතයෙන්
2013 ඔක්තෝබර් 05 වන දා
ප.ව. 6.00 ට
කොළඹ මියුසියස් රංග ශාලාවේ දී

## මීගමුවේ තිල්ලන්දූව දෙව්මැඳුරට පුටු පරිත්‍යාගයක්

වත්තල පාර්ලිමේන්තු මංත්‍රී ජෝන් අමරතුංග මහතා විසින් පසුගිය වසරේ ඇඳි පුටු 143 ක් සහ මේ වසරේ ඇඳි රහිත පුටු 62 පරිත්‍යාග කර ඇතැයි දේවස්ථාන ආරංචි මාර්ග පවසයි.

ඔක්තෝබර් 13 වනදා සිට සෑම මසකම 13 වෙනිදා සහ දෙසැම්බර් 08 වන දින ජාඇල පාරිස් පෙරේරා මාවතේ ගර්භවාස දේව මාතා මණ්ඩපයේදී රෝස කුසුම නුවානය හා දිව්‍ය පූජාව පැවැත්වේ.
එදින උදේ 11.45 ට එම දෙව්මැඳුරට පැමිණෙන්නට ආරාධනා.

## වැලිවිට දහම් සේවිකාවට සාම විනිසුරු පදවියක්



කඩුවෙල, වැලිවිට ප්‍රදේශයේ කීර්තිමත් ආයුර්වේද වෛද්‍යවරියක් වන දෝන ඉවෝන් නිර්මලා කවිරත්න මහත්මිය අධිකරණ අමාත්‍යාංශය මගින් මුළු දිවයිනටම බලපාන පරිදි සාම විනිසුරු පදවියකට පත්කොට ඇත.

1979 වසරේ සිට අද දක්වාම අඛණ්ඩව වැලිවිට සුනිමල දහම් පාසලේ දහම් ගුරුවරියක ලෙසද, මීසම් ධර්මසේවා සභාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක ලෙසින්ද, වැලිවිට සා. මරියා දේවස්ථානයේ සියලුම ධර්මදූත කටයුතු වලට අතහිත දෙන නිර්මලා මහත්මිය මියගිය කීර්තිධර වෛද්‍යවරයකු වශයෙන් ප්‍රදේශයට අමිල මෙහෙවරක් ඉටුකළ ඒ. කේ. ඩී. ධර්මසේන මහතාගේ දියණියකි.

**(වැලිවිට එම්. ජෝ. පාරිස්)**

## මංගලඑළියේ සංගීත ප්‍රසංගයක්

මංගලඑළිය මීසමේ ශු ස්නාවක ජුවාම් තරුණ සමිතිය මගින් මීසමේ ජයන්ති ශාලාව ඉදිකිරීමට ආධාර පිණිස සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු යොදා 2013 ඔක්තෝබර් මස 05 වන සෙනසුරාදා රාත්‍රි 8.00 මංගලඑළිය පොදු ක්‍රීඩාංගනයේදි පැවැත්වේ මේ සඳහා ප්‍රවේශ පත්‍ර එදින මිලදි ගත හැකිය. මීසම් සේවක ගරු බෙනට් රත්නසිංහ පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙහි කටයුතු සංවිධානය කෙරෙන අතර මීට එක්වීමට තරුණ සමිතිය ඔබටද ඇරියුම් කරයි.

## යොවුන් දිනයට සැමගේ පැසසුම් !



බෝපිටිය සා. නික්ලස් දෙව් මැඳුරේ තරුණ දූ පුතුන් වෙනුවෙන් මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමාගේ අධීක්ෂණය යටතේ මීසමේ තරුණ සවිය දොන් බොස්කෝ තරුණ කැල සංවිධානය කළ එක් දින 'යොවුන් දිනය' ඉතා සාර්ථකව දවස පුරාම තරුණ කටයුතු උපාධ්‍යය ගරු අනුර සිල්වෙස්ටර් පියතුමා ප්‍රමුඛ කණ්ඩායම ඉතා අනගි ලෙස මෙහෙයවීය. විනෝදය, සාකච්ඡාව හඳුනාගැනීම සහ අධ්‍යාත්මික පෝෂණය මෙමගින් තරුණ දූ පුතුන් හට ලැබුණි. මීසම්වාසි සැදැහැවතුන්ගේ නොමසුරු ද්‍රව්‍යමය හා මූල්‍යමය ආධාරයෙන් මීසම් දහම් සේවා සභාවඋදේ දහවල් හවස ප්‍රනීත ආහාර තම ඇතින්ම උයා දරුවන් වෙත පිළිගැන්වීම සැමගේ පැසසුමට ලක්විය.

**(ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා)**

**ස්වර්ගස්ථ වී වදාල දේව සේවක අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් පිළිබඳව ලියැවුණු ඓතිහාසික පොත පත, පරිහණය කළ දෑ, දුර්ලභ ඡායාරූප ඔබ සතුව ඇත්නම් කරුණාකර ඥානාර්ථ ප්‍රදීපය කතෘ පියතුමාට ලබා දෙනමෙන් කාරුණිකව ඉල්ලා සිටී.**